KALUBOWITIYANA TEA

වාර්ෂික වාර්තාව
2024-25



කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය



රු. බිලියන 1.67

ශුද්ධ විකුණුම් (2024-25)

84

කොළඹ තේ වෙන්දේසියේ
ඉහළම මිල ගණන්

මෙට්‍රික් ටොන් 1,294

වාර්ෂික නිෂ්පාදනය

රු. (1.79)

කොටසක් සඳහා ඉපැයුම් (2024-25)

සාර්ථකත්වය අත් විඳීමු

අපගේ සංදර්භය තුළ සාර්ථකත්වය අත්විඳීමට සිය මූල්‍ය ඉතිහාසයේ ඉහළම ලාභය අත්කර ගැනීමට අවධානය යොමු කරමින් අපගේ තේ නිෂ්පාදන කර්මාන්ත ශාලා ඉතා සුපරීක්ෂාකාරීව ඇගයීම අයත් වේ. මෙම කාර්ය සාධනය කාර්යක්ෂම නිෂ්පාදන ක්‍රියාවලි පමණක් නොව වෙළඳපොළ ස්ථානීකරණය, ගුණාත්මකභාවයේ විශිෂ්ඨත්වය සහ නිපුණ කළමනාකරණය පිළිබිඹු කරයි.

මෙම ජයග්‍රහණය තීව්‍ර කරනුයේ දශක තුනක අපගේ කැපවීම, වර්ධනය සහ ඔරොත්තු දීමේ හැකියාව කැටි කොට දක්වන සුවිශේෂී සන්ධිස්ථානයක් වන අප කර්මාන්ත ශාලාවේ 32 වැනි සංවත්සරයයි. නිෂ්පාදනයේ අපගේ ගමන් මග නව්‍යකරණය, ගුණාත්මකබව වෙත කැපවීම සහ වෙනස් වන පාරිභෝගික තේරීම් කෙරෙහි ප්‍රතිචාර දැක්වීම මගින් සනිටුහන් කර තිබේ.

මෙම 32 වැනි සංවත්සරය සමරද්දී අපි අපගේ අතීත ජයග්‍රහණ සිහිපත් කරනවා පමණක් නොව ගතික තේ නිෂ්පාදන ලෝකය තුළ නව ප්‍රගමන සහ අවස්ථා ග්‍රහණය කර ගනිමින් අනාගත ප්‍රයත්න සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරන්නෙමු. මෙම සංවත්සරය විශිෂ්ඨත්වය කෙරෙහි අපගේ චිරස්ථායී කැපවීම පිළිබඳ තහවුරුවක් හා අපගේ සාර්ථකත්වයේ අනිවාර්ය කොටස්කරුවන් වූ අප කණ්ඩායම, රජය සහ පාරිභෝගිකයන් වෙත කෘතවේදීත්වය පළ කිරීමේ අවස්ථාවක් වේ.



මෙම වාර්ෂික වාර්තාව අපගේ වෙබ් අඩවියෙන් ද ලබා ගත හැක:
www.kalubowitiyanatea.lk

පටුන

පූර්විකාව

04 විශේෂ මූල්‍ය සිදුවීම්
05 මූල්‍ය නොවන විශේෂ සිදුවීම්
06 වාර්තාව පිළිබඳව
07 දැක්ම හා මෙහෙවර
08 ආයතනික පැතිකඩ
09 අප පිළිබඳව
10 සභාපතිගේ සමාලෝචනය
12 අධ්‍යක්ෂ මණ්ඩලය
14 ආයතනික කළමනාකාරිත්වය
15 අපගේ නිෂ්පාදන
18 සංවිධාන ව්‍යුහය
20 අපගේ ගමන් මග

කළමනාකරණ සාකච්ඡාව හා විශ්ලේෂණය

24 අගය නිර්මාණය කිරීමේ ආකෘතිය
25 මූල්‍ය සමාලෝචනය හා විශ්ලේෂණය
26 පාර්ශවකාර සබඳතාවය
27 අවදානම් කළමනාකරණය
28 මෙහෙයුම් තොරතුරු
30 කර්මාන්ත ශාලා අනුව ලාභය/(අලාභය)
31 මාසික තේ නිෂ්පාදනය
32 වාර්ෂික තේ නිෂ්පාදනය
33 මාසික අමු තේ දළු ලබා ගැනීම්
34 වාර්ෂික අමු තේ දළු ලබා ගැනීම්
35 සංසන්දනාත්මක තොරතුරු - නිෂ්පාදනය
37 විකුණුම් සාමාන්‍යය උන්නතාංශය සමග සැසඳීම
39 ඉහළම මිල ගණන් -2024-25 වර්ෂය
41 ආයතනික සමාජ වගකීම් ක්‍රියාකාරකම්
42 සම්මාන හා පිළිගැනුම
44 අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව
46 විගණන කමිටු වාර්තාව



මූල්‍ය වාර්තා

48 ස්වාධීන විගණකගේ වාර්තාව

52 ලාභ/(අලාභ) සහ අනෙකුත් විස්තීරණ ආදායම පිළිබඳ ප්‍රකාශනය

53 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

54 ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය

55 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

56 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

74 පූර්ව වසර දහය තුළ විශේෂ මූල්‍ය සිදුවීම්

විශේෂ මූල්‍ය සිදුවීම්


වගුව – 01

මාර්තු 31වන් අවසන් වසර සඳහා	2024/25 (රු.)	2023/24 (රු.)
ශුද්ධ විකුණුම්	1,678,201,858.39	1,802,165,017
විකුණුම් පිරිවැය	(1,666,615,835.04)	(1,747,661,088)
දළ ලාභය	**11,586,023.35**	**54,503,929**
අනෙකුත් මෙහෙයුම් ආදායම	32,619,154.02	49,849,950
මෙහෙයුම් වියදම්වලට පෙර ලාභය/(අලාභය)	**44,205,177.37**	**104,353,880**
පරිපාලන වියදම්	(76,320,780.30)	(63,425,441)
විකුණුම් හා බෙදාහැරීම් වියදම්	(795,349.14)	(4,031,339)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලාභය	**(32,910,952.07)**	**36,897,100**
මූල්‍ය ආදායම	25,740,078.91	32,494,112
මූල්‍ය වියදම්	-	-
ශුද්ධ මූල්‍ය ආදායම	**25,740,078.91**	**32,494,112**
බදුකරණයට පෙර ශුද්ධ ලාභය/(අලාභය)	**(7,170,873.16)**	**69,391,212**
බදුකරණය	(1,136,447.32)	(13,816,705)
බදුකරණයට පසු ශුද්ධ ලාභය	**(8,307,320.48)**	**55,574,507**
කොටසක් සඳහා ඉපැයුම්	(1.79)	11.98

ප්‍රස්තාරය – 01

ශුද්ධ විකුණුම්


(රු.මි.)



ප්‍රස්තාරය – 02

මෙහෙයුම් වියදම්වලට පෙර ලාභය/(අලාභය)


(රු.මි.)



ප්‍රස්තාරය – 03

බදුකරණයට පෙර ශුද්ධ ලාභය/ (අලාභය)


(රු.මි.)



ප්‍රස්තාරය – 04

බදුකරණයට පසු ශුද්ධ ලාභය


(රු.)



මූල්‍ය නොවන විශේෂ සිදුවීම්

ප්‍රස්තාරය – 05

අමු දළු සැපයුම්කරුවෝ




එකතුව

සැපයුම්කරුවන් 3,134

ප්‍රස්තාරය – 06

අමු දළු ලබා ගැනීම්




එකතුව

කි.ග්‍රෑ. 6,310,569

ප්‍රස්තාරය – 07

තේ නිෂ්පාදනය




එකතුව

කි.ග්‍රෑ. 1,293,723

වගුව – 02

කර්මාන්ත ශාලාව	අමු දළු සැපයුම්කරුවෝ (සංඛ්‍යාව)	අමු දළු ලබා ගැනීම් (කි.ග්‍රෑ.)	තේ නිෂ්පාදනය (කි.ග්‍රෑ.)
– කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලාව	2,376	4,321,308	911,204
– දැරංගල තේ කර්මාන්ත ශාලාව	538	897,628	158,931
– හිනිදුම තේ කර්මාන්ත ශාලාව	123	634,454	128,833
– මැණික්දිවෙල තේ කර්මාන්ත ශාලාව	97	457,179	94,755

2024/25 දී ශ්‍රී ලංකාවේ තේ ආනයනකරුවෝ



වාර්තාව පිළිබඳව

කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලාව පිළිබඳව

රට ප්‍රත්‍යාස්ථිතික ප්‍රතිසාධනයක් කරා මෙහෙයවීමේදී තම කාර්යභාරය ඉටු කිරීමට කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගම අපේක්ෂා කරයි. 2025 මාර්තු 31න් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා අපගේ 2024/2025 වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරනුයේ ඉමහත් සතුටිනි. අපගේ පාර්ශවකරුවන් සඳහා වටිනාකමක් නිර්මාණය කිරීම පිණිස අපගේ මෙහෙයුම් පරිසර සංදර්භය තුළ උපාය මාර්ග මෙහෙයවනු ලැබූයේ කෙසේද යන්න පිළිබඳ සාධාරණ විස්තරයක් සපයන අතරම සමාගමේ මූල්‍ය, සමාජීය, පාරිසරික සහ පාලන කාර්යසාධනය සම්බන්ධයෙන් සංක්ෂිප්ත, සාකල්‍යය සහ සමබර සමාලෝචනයක් ඉදිරිපත් කිරීමට මෙම වාර්තාව අරමුණ කරයි.

විෂය පථය සහ සීමාව

මෙම වාර්ෂික වාර්තාව කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගමේ මෙහෙයුම් ආවරණය කරයි. සමාගම වාර්ෂික වාර්තාකරණ චක්‍රය යොදා ගන්නා අතර මෙම වාර්තාව 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා ප්‍රකාශයට පත් කරන ලද පෙර වාර්තාවේ දිගුවකි. 2007 අංක 07 දරන සමාගම් පනත, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ සහ මාර්ගෝපදේශ මගින් නියම කර ඇති පරිදි මූල්‍ය ගිණුම්කරණ පද්ධති සහ කළමණාකරණ තොරතුරු පද්ධතිවලින් ලබා ගත් මූල්‍ය සහ මූල්‍ය නොවන දෙයාකාර තොරතුරු මෙමගින් සපයා ඇත. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ ස්වාධීන මතයක් ප්‍රකාශ කරනු පිණිස ශ්‍රී ලංකා ජාතික විගණන කාර්යාලය විසින් මූල්‍ය ප්‍රකාශන විගණනය කර ඇත.

වාර්තාකරණ රාමුව

ශ්‍රී ලංකා රජයේ අවශ්‍යතා සමගින් ගෝලීයව පිළිගත් පහත දැක්වෙන වාර්තාකරණ රාමු අනුව අප කටයුතු කරන අතර මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරනු ලැබූ ආයතනික වාර්තාකරණ මාර්ගෝපදේශයන්හි යහපත් පරිචයන් සමග අප වාර්තාකරණය සම්බන්ධීකරණය කිරීමට අප කැපව සිටින්නෙමු.

වගුව – 03

වාර්තාකරණ රාමු, ප්‍රමිති සහ මාර්ගෝපදේශ	අභ්‍යන්තර සහතිකකරණය	බාහිර සහතිකකරණය
මූල්‍ය වාර්තාකරණය		
ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති/ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති/ 2007 අංක 7 දරන සමාගම් පනත	කළමනාකාරිත්වය විසින් ස්ථාපිත කරන ලද හා විගණන කමිටුව සහ අභ්‍යන්තර විගණනය විසින් ඇගයීමට ලක් කළ අභ්‍යන්තර පාලන	ජාතික විගණන කාර්යාලය
ආඛ්‍යාන වාර්තාකරණය		
රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ වාර්ෂික වාර්තා සම්පාදනය කිරීමේ මාර්ගෝපදේශ	කළමනාකාරිත්වය විසින් සමාලෝචනය කරන ලදුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඇගයීමට ලක් කරන ලදී	ජාතික විගණන කාර්යාලය
ආයතනික පාලනය		
ආයතනික පාලනය පිළිබඳ යහපත් පිළිවෙත් සංග්‍රහය රජයට අයත් ව්‍යාපාර සඳහා ආයතනික පාලනය පිළිබඳ ශ්‍රී ලංකා මාර්ගෝපදේශ	කළමනාකාරිත්වය විසින් සමාලෝචනය කරන ලදුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඇගයීමට ලක් කරන ලදී	ජාතික විගණන කාර්යාලය

වාර්තාකරණ වැඩි දියුණු කිරීම්

- නිරසර වාර්තාකරණය, අධ්‍යක්ෂ මණ්ඩල පැතිකඩ සහ අවදානම් කළමනාකරණ පිළිවෙත් අන්තර්ගත කිරීම.
- පරිණාමන උපායමාර්ග සහ පාර්ශවකාර සබඳතා පිළිබඳ වැඩි අවධානය.

ආයතනික වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල වගකීම

මෙම වාර්තාවේ නිරවද්‍යතාව ආරක්ෂා කිරීම වන තම බැඳීම අධ්‍යක්ෂ මණ්ඩලය පිළි ගනියි. 2024/25 වාර්තාව සමාගමේ ඒකාබද්ධ කාර්යසාධනය නිවැරදිව පෙන්නුම් කරන බවත් අදාළ සියලු ප්‍රමාණාත්මක කරුණු ආවරණය කරන බවත් අප මෙයින් සහතික කරන්නෙමු. එසේම ශ්‍රී ලංකාවේ මහා භාණ්ඩාගාරය විසින් දෙනු ලැබූ උපදෙස් ප්‍රකාරව වාර්තාව සකස් කරනු ලැබූ බව අප තවදුරටත් සහතික කරන්නෙමු.

ප්‍රතිපෝෂණය

ඔබගේ අදහස් හා මතවාද අප සැබවින්ම අගය කරන අතර අපගේ වාර්ෂික වාර්තාවේ ප්‍රමිතිය සහ පඨනීයතාව අඛණ්ඩව ඉහළ නංවාලීමට අපි කැපව සිටින්නෙමු.

යම් අදහස් දැක්වීමක් වේ නම් කරුණාකර පහත ලිපිනයට යොමු කරන්න.

සභාපති,
කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගම,
අංක 53, රත්නායක පාර,
පැලවත්ත, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව

දැක්ම හා මෙහෙවර

දැක්ම

හොඳම ශ්‍රී ලාංකික සීටීසි හා සම්ප්‍රදායික තේ නිපදවීමේ හා අලෙවි කිරීමේ වඩාත්ම පිළිගත් ආදර්ශය බවට පත්වීම.

මෙහෙවර

දේශීය හා විදේශීය වෙළඳපොළ ඉලක්ක කර ගනිමින් වඩා ඉහළ ගුණාත්මකබවින් යුත් රසවත් හා පාරිභෝගික හිතකාමී ශ්‍රී ලාංකේය තේ නිෂ්පාදනය කිරීම.

ආයතනික පැතිකඩ

කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලාව 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත සහ 2007 අංක 07 දරන නව සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කරන ලද සීමිත බැඳීම් සමාගමකි. සමාගම ස්ථාපිත කරනු ලැබුයේ සීටීසී තේ නිපදවීම සඳහා වන අතර කොටසක් රු. 10 ක් ලෙස තක්සේරු කරනු ලැබූ මිලියන 50 ක ආරම්භක ප්‍රාග්ධනයකින් 1994 අගෝස්තු 1 වන දින වාණිජ මෙහෙයුම් ආරම්භ කරනු ලැබීය. ඉන්දීය ණය ආධාර යටතේ අපගේ දෙවන කර්මාන්ත ශාලාව වූ දෑරංගල තේ කර්මාන්ත ශාලාව ද ස්ථාපිත කරන ලද අතර 2000 මාර්තු මාසයේදී මෙහෙයුම් ආරම්භ කරන ලදී. කළින් තේ ශක්ති අරමුදල යටතේ පැවැති අපගේ තෙවන කර්මාන්ත ශාලාව වන හිනිදුම හිල්ස් තේ කර්මාන්ත ශාලාව ලාභ බෙදා හදා ගැනීමේ ගිවිසුමක් යටතේ කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගමට පවරන ලදී. තමන්ගේම අරමුදල් යොදා ගනිමින් සමාගම මෙම කර්මාන්ත ශාලාව නැවත ස්ථාපිත කරන ලද අතර හිනිදුම හිල්ස් තේ කර්මාන්ත ශාලාව 2012 වසරේ සිට මෙහෙයුම් ආරම්භ කරන ලදී.

සමාගමට අළුතින්ම එකතු වූ මැණික්දිවෙල තේ කර්මාන්ත ශාලාව කළින් තේ ශක්ති පදනමට හිමිව තිබූ අතර එය මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර ඡන්ද කොට්ඨාශයේ මැණික්දිවෙල ගම්මානයේ පිහිටා තිබේ. මෙම කර්මාන්ත ශාලාව නැවත ස්ථාපිත කිරීම සඳහා ද සමාගම තමන්ගේම අරමුදල් භාවිතා කරන ලදී.

කුඩා තේ වතු හිමියන්ගෙන් මිලදී ගන්නා තෝරා ගත් අමු දළු යොදා ගනිමින් සමාගම ආසන්න වශයෙන් තේ කිලෝග්‍රෑම් මිලියන 1.5 ක් පමණ නිපදවයි.

කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලාව කැපීම, ඉරීම සහ රැළි ගැස්වීම යන ක්‍රියාවලිය භාවිතා කරමින් සී.ටී.සී. තේ වර්ග නිපදවන අතර දෑරංගල, හිනිදුම සහ මැණික්දිවෙල කර්මාන්ත ශාලා සම්මත සම්ප්‍රදායික ක්‍රියාවලිය යොදා ගනිමින් පත්‍රීය සහ කුඩා ශ්‍රේණි තේ වර්ග පෙළක් නිපදවයි.

කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගම ISO 22000:2018 සහතිකකරණය ලත් කර්මාන්ත ශාලා හතරක හිමිකාරිත්වය දරමින් මෙහෙයුම් කටයුතු සිදු කරන අතර ඒවා මගින් ගෝලීය වෙළඳපොළ සඳහා උසස්ම තත්ත්වයේ නැවුම් ලංකා තේ නිපදවයි. ලෝක මට්ටමේ තේ නිෂ්පාදකයකු වීම සඳහා වන සිය කැපවීම වෙර ගන්වමින් එය දිවයිනේ ප්‍රමුඛතම සීටීසී තේ නිෂ්පාදකයා ලෙස කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගමේ සුදුසුකම්වලට සැලකිය යුතු වටිනාකමක් එකතු කරයි.

සමාගමේ තේ නිපැයුමෙන් 90% ක් පමණ තැරැව්කාර සමාගම් හරහා කොළඹ තේ වෙන්දේසිය වෙත යොමු කරන අතර සුළු ප්‍රමාණයක් දීපව්‍යාප්තව පිහිටා ඇති අලෙවි මධ්‍යස්ථාන, කර්මාන්ත ශාලා සහ ප්‍රධාන කාර්යාලය හරහා දේශීය වෙළඳපොළට නිකුත් කරයි.

සාංගමික ව්‍යවස්ථාවලිය ප්‍රකාරව සමාගමේ විධිනියෝගය පහත දැක්වෙන පරිදි වේ.

- වගාකරුවන්ගෙන් මිලදී ගත් තේ දළු පිරියම් කිරීම, පිරිසැකසුම් කිරීම සහ නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරය සිදු කිරීම.
- තේ සිටුවීම, වගා කිරීම සහ තේ වතු කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම.



අප පිළිබඳව

අපගේ තේ කර්මාන්ත ශාලා දිවයිනේ පහතරට බස්නාහිර මධ්‍යම කලාපවල පිහිටා ඇති අතර ජාතික තේ නිෂ්පාදනයට 0.63% ක දායකත්වයක් ලබා දෙමින් ඉහළම ගුණාත්මකබවින් යුතු තේ කිලෝග්‍රෑම් මිලියන 1.5 ක් නිපදවයි.

වර්ෂය තුළදී ඉහළම මිල ශ්‍රේණිගත කිරීම් 84 ක් සාධනය කර ගනිමින් අප කර්මාන්ත ශාලා ඉහළම ගුණාත්මකබවින් යුතු තේ නිපදවීය. අනෙකුත් තරඟකාරී තේ නිෂ්පාදන කර්මාන්ත ශාලා අතුරින් අනගිතම ගුණාත්මකබවක් සහිත සිටිසි තේ මිල ඇලකිමේදී අපි එම කර්මාන්තයේ ප්‍රමුඛයා වන්නෙමු. වසර 30කට වැඩි කාලයක් කොළඹ තේ වෙන්දේසියේ පහතරට උන්නතාංශ සඳහා ප්‍රමුඛතම ස්ථානය අප හොබවා ඇත්තෙමු. අප කර්මාන්ත ශාලාවල සේවකයන් 3,500 ක් පමණ සේවය කරන අතර වඩාත්ම ආකර්ෂණීය මිල ගණන්වලට අමු දළු මිලදී ගැනීම මගින් අප 15,000 කට වැඩි පිරිසකගේ සාමාජීය හා ආර්ථික ප්‍රගතිය සඳහා උපකාර කර ඇත්තෙමු.



දළු නෙළීම

එක් එක් ක්ෂෙත්‍රයෙන් දින 5 සිට 8 දක්වා කාල පරාසයකින් යුතුව නිතිපතා පදනමකින් අමු දළු නෙලා ගනු ලැබේ.



මැලවීම

එම දළු කර්මාන්ත ශාලාවට ලැබුණු විගස, ඒවායේ බර කිරා දොරු මත අතුරනු ලැබේ.



වියළීම

වියළීමේ මූලික අරමුණ වන්නේ තෙතමනය නිස්සාරණය සහ පැසීම වැළැක්වීමයි. පැසුණු දළුවල 45% සිට 50% දක්වා තෙතමනයක් අඩංගු වේ.



ඇකිළීම

මෙය කොළ ඇඹරීමේ සහ දළුවල සෛල බිත්ති පිපිරීමට සලස්වා දළුවේ ඇති යුෂ පත්‍රය මතුපිටට ගෙන ඒමේ ක්‍රියාවලියයි.



පැසවීම


තේ යුෂ පැසවීම කළු තේ නිෂ්පාදනයේ අත්‍යාවශ්‍ය ක්‍රියාවලියකි.



වර්ග කිරීම (හැළීම)

සිසිල් කිරීමෙන් පසුව, දාහක තේ වෙළඳ පොළ ඉල්ලුම පරිදි ප්‍රමාණය සහ හැඩය අනුව වර්ග කරනු/හලනු ලැබේ.

සභාපතිතුමාගේ සමාලෝචනය



"නිසල මුහුදු කිසි විටෙකත් දක්ෂ නැවියෙකු බිහි නොකළේය."

- ෆ්‍රෑන්ක්ලින් ඩී රූස්වෙල්ට් -

හිතවත් පාර්ශවකරුවනි,

කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලාවේ සභාපතිවරයා ලෙස මා ඔබ අමතන්නේ වගකීම, නිර අදිටන සහ අඛණ්ඩ කැපවීම පිළිබඳ දැඩි හැඟීමකිනි. 2024 දෙසැම්බර් මාසයේ මෙම භූමිකාව බාර ගැනීමෙන් අනතුරුව, ප්‍රතික්ෂේප කළ නොහැකි අන්දමින් අභියෝගාත්මක එහෙත් සමාගමේ අනාගත ගමන් මග යළි හැඩගැස්වීමේදී තීරණාත්මක කාල පරිච්ඡේදයක් වූ 2024/25 මූල්‍ය වර්ෂය සම්බන්ධයෙන් ප්‍රත්‍යාවලෝකන සමාලෝචනයක් ඉදිරිපත් කිරීම යුතුකමක් මෙන්ම වරප්‍රසාදයක් සේ මම සලකමි.

සමාලෝචිත මූල්‍ය වර්ෂයේ බහුතර කාලයක් සඳහා මම ආයතනයේ නායකත්වය නොදැරුයේ වුව ද, එහි කාර්යසාධනය, සංවර්ධනය සහ විකසනය වෙමින් පැවැති තත්ත්වයන් පිළිබඳව මා සමීප අධීක්ෂණයක් පවත්වා ගතිමි. මෙම කාලසීමාව තුළ, සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගම පැවතියේ බරපතල පරිහානි තත්ත්වයක ය. කාලයක් මුළුල්ලෙහි මෙහෙයුම් අකාර්යක්ෂමතා ගොඩ ගැසී පැවති අතර, මූල්‍ය අලාභ ඉහළ යමින් ආයතනය ව්‍යුහාත්මක සහ පරිපාලනය ආශ්‍රිත අභියෝගයන්ට මුහුණ දුන් අතර එමගින් සමස්ත කාර්යසාධනය සැලකිය යුතු ලෙස දුර්වල කොට තිබුණි. කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සහ උපායමාර්ගික දිශානතියේ තීරණාත්මක විස්ථාපනයකින් තොරව සමාගම තවදුරටත් පිරිහීමේ සහ දිගු කාලීන අස්ථාවරත්වයේ අවදානම දරා සිටින බව වඩ වඩාත් පැහැදිළි විය.

තත්ත්වයේ බරපතලකම සහ ක්ෂණිකව ක්‍රියාත්මක වීමේ අවශ්‍යතාව හඳුනා ගනිමින් 2024 දෙසැම්බර් මස සිට නව ගමන් මගක ඇරඹුම සනිටුහන් කරන ලදී. මෙය සමාගමේ හැරවුම් ලක්ෂ්‍යයක් සලකුණු කළේය. මෙම නවීකෘත ප්‍රවේශයේ මුඛ්‍ය අරමුණ වූයේ මෙහෙයුම් ස්ථාවර කිරීම, මෙහෙයුම් ශික්ෂණය ප්‍රකෘතිමත් කිරීම, දිගු කාලයක් මුළුල්ලෙහි පවතින අකාර්යක්ෂමතා ආමන්ත්‍රණය කිරීම සහ ධනාත්මක තිරසාර හා ව්‍යුහාත්මක වෙනසකට පදනම ස්ථාපිත කිරීම යි. මෙම ප්‍රයත්න සඳහා ශක්තිමත් නායකත්වයක්, පැහැදිළි වගවීමක් සහ ආයතනයේ සහ එහි පාර්ශවකරුවන්ගේ උපරිම ප්‍රතිලාභය වෙනුවෙන් දුෂ්කර එහෙත් අවශ්‍ය තීරණ ගැනීමට කැමැත්තක් අවශ්‍ය කරනු ලබයි.

මගේ පත්වීම සිදු කළ අවස්ථාවෙහි, සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගම සැලකිය යුතු මෙහෙයුම් හා මූල්‍ය අස්ථිරතාවන්ට මුහුණ දෙමින් සිටියේය. නිෂ්පාදන ධාරිතාව, ශ්‍රම බලකා ස්ථාවරත්වය සහ ආදායම් උත්පාදනය මත අසීමිත පීඩනයක් ඇති කරමින් සමාගමේ කර්මාන්ත ශාලා හතර අතුරින්, තුනක් වසා දැමීමට ආසන්න තත්ත්වයේ පැවැතියේ ය. ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍ර අතර පිරිහෙමින් පැවැති චිත්ත ධෛර්යය සහ අන්‍යොන්‍ය විශ්වාසය බිඳුණු සබඳතා සම්බන්ධයෙන් කටයුතු කිරීමට ද ආයතනයට සිදු විය. කෙසේ වෙතත්, නව කළමනාකාරිත්ව කණ්ඩායමක් පත්කිරීම හා මෙහෙයුම් ප්‍රතිසාධනය කෙරෙහි වූ ශක්තිමත් අවධානය සමගින්, මෙම පිරිහීමේ ගමන් මග ආපසු හැරවීමේ ඒකාබද්ධ ප්‍රයත්නයක අප නිරත වූයෙමු.

අවල නායකත්වය, සමීප අධීක්ෂණය සහ සියලු මෙහෙයුම් ඒකක සමග සහයෝගයෙන් කටයුතු කිරීම තුළින් අර්ථාන්විත ප්‍රගතියක් අත් කර ගැනීමට හැකි විය. කළමනාකරණ කණ්ඩායමේ සහ ශ්‍රම බලකායේ කැපවීම, නොපසුබස්නා ධෛර්ය හා සාමූහික ප්‍රයත්නය පිළිබිඹු කරන සංධිස්ථානයක් සනිටුහන් කරමින් කර්මාන්ත ශාලා හතරම අද වන විට පූර්ණව ක්‍රියාත්මක වන බව මම වාර්තා කරනුයේ ඉමහත් සතුටිනි. වඩාත් වැදගත් වනුයේ, මූල්‍ය සහ මෙහෙයුම් යහපත් භාවයේ ක්‍රමික හා ස්ථිර ප්‍රතිසාධනය සලකුණු කරමින් මෙම කර්මාන්ත ශාලා මේ වන විට ලාභදායිත්වය කරා ගමන් කරමින් තිබීමයි.

මෙම පරිවර්තනය සැලකිය යුතු අභියෝගවලින් තොර වූවක් නොවීය. මූල්‍ය සංරෝධක, ද්‍රවශීලතා පීඩන, කාර්ය සම්පාදන අකාර්යක්ෂමතා, නියාමන සංකීර්ණතා සහ අතීතයෙන් උරුම වූ නෛතික ගැටලු ඇතුළුව යළි ප්‍රකෘතිමත් තත්ත්වයට පත්වීමේ ක්‍රියාවලිය තුළ බොහෝ බාධකයන්ට සමාගම මුහුණ දුණි. එවන් එක් අභියෝගයක් වූයේ රුපියල් මිලියන 13.8 ක මූල්‍ය බලපෑමක් ඇති කරමින් සමාගමට එරෙහිව කම්කරු විනිශ්චය සභාවේ තීන්දුව යි. මෙම බැරකම සමාලෝචිත වර්ෂයේ ලාභ හා අලාභ ප්‍රකාශනයේ යථා පරිදි හඳුනාගෙන පූර්ණව හේතු දක්වා ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, මූල්‍ය වර්ෂය සඳහා සමාගම රු. මිලියන 10.52 ක ශුද්ධ අලාභයක් වාර්තා කිරීමට එය දායක විය.

මෙම සැලකිය යුතු වැය බර පැවතියේ වුව ද, සමස්ත අලාභ අඩු කර ගැනීමෙහි ලා අත් කර ගත් ප්‍රමාණවත් ප්‍රගතිය අවධානයට ලක් කිරීම වැදගත් වේ. අපගේ ධූර කාලය ආරම්භයේදී, සමාගමේ බදුවලට පෙර අලාභය රු. මිලියන 42.00 ක් විය. විනයගත පිරිවැය කළමනාකරණය, මෙහෙයුම් ප්‍රතිව්‍යුහගත කිරීම, වැඩි දියුණු කළ පාලන ක්‍රමවේද සහ ඉලක්කගත උපායමාර්ගික මැදිහත්වීම් තුළින් මෙම අලාභය සැලකිය යුතු ලෙස අඩු කර ගන්නා ලදී. අභියෝග තවදුරටත් පැවතිය ද, මෙමම සංක්‍රාන්ති කාල සීමාව තුළ ක්‍රියාවට නැංවූ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගවල සඵලතාව මෙම අඩුවීම මගින් නිරූපණය කරයි.

කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගමේ මෙහෙයුම්වල කේන්ද්‍රීය සාධකයක් වනුයේ අපගේ සීටීසී තේ කර්මාන්ත ශාලාවයි. වර්ෂය තුළදී, නිෂ්පාදන ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමට, නිෂ්පාදන ප්‍රමිති අභිවර්ධනය කිරීමට හා අභ්‍යන්තර ක්‍රියාදාම ශක්තිමත් කිරීමට අඛණ්ඩව යත්න දරන ලදී. ඒ හා සමගාමීව, අතිශය තරඟකාරී තේ කර්මාන්තය තුළ සන්නාම දෘශ්‍යභාවය වැඩි දියුණු කිරීම හා සමාගමේ ස්ථානය වෙර ගැන්වීම අවධාරණය කරන ලදී. 2024/25 මූල්‍ය වර්ෂය සඳහා සමාගම රු.මිලියන 186.78 ක ආදායමක් වාර්තා කරන ලදී. මෙම කාර්යසාධනය අපගේ ප්‍රධාන මෙහෙයුම්වල ප්‍රත්‍යාස්ථිතිය අවධාරණය කරන්නේ වුව ද සංගත ලාභදායිතාවයක් හා දිගු කාලීන මූල්‍ය ස්ථාවරත්වයක් සපුරා ගැනීම පිණිස තවදුරටත් වැඩි දියුණුවීම් අවශ්‍ය බව අපි පිළිගන්නෙමු.

මූල්‍ය ප්‍රතිලාභවලින් ඔබ්බට ගොස්, විශේෂයෙන්ම වටිනා විදේශ විනිමය ඉපයුම් හරහා ජාතික ආර්ථිකයට දායකත්වය ලබා දීමේ අර්ථාන්විත කාර්යභාරයක් කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගම ඉටු කර ඇත. මෙම කාල සීමාව තුළ ශ්‍රී ලංකාව මුහුණ දුන් පුළුල් ආර්ථික අභියෝග සැලකිල්ලට ගැනීමේදී මෙම දායකත්වය විශේෂයෙන්ම වැදගත් වේ.

අපගේ මෙහෙයුම් අපනයන ඉපැයීම්වලට සහාය වනවා පමණක් නොව රැකී රක්ෂා සපයා ප්‍රාදේශීය ආර්ථික ක්‍රියාකාරකම් තිරසර කර ඉහළ ගුණාත්මකබවින් යුතු තේ සඳහා ජාත්‍යන්තර වෙළඳපොළේ පවතින කීර්තිනාමය ශක්තිමත් කරයි. මෙම දායකත්ව සුවිශේෂී වැදගත්කමක් සහිත ජාතික කර්මාන්තයක් තුළ ආයතනික අස්තිත්වයක් ලෙස අපගේ පුළුල් වගකීම පිළිබිඹු කරයි.

සමාලෝචිත වර්ෂය ආවර්ජනය කිරීමේදී, මෙම අසීරු තත්ත්වය ඉගෙනුම හා වැඩි දියුණුව සඳහා ශක්තිමත් උත්ප්‍රේරකයක් බවට පත්ව ඇති බව ප්‍රත්‍යක්ෂ වේ. සමාගම මුහුණ පෑ අභියෝග ශක්තිමත් පාලනයේ, විචක්ෂණ මූල්‍ය කළමනාකරණයේ, මෙහෙයුම් පාරදෘශ්‍යභාවයේ සහ උපායමාර්ගික දුර දක්නා නුවණෙහි වැදගත්කම වෙර ගන්වයි. මුහුණ දුන් එක් එක් බාධකය වටිනා පාඩම් උගන්වා ඇති අතර එමගින් තීරණ ගැනීම, අවදානම් කළමනාකරණය හා දිගු කාලීන සැලසුම්කරණය කෙරෙහි අපගේ ප්‍රවේශය හැඩ ගැස්වීම නොකඩවා සිදු කරයි.

2025/26 මූල්‍ය වර්ෂයේ ඉදිරි කටයුතු දෙස බැලීමේදී, අප එසේ කරනුයේ අලුත් විශ්වාසයකින් සහ අරමුණ පිළිබඳ පැහැදිළිබවින් යුතුවය. අපගේ උපායමාර්ගික ප්‍රමුඛතාවන්ට දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ මාර්ග ව්‍යාප්ත කිරීම, ප්‍රවර්ධනාත්මක හා සන්නාමකරණ මූලාරම්භයන් අභිවර්ධනය කිරීම හා සියලු කර්මාන්තශාලාවල මෙහෙයුම් කාර්යක්ෂමතා ශක්තිමත් කිරීම ඇතුළත් වේ. මෙම ප්‍රතිසාධන අදියර තුළ ස්ථාපිත කරනු ලැබූ පදනම මත තවදුරටත් ගොඩ නැගීමට හා තිරසර වර්ධනය හා වැඩි දියුණු කළ මූල්‍ය කාර්යසාධනය සඳහා කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලාව ස්ථානගත කිරීමට අපි කැපව සිටින්නෙමු.

ගුණාත්මකබව, සුපිළිපන්බව හා විශ්වසනීයතාව පිළිබඳ සමාගමේ උරුමය සංරක්ෂණය කරන අතරම පාර්ශවකරුවන්ට දිගු කාලීන වටිනාකමක් සැපයීම ද ඒ හා සමානව වැදගත් වේ. පාර්ශවකාර සබඳතා ශක්තිමත් කිරීම, වගවීමේ හා කාර්යසාධන විශිෂ්ඨත්වයේ සංස්කෘතියක් සුපෝෂණය කිරීම සහ අනාගත අභියෝග හා අවස්ථා සම්බන්ධයෙන් කටයුතු කිරීම පිණිස ආයතනය මැනවින් ස්ථානගතව ඇති බව සහතික කිරීම වෙනුවෙන් අප අඛණ්ඩව අවධානය යොමු කරන්නෙමු.

අවසාන වශයෙන් මෙම අභියෝගාත්මක එහෙත් පරිවර්තනීය කාල සීමාව මුළුල්ලෙහි අපගේ කොටස් හිමියන්, සේවකයන්, සැපයුම්කරුවන්, පාරිභෝගිකයන් සහ අනෙකුත් පාර්ශවකරුවන් හට ඔවුන්ගේ අඛණ්ඩ විශ්වාසය, ඉවසීම සහ නොසැලෙන සහයෝගය වෙනුවෙන් මාගේ අවංක ඇගයුම පළ කරන්නෙමු. මේ දක්වා අත්කර ගෙන ඇති ප්‍රගතිය සබල කිරීමේදී ඔබ අප කෙරෙහි තැබූ විශ්වාසය තීරණාත්මක විය. පොදුවේ බෙදා හදා ගත් අදිටන සහ පැහැදිළි උපායමාර්ගික දැක්ම සමගින්. කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගම සඳහා නව හා අපේක්ෂා සහගත පරිච්ඡේදයක් කරා අප එක්ව ගමන් කරන්නෙමු.



ආමින්ද සමරසිංහ
සභාපති

අධ්‍යක්ෂ මණ්ඩලය

2025 දෙසැම්බර් 31 දිනට



එස්. එස්. සමරසිංහ මහතා – සභාපති – 2024 දෙසැම්බර් 19 දින සිට

සමරසිංහ මහතා ලන්ඩනයේ මෙට්රොපොලිටන් විශ්වවිද්‍යාලයෙන් කුසලතා උපාධියක් සහිතව ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත. එත්මනෙහි ඔහු එක්සත් රාජධානියේ ග්‍රීන්විච් විශ්වවිද්‍යාලයෙහි නීති උපාධිය හදාරමින් සිටී.

තේ කර්මාන්තය පිළිබඳ හසල දැනුමක් හා අත්දැකීම් සහිත සමරසිංහ මහතා තේ නිෂ්පාදනය සහ කර්මාන්ත ශාලා පරිචයන් පිළිබඳ ජාතික වැවිළි කළමනාකරණ ආයතනයේ සහතික ලාභියෙකි.

ඔහු කොළඹ විශ්වවිද්‍යාලයේ තිරසර කර්මාන්ත සංවර්ධනය සඳහා උපදෙවකාරී රසායනික කළමනාකරණය පිළිබඳ සහතිකය හා ජාතික වැවිළි කළමනාකරණ ආයතනයෙන් ශ්‍රී ලංකාවේ වැවිලි අංශයේ දේශගුණික විපර්යාස අනුවර්තනය සඳහා ධාරිතාව ශක්තිමත් කිරීම පිළිබඳ සහතිකය ලබා ඇත.



ආර්. ඒ. එස්. කේ. රණසිංහ මහතා – සාමාජික – 2024 නොවැම්බර් 28 දින සිට

රණසිංහ මහතා වත්මනෙහි මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරයි. ඔහුට රාජ්‍ය අංශයේ වසර 23 ක් ඉක්මවූ අත්දැකීම් ඇති අතර රාජ්‍ය බැංකු ඇතුළුව රජයට අයත් ප්‍රධාන ව්‍යවසායන්හි අධීක්ෂණය කෙරෙහි පුළුල්ව සම්බන්ධ වී ඇත.

නෙවිල් ප්‍රනාන්දු ශික්ෂණ රෝහල, වාහන විමෝචන භාරකාර අරමුදල, සීමාසහිත ලිට්රෝ ගෑස් ලංකා සමාගම සහ ඇල්කඩුව ප්ලාන්ටේෂන්ස් සමාගම ඇතුළුව රජයට අයත් ව්‍යාපාර ගණනාවක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස කටයුතු කර ඇත. ඊට අමතරව, ඔහු විවිධ ඉහළ මට්ටමේ කමිටුවලට සිය දායකත්වය ලබා දී ඇත.

රණසිංහ මහතා කොළඹ විශ්වවිද්‍යාලයෙන් වාණිජවේදී උපාධිය ද, ජපානයේ හිරෝෂිමා විශ්වවිද්‍යාලයෙන් ආර්ථික හා සංවර්ධන ප්‍රතිපත්ති පිළිබඳ විද්‍යාපති උපාධිය ද, මිහින්තලේ රජරට විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආශ්‍රිත සාමාජිකයකු වන අතර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය සහ එක්සත් රාජධානියේ රාජ්‍ය මූල්‍ය සහ ගණකාධිකරණ ආයතනය විසින් ඒකාබද්ධව සහතික කරන ලද වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරයෙකි.

එසේම ඔහු කොළඹ මූල්‍ය අධ්‍යයන පිළිබඳ මිලෝදා ආයතනයෙන් රාජ්‍ය ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව ද හදාරා ඇත. තවද, රණසිංහ මහතා ගණකාධිකරණය, විගණනය, මූල්‍ය කළමනාකරණය, ප්‍රසම්පාදනය, සහ අවදානම් කළමනාකරණය යන විෂයයන් පිළිබඳව කිර්තිමත් ගෝලීය ආයතන හා විශ්වවිද්‍යාලවන් පුළුල් ජාත්‍යන්තර පුහුණුවීම් ලබා ඇත.



ඩී. එම්. එම්. දිසානායක මිය – සාමාජික – 2025 ජනවාරි මාසයේ සිට

දිසානායක මහත්මිය 2008 වසරේ සිට ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයේ නිලධාරිණියකි. ඇය වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරීවරියයි.

ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් (ව්‍යාපාර පරිපාලන) විශේෂ උපාධිය ද, කැළණිය විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රපති (ආර්ථික විද්‍යාව) උපාධිය ද, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් රාජ්‍ය ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව ද ලබා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය



ඒ.ඒ. විල්සන් මහතා – සාමාජික – 2025 ජනවාරි 22 වැනිදා සිට

විල්සන් මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් දෙවන පහළ ශ්‍රේණියක් සහිතව ශාස්ත්‍රවේදී (සමාජ විද්‍යා) විශේෂ උපාධියක් ද ජාතික අධ්‍යාපන ආයතනයෙන් අධ්‍යාපන පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද ලබා ගෙන ඇත. ඔහු පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනයෙන් මනෝ විද්‍යා උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාවක් හා කුසලතා සමාර්ථයක් සහිතව පාසල් උපදේශනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හදාරා ඇත.

ගුරුවරයෙකු ලෙස පුළුල් දැනුමක් හා අත්දැකීම් සහිත විල්සන් මහතා උප විදුහල්පතිවරයකු, මනෝ විද්‍යා උපදේශකයකු ලෙස හා පෙර පාසල් ගුරුවරුන් සඳහා වන ජාතික ඩිප්ලෝමාවේ දේශකයකු ලෙස කටයුතු කර ඇත.



එල්.කේ. කොඩිප්පිලි මහතා – සාමාජික – 2025 ජනවාරි 22 වැනිදා සිට

කොඩිප්පිලි මහතා 2016 වසරේ සිට කොඩෙවුස් (පුද්ගලික) සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියෙකි. ඔහුගේ සමාගම ප්‍රකට දේශීය සමාගම් 50 කට වැඩි ගණනකට හා රටවල් 15 කට වැඩි ගණනක 300 කට වැඩි ජාත්‍යන්තර පාරිභෝගික පදනමකට ERP මෘදුකාංග විසඳුම් පිළිබඳ ප්‍රමුඛතම විශේෂඥ සේවා සපයන්නෙකි.

2017 වසරේදී ඔහු ජාතික හොඳම ගුණාත්මක තොරතුරු සන්නිවේදන තාක්ෂණ සම්මාන උළෙලේදී සිල්ලර හා සැපයුම් දාම කළමනාකරණ මෘදුකාංග කාණ්ඩයේ රිදී සම්මානය දිනා ගන්නා ලදී. එසේම 2018 වසරේදී ජාතික හොඳම ගුණාත්මක තොරතුරු සන්නිවේදන තාක්ෂණ සම්මාන උළෙලේදී රජය හා රාජ්‍ය අංශයේ මෘදුකාංග කාණ්ඩයේ ලෝකඩ සම්මානය ද 2019 වසරේ ජාතික හොඳම ගුණාත්මක තොරතුරු සන්නිවේදන තාක්ෂණ සම්මාන උළෙලේදී නිෂ්පාදන, ඉංජිනේරු හා ඉදිකිරීම් මෘදුකාංග කාණ්ඩයේ කුසලතා සම්මානය ද දිනා ගන්නා ලදී.

ඔහු සම්මානලාභී ඊමා(ර්)කටින් අයි (පුද්ගලික) සමාගමේ වෙබ් සැලසුම්කරුවෙකු විය.

ඔහු SLIIT විශ්වවිද්‍යාලයෙන් තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් භෞතචිකිත්සාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය හිමි කර ගෙන ඇත.

ඉහළ කාර්ය සාධනයක් සහිත, ව්‍යවසායික හා නිෂ්පාදන කේන්ද්‍රීය මෘදුකාංග ඉංජිනේරුවන් හට මිත්‍රෝපදේශනය සැපයීමේ ශක්තිමත් පසුබිමක් ඔහු සතු වේ. මුල සිටම සාර්ථක ව්‍යාපාර ගොඩ නැගීම සම්බන්ධයෙන් කීර්තිමත් අතීත වාර්තාවක් ඔහු සතු වේ. නවීනතම තාක්ෂණවේද සහිතව සුවිශාල කේතපදනම් හා නාවික වෙබ් යෙදවුම් කළමනාකරණය කිරීමේ මනා පළපුරුද්දක් ඔහුට ඇත.



කේ.කේ.එස්. මල්වත්ත මහතා – සාමාජික – 2025 ජනවාරි 22 වැනිදා සිට

මල්වත්ත මහතා පසුගිය වසර 24 තුළ ජාතික ලොතරැයි මණ්ඩලයේ මහජන සබඳතා නිලධාරියෙකු ලෙස කටයුතු කර ඇත. ඔහු මුළු දිවයින සඳහාම සාමදාන විනිශ්චයකාරවරයෙකු වන අතර වත්මෙනෙහි මල්වත්ත මහතා කුඩා තේ වතු සංවර්ධන සංගමයේ ලේකම්වරයා ලෙස හා කුඩා තේ වතු සංවර්ධනයේ මාතර දිස්ත්‍රික් උපසභාපති වේ. ඔහු ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ රුහුණු සේවයේ සහන නිවේදකයෙකි.

තේ අංශය, තේ නිෂ්පාදනයේ වැවිලි කළමනාකරණය හා කර්මාන්තශාලා පරිචයන් පිළිබඳ පුළුල් දැනුමක් හා අත්දැකීම් ඔහු සතුය.

ආයතනික කළමනාකාරිත්වය



ටී. ඒ. ඩී. ජේ. සී. තිලකරත්න මහතා

මෙහෙයුම් ප්‍රධානී, කළමනාකරු, කළුබෝවිටියාන සීටීසී තේ කර්මාන්ත ශාලාව



පී. දෙහිවලගේ මහතා

මූල්‍ය කළමනාකරු (වැඩ බලන)



ගිණිදු පළිහේන මහතා

සහකාර කළමනාකරු පරිපාලන



සෙව්වන්දි වලාකුළුගේ මහත්මිය

සහකාර කළමනාකාරිණී අලෙවි

අපගේ නිෂ්පාදන

වෙළඳ නාම සහ තේ වර්ග

උසස්ම ශ්‍රේණියේ සීටීසී තේ සහ පහසුවෙන් භාවිතයට ගත හැකි කුඩා පැකට්ටුවල ඇසුරු තේ මගින් සැබෑ තේ රස අත්විඳීමට පහසු මාර්ගයක් සපයන එහි PF1 ප්‍රභේදය සඳහා ප්‍රකට කළුබෝවිටියාන දේශීය පාරිභෝගියන් අතර දිනෙන් දින ජනප්‍රිය වෙමින් පවතී. එසේම එය රටේ සීටීසී තේ නිෂ්පාදකයා ප්‍රමුඛයා ලෙස සිය ස්ථානය තහවුරු කර ගෙන ඇත.

දැරංගල සහ හිනිදුම වෙළඳ නාම ඒවායේ විවිධ හැඩයෙන් යුතු තද පැහැති තේ පත්‍ර පෙනුම නිසා ප්‍රකටව ඇත. පැසීමට ලක් වූ විට අනෙකුත් කලාප හයෙහිම වඩා ආවේණිකව සුවිශේෂී වූ පානයක් නිර්මාණය කරමින්, වෙනස් පූර්ණ රසයෙන් යුතු ශක්තිමත් කදිම රත් පැහැයකට පත් පානයක් බවට පත් වෙයි.

මැණික්දිවෙල වෙළඳ නාමය එහි සුවිශේෂීව තිබූ, උසස් රසයෙන් සපිරි රසය සඳහා ප්‍රකට පහත රට සම්ප්‍රදායික තේ ශ්‍රේණි මාලාවක් නිපදවයි.

සීටීසී නිෂ්පාදන







සම්ප්‍රදායික තේ
























ප්‍රමිතිය

අපගේ තේ ඒවායේ විශිෂ්ඨ ගුණාත්මකබව නිසා කීර්තියට පත්ව ඇති අතර පිළිගත් තත්ත්ව සහතික, නිෂ්පාදන වගකීම, පාරිභෝගික සෞඛ්‍යය හා ආරක්ෂාව සඳහා සහතික කර තිබේ. සියලු නිපැයුම් හා ක්‍රියාදාම ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලය විසින් නිකුත් කරන ලද ISO 22000:2018 සහ HACCP සමග පූර්ණව අනුකූල වන අතර ඊට අමතරව සියලුම කර්මාන්ත ශාලාවලට යහපත් නිෂ්පාදන පරිචයන් (GMP) පිළිබඳ සහතිකකරණය හිමිව තිබේ. සියලු කළුබෝවිටියාන තේ නිෂ්පාදන කර්මාන්ත ශාලා සඳහා ආහාර සුරක්ෂිතතා පද්ධතිය (ISO 22000:2018 සහ HACCP) ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම, නිෂ්පාදන වගකීම් කෙරෙහි අපගේ වගකීම ශක්තිමත් කරන අතර නිෂ්පාදන ක්‍රියාවලියේ ආරම්භයේ සිට අවසානය දක්වා තත්ත්ව ප්‍රමිති පවත්වා ගනු ලබන බව සහතික කරයි. බැර ලෝහ නිබේද යන්න සොයා බැලීම සඳහා තේවල ගුණාත්මකබව වාර්ෂිකව පරීක්ෂා කරනු ලැබේ. ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක නිර්ණායක සහ කෘෂි රසායනික අවසාදිත ISO 3720 ප්‍රමිතියේ අවශ්‍යතාවයන් ප්‍රකාරව වේ.



PREMIUM QUALITY
KALUBOWITIYANA
CEYLON BLACK TEA
PREMIUM QUALITY
DERANGALA
GINGER
CEYLON BLACK TEA
Black Pearl
Strong Tea


PREMIUM QUALITY
DERANGALA
CINNAMON
TEA
DERANGALA
PURE CEYLON TEA
FBOPF1
BOPF
කළුබෝවිටියාන

සංවිධාන ව්‍යුහය


සභාපති/අධ්‍යක්ෂ මණ්ඩලය
කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී
කළමනාකරු (මානව සම්පත් සහ පරිපාලනය)
කළමනාකරු (මූල්‍ය සහ අලෙවිකරණය)
පරිපාලන නිලධාරී
සහකාර කළමනාකරු (අලෙවිකරණය)
සහකාර කළමනාකරු මූල්‍ය
තොරතුරු තාක්ෂණ සහකාර
කළමනාකරණ සහකාර
අලෙවිකරණ නිලධාරී
අභ්‍යන්තර විගණන නිලධාරී
රියදුරු
විකුණුම් සහකාර
ගිණුම්/ කළමනාකරණ සහකාර
කළමනාකරණ අධ්‍යක්ෂවරයාගේ පුද්ගලික සහකාර
විගණන සහකාර
කාර්යාල කාර්ය සහායක




මෙහෙයුම් ප්‍රධානී
කර්මාන්තශාලා කළමනාකරුවන්
සහකාරකර්මාන්තශාලා කළමනාකරු
රහස්‍ය ලේකම්
ව්‍යාප්ති නිලධාරී
කර්මාන්තශාලා නිලධාරීන්
ජ්‍යෙෂ්ඨ සහකාර කර්මාන්තශාලා නිලධාරීන්
විදුලි කාර්මික/කාර්යාල නිලධාරීන්
සහකාර කර්මාන්ත ශාලා නිලධාරීන්
කණිෂ්ඨ සහකාර කර්මාන්තශාලා නිලධාරීන්
මුරකරු
දෛනික වැටුප් ලබන සේවකයින්
ප්‍රධාන ලිපිකරුවන්
ජ්‍යෙෂ්ඨ සහකාර ලිපිකරුවන්
සහකාර ලිපිකරුවන්
කනිෂ්ඨ ලිපිකරුවන්
රියදුරන්
ගබඩා භාරකරු

අපගේ ගමන් මග

1994-95
කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව නිෂ්පාදන මෙහෙයුම් ආරම්භ කරන ලදී

1998/99
ට්‍රාන්ස්වර්ල්ඩ් ස්ටාර් සම්මානය – ආර්ථික විද්‍යා අධ්‍යයන ආයතනය – ඉන්දියාව

2000-01
දැරංගල තේ කර්මාන්තශාලාව මෙහෙයුම් ආරම්භ කරන ලදී.

2010-11
වසරේ හොඳම ලංකා විශේෂිත වතු තේ – රුසියාව

2009-10
දෙවන ස්ථානය – වැඩිම ඉහළම මිල ගණන් සංඛ්‍යාව ගෝල්ඩන් කප් සම්මානය

2006-07
සිටිසි පහතරට කාණ්ඩයේ සමස්ත ලංකා වැඩිම ඉහළම මිල ගණන් සංඛ්‍යාව-ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්ස්

2005-06
සිටිසි පහතරට තේ කාණ්ඩයේ ඉහළම විකුණුම් සාමාන්‍යය – ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්ස්

2011-12
සිටිසි පහතරට කාණ්ඩයේ සමස්ත ලංකා වැඩිම ඉහළම මිල ගණන් සංඛ්‍යාව-ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්ස්

2012-13
හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාව මෙහෙයුම් ආරම්භ කරන ලදී

2013-14
ජාතික වැවිලි කර්මාන්ත සම්මානය – හොඳම මහා පරිමාණ තේ කර්මාන්තශාලාව

2014-15
වසරේ හොඳම ලංකා විශේෂිත වතු තේ – ඩුබායි – (රන් සම්මාන ජයග්‍රාහක හා රිදී සම්මාන ජහග්‍රාහක)

2015-16
සමාගමට අඛණ්ඩව එක්වූ මැණික්දිවෙල තේ කර්මාන්තශාලා සමාගම

2016-17
වසරේ හොඳම ලංකා විශේෂිත වතු තේ – චීනය

2017-18
අපගේ නව තේ ඇසුරුම දියත් කරන ලදී

2015-19
මෙම වසරේ රේන්ෆොරස්ට් ඇලායන්ස් තිරසර සහතිකය හිමිකර ගන්නා ලදී

2019-20
අපගේ නව තේ ඇසුරුම සමග නව වෙබ්අඩවිය දියත් කරන ලදී

2020-21
නව ස්ථානයක අපගේ විකුණුම් අලෙවිහල විවෘත කරන ලදී

2021-22
වසරේ හොඳම ලංකා විශේෂිත වතු තේ – රුසියාව

2022-23
මිලදී ගනු ලැබූ තේ සඳහා මෙතෙක් වාර්තා වූ ඉහළම මිල වූ රු. 437.82 ක් ගෙවන ලදී.
බදුවලින් පසු ඉහළම ලාබය – රු. මිලියන 220.80

2024-25
සිටිසි කාණ්ඩය සඳහා දෙවන ස්ථානය





කළමනාකරණ සාකච්ඡාව හා විශ්ලේෂණය

24 අගය නිර්මාණය කිරීමේ ආකෘතිය
25 මූල්‍ය සමාලෝචනය හා විශ්ලේෂණය
26 පාර්ශවකාර සබඳතාවය
27 අවදානම් කළමනාකරණය
28 මෙහෙයුම් තොරතුරු
30 කර්මාන්ත ශාලා අනුව ලාභය/(අලාභය)
31 මාසික තේ නිෂ්පාදනය
32 වාර්ෂික තේ නිෂ්පාදනය
33 මාසික අමු තේ දළු ලබා ගැනීම්
34 වාර්ෂික අමු තේ දළු ලබා ගැනීම්
35 සංසන්දනාත්මක තොරතුරු – නිෂ්පාදනය
37 විකුණුම් සාමාන්‍යය උත්නතාංශය සමග සැසඳීම
39 ඉහළම මිල ගණන් -2024-25 වර්ෂය
41 ආයතනික සමාජ වගකීම් ක්‍රියාකාරකම්
42 සම්මාන හා පිළිගැනුම
44 අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව
46 විගණන කමිටු වාර්තාව

අගය නිර්මාණය කිරීමේ ආකෘතිය

පහත දැක්වෙන රූපය සමාගමේ අගය එකතු කිරීමේ ආකෘතිය නිදර්ශනය කරන අතර වැදගත් සමාජ ආර්ථික සහ පාරිසරික බලපෑම්වලට අතිරේකව ඒකාබද්ධ වාර්තාකරණ රාමුව මගින් අර්ථ දක්වනු ලැබූ අත්‍යවශ්‍ය ප්‍රාග්ධන යෙදවුම් පාර්ශවකරුවන් සඳහා නිමවුම් හා ප්‍රතිඵල නිෂ්පාදන කිරීමට පරිවර්තනය කරන්නේ කෙසේදැයි එයින් පෙන්නුම් කරයි.

ආධාරක ක්‍රියාකාරකම්

මූල්‍ය ප්‍රාග්ධනය, නිෂ්පාදිත ප්‍රාග්ධනය, සබඳතා ප්‍රාග්ධනය, මානව ප්‍රාග්ධනය, බුද්ධිමය ප්‍රාග්ධනය

කුඩා තේ වතු හිමියන්

රජයේ ව්‍යාප්ති වැඩසටහන

පර්යේෂණ හා සංවර්ධනය

කර්මාන්තයේ නියාමකයන් සමග සහයෝගිතාව

ප්‍රධාන ක්‍රියාකාරකම්

අභ්‍යන්තර කාර්ය සම්පාදනය

කුඩා තේ වතු හිමියන්ගෙන් මිලදී ගන්නා තේ දළු රැස් කිරීම, ප්‍රවාහනය කිරීම හා ගබඩා කිරීම

මෙහෙයුම්

වෙන් කිරීම, පිරිසිදු කිරීම, පෙරළීම, රැළි කිරීම, ඉරීම, පැසවීම, වියළීම, කාණ්ඩවලට වෙන් කිරීම, ඇසිරීම, මිශ්‍ර කිරීම හා තත්ත්ව නියැදිකරණය

බාහිර කාර්යසම්පාදනය

- තැරැව්කාර සමාගම් හරහා අපනයනය
- නියෝජිතයන්, ආයතන හා සුපිරි වෙළඳහල් මගින් දේශීය විකුණුම්

අලෙවිකරණය හා විකුණුම්

- සමාජ මාධ්‍ය අලෙවිකරණය
- ආයතනික ප්‍රවර්ධන
- කර්මාන්ත ප්‍රදර්ශන

සේවා

- තේවල ඇති සෞඛ්‍යමය ප්‍රතිලාභ සම්බන්ධයෙන් පාරිභෝගිකයන් දැනුවත් කිරීම
- බෙදාහරින්නන්ගේ ධාරිතා සංවර්ධනය

බදුවලින් පසු ලාභය රු. මි. 8.3

පාරිශ්‍රමික හා ප්‍රසාද දීමනා ලෙස සේවකයන්ට රු.මි. 55

අමු තේ දළු සඳහා ගෙවීම් ලෙස කුඩා තේ වතු හිමියන්ට රු. මි. 1,314

එතෙක් මෙතෙක් ඉහළම මිල ගණන් වාර්තා කිරීමෙන් සන්නාම වටිනාකම ඉහළ නංවන ලදී

මූල්‍ය සමාලෝචනය හා විශ්ලේෂණය

විධායක සාරාංශය

සමාගමේ ලාභදායීතා තත්ත්වය මූලිකවම විතැන් කළ සමස්ත ආදායමේ සැලකිය යුතු සංකෝචනයක් මගින් සලකුණු කරනු ලැබූ බෙහෙවින් අභියෝගාත්මක මූල්‍ය වසරක් සමාගම 2025 දී අත්විඳිනු ලැබීය. වඩාත්ම තීරණාත්මක කරුණ වූයේ පෙර වසරේ යහපත් ලාභදායීත්වය ආපසු හරවමින් බදුවලින් පසු සැලකිය යුතු ශුද්ධ අලාභයකට මග පෑදූ ආදායමේ තියුණු පහත වැටීමයි. ශේෂ පත්‍රයේ මුළු වත්කම් හා ස්කන්ධවල වැඩිවීමක් හා 2024 පැවැති සෘණ මූල්‍ය තත්ත්වයෙන් වැඩි දියුණුවක් පෙන්නුම් කළද, විශේෂයෙන්ම ආදායමේ පහළ වැටීමට සාපේක්ෂව විකුණුම් පිරිවැයේ අසමානුපාතික අඩුවීම සැලකිමේදී, මෙහෙයුම් කාර්යක්ෂමතාවේ හා පිරිවැය පාලනයේ තදින් මුල් බැස ගත් ගැටලු තවදුරටත් පවති.

ආදායම් ප්‍රකාශනය විශ්ලේෂණය

1. ආදායම් හා ලාභදායීතාවය පිරිහීම

මූල්‍ය ප්‍රකාශනවල වඩාත්ම කැපී පෙනෙන ලක්ෂණය වන්නේ ආදායම 2024 පැවැති රු. 1,802,165,017 සිට 2025 වසරේදී රු. 1,678,201,858.39 දක්වා ප්‍රබල පසුබෑමට ලක්වීමයි. මෙම 6.88% ක පිරිහීම ලාභදායීත්වය කෙරෙහි දැඩි බලපෑමක් ඇති කළ අතර වර්ෂය සඳහා රු. (8,307,320.48) ක ශුද්ධ අලාභයකට හේතු කාරක වෙමින් බදුවලින් පසු ශුද්ධ ලාභය 115.01% කින් කඩා වැටුණි.

පෙර වසරේ රු. 55,574,507 ක ලාභය 2025 දී අලාභයක් දක්වා වූ මෙම ප්‍රතිවර්තනය දැඩි පීඩන ලක්ෂ්‍යයන් පෙන්නුම් කරන අතර ඒ සඳහා අඩු විකුණුම් පරිමාව, අඩු වූ තේ මිල හෝ අඩු වටිනාකම් නිෂ්පාදන කරා මාරුවීම ඇතුළුව සාධක කිහිපයක් දායක වී තිබේ.

2. මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ පිරිවැය කළමනාකරණය

ඇතැම් පිරිවැය අඩුකර ගැනීමට සමාගම සමත් වුව ද, කාර්යක්ෂමතාව සම්බන්ධයෙන් සමස්ත තත්ත්වය හිතකර හා අහිතකර දෑවල මිශ්‍රණයකි:

- විකුණුම් පිරිවැය අඩුවූයේ ආසන්න වශයෙන් 4.64% කින් පමණක් වූ අතර එය ආදායමේ අඩුවීම වූ 6.88% ට වඩා අඩුය. මෙම විසමතාව තීරණාත්මක වේ: අඩු ආදායමක් ජනනය කිරීම පිණිස සමාගම සමානුපාතිකව වඩා ඉහළ මුදලක් වැය කරන බැවින් පිරිවැය කළමනාකරණයේ සහ නිෂ්පාදන ක්‍රියාවලිවල තිබිය හැකි අකාර්යක්ෂමතාවන් ඉන් හැඟවේ.
- සළුල පිරිවැය පාලනයට පටහැණිව, පරිපාලන වියදම් සත්‍ය ලෙසම 2024 පැවැති රු.63,425,441 සිට 2025 දී රු. 76,320,780.30 දක්වා වැඩි වුණි. මෙය 20% වැඩි ඉහළ යාමක් නිරූපණය කරන අතර ආදායම් සංකෝචන කාල සීමාවක් තුළ පරිපාලන වියදම් ඉහළ යාම තිරසර නොවන බැවින් විචාරාත්මකව ඇගයිය යුතුය.
- විකුණුම් හා බෙදා හැරීමේ වියදම් රු. 4,031,339 සිට රු.795,349.17 දක්වා සැලකිය යුතු ලෙස පහත වැටීම අලෙවිකරණ හා බෙදාහැරීම් උපායමාර්ගවල සළුලතාව සම්බන්ධයෙන් ගැටලු මතු කරයි.

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය හා උපායමාර්ගික විශ්ලේෂණය

3. ද්‍රවශීලතා තත්ත්වය පිළිබඳව

සමාගමේ ද්‍රවශීලතා තත්ත්වය සංකීර්ණතාවක් පෙන්නුම් කරයි. වඩාත්ම කැපී පෙනෙන වෙනස වන්නේ 2024 දී සැලකිය යුතු සෘණ ශේෂයක් වූ රු. (5,538,276) සිට 2025 දී තරමක් ධනාත්මක වූ රු. 266,805 දක්වා තාක්ෂණිකව වැඩි දියුණු වූ මුදල් හා මුදලට සමාන දෑවල ශේෂයයි.

වත්මන් බැරකම්වල සැලකිය යුතු අඩුවීම හේතුවෙන් ජංගම අනුපාතය ශක්තිමත් සේ පෙනී යන අතර හා වැඩි දියුණු වී තිබුණ ද, ශූන්‍යයට ආසන්න මුදල් ශේෂය එදිනෙදා මෙහෙයුම් අවශ්‍යතා සපුරාලීමට සමාගමට ඇති හැකියාව පිළිබඳ බරපතල ප්‍රශ්න මතු කරයි. මෙම තත්ත්වය මුදල් ප්‍රවාහ කළමනාකරණ භාවිතයන් සහ කාරක ප්‍රාග්ධන චක්‍රය පිළිබඳව කඩිනම් විමර්ශනයක් ඉල්ලා සිටියි.

4. තොග හා වත්කම් කළමනාකරණය

තොගවල සංචලන ද නොපැහැදිලි සංඥාවක් නිකුත් කරයි. තොග භාණ්ඩ 2024 පැවැති රු. 252,295,140 සිට 2025 දී රු.276,693,418.31 දක්වා ඉහළ ගොස් ඇත.

ආදායමේ 6.88% ක සැලකියු යුතු පහළ යාමක් මධ්‍යයේ තොග භාණ්ඩවල මෙම 9.67% ක වැඩිවීම, පහත ගැටලු තිබීමේ ඉඩකඩ පෙන්නුම් කරයි:

1. දැනට පවතින තොග සංචලනය කිරීමේ දුෂ්කරතා පෙන්නුම් කරමින් තොග භාණ්ඩ ගොඩ ගැසීම විකුණුම් අඩුවීමේ සෘජු ප්‍රතිඵලයක් විය හැකිය.
2. වඩා දුර්වල වෙළඳපොළ ඉල්ලුම සමග නිෂ්පාදන පරිමා පෙළ ගැසී නොමැති බවට එය සංඥාවක් විය හැකිය.

මෙම තොග වැඩිවීම සඳහා පාදක වූ හේතු සහ සමාගමේ මෙහෙයුම් සඳහා එහි ගම්‍යමාන සහ ඇති විය හැකි අභාවිත අවදානම් නිර්ණය කිරීම පිණිස තවදුරටත් විමර්ශන සිදු කිරීම අවශ්‍ය කරනු ලබයි.

5. අයෝජන උපායමාර්ගය

2024 වසරේ පැවති රු. 322,783,887 සිට 2025 දී රු. 346,876,625.42 දක්වා කෙටිකාලීන ආයෝජනවල සැලකිය යුතු වැඩිවීම, තම වත්කම්වල විශාල ප්‍රමාණයක් ද්‍රවශීල ආකාරයෙන් පවත්වා ගැනීමට සමාගම තෝරා ගෙන ඇති බව හඟවයි.

කෙසේ වෙතත්, හේතු දෙකක් නිසාවෙන් මෙම උපායමාර්ගය ප්‍රශ්නකාරී වේ:

1. මෙම උපායමාර්ගයෙන් මූල්‍ය ආදායම ජනනය කරන අතර, ආයෝජන පදනමේ වැඩිවීමක් සිදු වුව ද, සමස්ත මූල්‍ය ආදායම 2024 පැවැති රු. 32,494,112 සිට 2025 දී රු. 25,740,078.91 දක්වා අඩු වී තිබේ. මෙයින් සමස්ත ආයෝජන කළඹ මත වඩා අයහපත් ප්‍රතිලාභ පෙන්නුම් කරයි.
2. හඳුනාගනු ලැබූ තීරණාත්මක මෙහෙයුම් දුර්වලතා (උදා: ආදායම් පිරිහීම ආපසු හැරවීම පිණිස වඩා හොඳ අලෙවිකරණය සඳහා අරමුදල් සැපයීම හෝ පිරිවැය ඵලදායීතාව සහ නිෂ්පාදන ක්‍රියාවලි වැඩිදියුණු කිරීම පිණිස ප්‍රාග්ධන වියදම්වල ආයෝජනය කිරීම) ආමන්ත්‍රණය කිරීම පිණිස මෙම සැලකිය යුතු මූල්‍ය තත්ත්වය භාවතා නොකරන්නේ ඇයිද යන ප්‍රශ්නය එයින් මතු කරයි. ද්‍රවශීලතාව පිළිබඳ වත්මන් අවධානය හර මෙහෙයුම් ලාභයක් උත්පාදනය කිරීම කෙරෙහි වූ අවධානය අභිබවා යන සෙයක් පෙනේ.

පාර්ශවකාර සබඳතාව

අප පාර්ශවකරුවන්ගේ ගැටලු හඳුනාගෙන ඒවාට පිළියම් යෙදීම කෙතරම් තීරණාත්මක ද යන්න පිළිබඳව කළුබෝවිටියාන සමාගම දැනුවත්ව සිටී. ප්‍රධාන පාර්ශවකරුවන් හඳුනාගනු ලැබ ප්‍රමුඛතා ශ්‍රේණිගත කිරීමක් ලබා දෙනු ලැබේ. අපගේ තීරණ මගින් එක් එක් කණ්ඩායමට බලපෑම් ඇති වන්නේ කෙසේද හෝ බලපානු ලැබිය හැක්කේ කෙසේද යන්න මත පරායත්ත වෙමින්, රජයට අයත් ව්‍යාපාරයක් ලෙස රජය හා ප්‍රජාවන් කෙරෙහි අපගේ දැවැන්ත වගකීමක් තිබේ. තෝරා ගැනීමේ සමාගමේ ක්‍රමවේදයට පාර්ශවකරුවන් සම්බන්ධ කර ගන්නා අතර පහත දැක්වෙන් ප්‍රමුඛතා ලැයිස්තුව ඊට අයත් වේ.

වගුව – 05

පාර්ශවකාර කණ්ඩායම	උපායමාර්ගික සැලැස්ම	අපගේ ප්‍රතිචාරය
කොටස් හිමියන්	• කාර්තුමය හා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන • වාර්ෂික වාර්තාව • කොටසක් සඳහා ඉපැයුම් • වර්ධනය හා ස්ථාවරත්වය	• වර්තමාන සංවර්ධන තත්ත්වය සමග දිගටම පවත්නා සන්නිවේදනය • කාලීන ඉපැයුම් හා ලාභාංශ බෙදා හැරීම • වර්ධනය හා ස්ථාවරත්වය සහ ඉහළ නැංවුණු අගය සහතික කිරීම • අයෝජක සබඳතා හා ප්‍රතිපෝෂණ යාන්ත්‍රණ
සේවකයන්	• රැකියා විස්තර, ඉලක්ක හා ප්‍රධාන කාර්යසාධන දර්ශක • පැහැදිලි උපදෙස් හා සමාලෝචන රැස්වීම් • කාර්යසාධන ඇගයීම්. • සුබසාධන කළමනාකරණය • වාර්ෂික පාරිතෝෂික	• ප්‍රතිදාන සහ සංසක්ත කළමනාකරණය (උදා: වන්දි) • පුහුණු හා සංවර්ධන අවස්ථා • ව්‍යුහගත වෘත්තිය සංවර්ධන මාර්ග • සුරක්ෂිත, සහභාගිත්ව හා ප්‍රියමනාප සේවා පරිසරය • කාලීන පඩිපත් හා කාර්යසාධන පාරිතෝෂික
සැපයුම්කරුවන්	• දැනුවත් කිරීමේ වැඩසටහන් • පොහොර සැපයීම • ආහාර ද්‍රව්‍ය සැපයීම • ණය යෝජනා ක්‍රම • ආකර්ෂණීය මිල • නියමිත වේලාවට ලබා දීම	• නියමිත වෙලාවට ගෙවීම් සිදු කිරීම හා කාර්යක්ෂම පිරිසැකසුම • සැපයුම්කාර රැකවරණ හා දිගු කාලීන සබඳතා ස්ථාපිත කිරීම • සාධාරණ කොන්ත්‍රාත් ගිවිසුම් හා විවෘත සන්නිවේදනය • අදාළ අවස්ථාවන්හිදී ණය යෝජනා ක්‍රම හෝ මූල්‍ය සහයෝගය • පැහැදිළි, කාලීන සහ නිශ්චිත ඇණවුම් කිරීම් • අන්‍යෝන්‍ය වර්ධනය හා ධාරිතා ගොඩ නැගීම
වගාකරුවන්	• ගුණාත්මක දළු 50% හෝ ඊට වැඩි (ගුණාත්මක දළු ප්‍රමිති) • නියමිත වේලාවට ලබා දීම • තේ මණ්ඩල අවශ්‍යතාවන්ට අනුකූල වීම • දළු සඳහා ආකර්ෂණීය මිල • සුබසාධන පහසුකම්	• නියමිත වේලාවට එකඟ වූ අනුපාතවලට ගෙවීම් සිදු කිරීම • ඉහළ ගුණාත්මකබව/ප්‍රමාණය සඳහා අගය කිරීම් හා දිරි දීමනා • තාක්ෂණික සහයෝගය හා සම්පත් සැපයීම • සුබසාධන පහසුකම් හා ප්‍රජා සංවර්ධනය • සාධාරණ ගිවිසුම් හා ගැටලු කඩිනමින් විසඳීම
ප්‍රවාහකයන්	• තේ මණ්ඩලයේ රෙගුලාසි අනුව කටයුතු කිරීම • ගිවිසුමට අනුව කටයුතු කිරීම • සුබසාධන යෝජනා ක්‍රමය	• නිසි වේලාවට ගෙවීම් සිදු කිරීම හා නිවැරැදි ලේඛනකරණය • කාර්යක්ෂමතාව හා විශ්වසනීයත්වය සඳහා දිරි දීමනා කළමනාකරණය. • පැහැදැලිව නිර්වචිත ගිවිසුම් හා උපලේඛන
තැරැවිකරුවන්	• තේ මණ්ඩලයේ රෙගුලාසි සමග අනුකූලතාව • මිල අනුපාත පාදක ප්‍රමාණය • ඉහළ පිළිගැනීම	• ගුණාත්මක නිෂ්පාදන අඛණ්ඩව සැපයුම • කාලීන තොරතුරු බෙදාහදා ගැනීම හා වෙළඳපොළ පිළිබඳ යාවත්කාලීන තොරතුරු • සබඳතා ශක්තිමත්ව කළමනාකරණය කිරීම හා ගාස්තු පාරදෘශ්‍යතාවය

අවදානම් කළමනාකරණය

සමාගමේ උපායමාර්ගික ඉලක්ක හා අරමුණු සපුරා ගැනීමේදී **අවදානම් කළමනාකරණය** තීරණාත්මක බව අධ්‍යක්ෂ මණ්ඩලය හඳුනා ගනියි. ව්‍යාපාරික මෙහෙයුම් හා මූල්‍ය කාර්යසාධනය කෙරෙහි බලපෑමක් කළ හැකි සියලු අවදානම් හඳුනා ගැනීමට, තක්සේරු කිරීමට, කළමනාකරණය කිරීමට සහ අධීක්ෂණය කිරීමට නිර්මාණය කර ඇති සවිස්තරාත්මක අවදානම් කළමනාකරණ රාමුවක් සමාගම පවත්වා ගෙන යයි.

අවදානම් පාලන ව්‍යුහය

අවදානම් නිරාවරණය කළමනාකරණය කිරීමේ **අවසන් වගකීම දරනුයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි**. සමාගමේ අවදානම් අභිරුචිය අධ්‍යක්ෂ මණ්ඩලය අධීක්ෂණය කරන අතර සංවිධානය පුරා සඵල අවදානම් කළමනාකරණය සංස්කෘතියක් අන්තර්ගත කර ඇති බවට වගබලා ගනියි.

පාලන ව්‍යුහය පහත දැක්වෙන පරිදි වේ.

- **අධ්‍යක්ෂ මණ්ඩලය:** උපායමාර්ගික දිශානතිය සපයයි, අවදානම් අභිරුචිය පනවයි, අවදානම් කළමනාකරණ රාමුවේ සඵලතාව සමාලෝචනය කරයි.
- **විගණන කමිටුව:** විශේෂයෙන්ම මූල්‍ය වාර්තාකරණයේ පූර්ණත්වයට, අභ්‍යන්තර පාලනයන්ට සහ ප්‍රධාන අවදානම් අධීක්ෂණයට අදාළව සිය අධීක්ෂණ වගකීම් සපුරාලීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වෙයි.
- **කළමනාකරණ අධ්‍යක්ෂ/ප්‍ර.වි.නි.:** අවදානම් උපායමාර්ගය ක්‍රියාත්මක කිරීම, උචිත අභ්‍යන්තර පාලන ස්ථාපිත කිරීම සහ සංවිධානය තුළ එදිනෙදා අවදානම් ක්‍රියාකාරකම් කළමනාකරණය කිරීම සඳහා වගකීම දරයි.
- **ආයතනික අවදානම:** අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය සහ ක.අ./ප්‍ර.වි.නි. සහ විගණන කමිටුවට වාර්තා කිරීම සඳහා වගකිව යුතු සංවිධානමය කර්තව්‍ය හෝ ව්‍යුහය නියෝජනය කරයි.

අවදානම් කළමනාකරණ ප්‍රවේශය

මුළුමණින්ම රජයට අයත් සමාගමක් ලෙස, සිය අරමුණු හා ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය කරා ගමන් කිරීමේදී, අවදානම් කළමනාකරණ ක්‍රියාදාමයකට කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගම නිසි අවධානය යොමු කර තිබේ. අවදානම් සම්පූර්ණයෙන්ම තුරන් කිරීමට නොහැකි අවස්ථාවන්හිදී ඒවායේ බලපෑම අවම කිරීම පිණිස අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබන බව සහතික කිරීම පිණිස උපාය මාර්ගික හා මෙහෙයුම් යන දෙයාකාර අවදානම් කාණ්ඩ යටතේ අවදානම් කළමනාකරණය නිරතුරුව සමාලෝචනය කරනු ලැබේ. ව්‍යාපාරයේ හිමිකාරිත්වය කවරක් වුවද, අවදානමේ ස්වභාවය සහ ප්‍රමාණය කළමනාකරණය නොවැළැක්විය හැකිය.

සඵල අවම කිරීමේ උපායමාර්ග සකස් කිරීම පිණිස සමාගම පහත දැක්වෙන ප්‍රධාන කාණ්ඩ දෙකට අවදානම් වර්ගීකරණය කරයි:

1. **ක්‍රමික අවදානම (විවිධාංගීකරණය කළ නොහැකි අවදානම)**

   ක්‍රමික අවදානම් යනුවෙන් සඳහන් කරනුයේ හුදෙක් සමාගමට පමණක් නොව සමස්ත වෙළඳපොළට හා ආර්ථිකයට බලපාන ආවේණික අවදානමය. මෙම සාධකවලට පොලී අනුපාත වෙනස්වීම්, උද්ධමනය, තේ කර්මාන්තයට බලපාන නියාමන වෙනස්වීම්, සහ දේශපාලනික/සමාජීය අස්ථාවරත්වය වැනි සාර්වආර්ථික විචල්‍යයන් අයත් වේ.

   - **කළමනාකරණය:** ක්‍රමික අවදානම් අභ්‍යන්තර ක්‍රියාකාරකම් මගින්ම පමණක් විවිධාංගීකරණය කොට ඉවත් කිරීමට හෝ මග හැරීමට හෝ නොහැකිය. උපායමාර්ගික ස්ථානගත වීම, මූල්‍ය ඉදිරි රැකුම, සහ බලපෑම් කිරීම/නියාමන මැදිහත්වීම හරහා මූලිකවම එය කළමනාකරණය කරනු ලැබේ.

2. **අක්‍රමික අවදානම (විවිධාංගීකරණය කළ හැකි/නිශ්චිත අවදානම)**

   අක්‍රමික අවදානම ඒ ඒ ව්‍යාපාර මෙහෙයුම හෝ කර්මාන්තයට අනන්‍ය වේ. සමාගම සඳහා **කම්කරු ආරවුල්, සැපයුම් දාම අවහිරතා, නිෂ්පාදන ගුණාත්මකභාවයේ අසාර්ථකතා, භාණ්ඩ ලේඛන අභාවිතය හා කළමනාකරණ දෝෂ** මීට අයත් වේ.

   - **කළමනාකරණය:** ශක්තිමත් අභ්‍යන්තර පාලන, සැපයුම්කාර පදනම් විවිධාංගීකරණය, නිෂ්පාදන ක්‍රියාවලි ප්‍රගස්ත කිරීම, සහ සඵල මානව සම්පත් කළමනාකරණය වැනි නිසි අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම් මගින් **අක්‍රමික අවදානම් අවම කිරීමට හෝ මග හැරීමට හැකිය.**

කොටස් හිමියන්ගේ වටිනාකම ආරක්ෂා කිරීම සහ තිරසාර ව්‍යාපාරික මෙහෙයුම් සහතික කිරීම පිණිස සිය අවදානම් කළමනාකරණ ක්‍රියාදාමය අඛණ්ඩව වැඩි දියුණු කිරීමට සමාගම කැපව සිටියි.

මෙහෙයුම් තොරතුරු

ප්‍රධාන කාර්යාලය

ලිපිනය අංක 53, රත්නායක මාවත, පැලවත්ත, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව

මානව සම්පත්

කළමනාකාර අධ්‍යක්ෂ	–	1	අභ්‍යන්තර විගණන නිලධාරී	–	0
කළමනාකරු/පරිපාලන හා මා.ස.	–	1	ගිණුම් සහායක	–	2
කළමනාකරු මූල්‍ය	–	0	කළමනාකරණ සහායක	–	5
සහාය කළමනාකරු මූල්‍ය	–	1	කාර්යාල කාර්ය සහායක	–	2
සහාය කළමනාකරු අලෙවිකරණ	–	1	රියදුරු	–	2



කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගම

දිස්ත්‍රික්කය	මාතර		**උප දිස්ත්‍රික්කය**	මොරවක	
ගම	කළුබෝවිටියාන		**උන්නතාංශය**	පහතරට	
වෙළඳ ලකුණ	කළුබෝවිටියාන		**නිෂ්පාදන වර්ගය**	සීටීසී තේ වර්ග	
මානව සම්පත්	කර්මාන්තශාලා කළමනාකරු	– 1	කර්මාන්තශාලා කාර්යමණ්ඩලය	– 15	
	කාර්යාල කාරයමණ්ඩලය	– 6			



දැරංගල තේ කර්මාන්ත ශාලාව

දිස්ත්‍රික්කය	මාතර		**උප දිස්ත්‍රික්කය**	මොරවක	
ගම	කිරිවැල්කැලේ		**උන්නතාංශය**	පහතරට	
වෙළඳ ලකුණ	දැරංගල/කිරිවැල්කැලේ		**නිෂ්පාදන වර්ගය**	සම්ප්‍රදායික තේ වර්ග	
මානව සම්පත්	කර්මාන්තශාලා කළමනාකරු	– 1	කර්මාන්තශාලා කාර්යමණ්ඩලය	– 3	
	කාර්යාල කාරයමණ්ඩලය	– 4			




හිනිදුම හිල්ස් තේ කර්මාන්ත ශාලාව

දිස්ත්‍රික්කය	ගාල්ල		**උප දිස්ත්‍රික්කය**	තවලම	
ගම	ජැස්මින් වැලි		**උන්නතාංශය**	පහතරට	
වෙළඳ ලකුණ	හිනිදුම හිල්ස්/තවලම හිල්ස්		**නිෂ්පාදන වර්ගය**	සම්ප්‍රදායික තේ වර්ග	
මානව සම්පත්	කර්මාන්තශාලා කළමනාකරු	– 0	කර්මාන්තශාලා කාර්යමණ්ඩලය	– 2	
	කාර්යාල කාරයමණ්ඩලය	– 3			



මැණික්දිවෙල තේ කර්මාන්ත ශාලාව

දිස්ත්‍රික්කය	මහනුවර		**උප දිස්ත්‍රික්කය**	යටිනුවර	
ගම	මැණික්දිවෙල		**උන්නතාංශය**	බස්නාහිර මධ්‍ය	
වෙළඳ ලකුණ	මැණික්දිවෙල		**නිෂ්පාදන වර්ගය**	සම්ප්‍රදායික තේ වර්ග	
මානව සම්පත්	කර්මාන්තශාලා කළමනාකරු	– 1	කර්මාන්තශාලා කාර්යමණ්ඩලය	– 2	
	කාර්යාල කාරයමණ්ඩලය	– 2			


මහනුවර
කොළඹ
ගාල්ල
මාතර

කර්මාන්ත ශාලා අනුව ලාභ/(අලාභ)

විකුණුම්

වගුව – 06

මාර්තු 31 දිනට කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගම	කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව රු.	දැරංගල තේ කර්මාන්තශාලාව රු.	හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාව රු.	මැණික්දිවෙල තේ කර්මාන්තශාලාව රු.	අලෙවි මධ්‍යස්ථානය රු.	එකතුව රු.
දළ විකුණුම්	1,212,061,970	232,593,636	124,233,100	81,781,930	-	1,650,670,636
අඩුකළා: තැරැව්කාර ගාස්තු හා විකුණුම් වියදම්	-12,745,517	-5,114,073	-1,761,474	-1,417,407	-	-21,038,471
	1,199,316,453	**227,479,563**	**122,471,626**	**80,364,523**	**-**	**1,629,632,165**
එකතු කළා/අඩු කළා -අන්තර් කර්මාන්ත ශාලා ගනුදෙනු						-
එකතු කළා: දේශීය විකුණුම්	22,990,365	6,378,671	126,323	1,176,115	17,898,220	48,569,693
එකතුව	**1,222,306,818**	**233,858,234**	**122,597,949**	**81,540,637**	**17,898,220**	**1,678,201,858**

විකුණුම් පිරිවැය

වගුව – 07

මාර්තු 31 දිනට කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගම	කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව රු.	දැරංගල තේ කර්මාන්තශාලාව රු.	හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාව රු.	මැණික්දිවෙල තේ කර්මාන්තශාලාව රු.	අලෙවි මධ්‍යස්ථානය රු.	එකතුව රු.
මිලදී ගත් දළු	928,127,253	177,310,443	127,700,860	80,373,367	-	1,313,511,923
නිෂ්පාදනය කිරීමේ පිරිවැය						-
නිපැයුම් පිරිවැය	137,891,989	42,800,919	39,589,911	25,955,420	11,457,190	257,695,428
සාමාන්‍ය ගාස්තු	53,906,061	29,491,195	20,346,148	14,437,563	3,406,061	121,587,028
	1,119,925,303	**249,602,558**	**187,636,918**	**120,766,350**	**14,863,251**	**1,692,794,379**
එකතු කළා: ආරම්භක තොගය	81,191,588	70,408,656	23,086,556	21,794,360	1,563,488	198,044,648
අඩු කළා: අවසාන තොගය	-134,424,750	-1,300,754	-60,565,852	-26,418,408	-1,513,428	-224,223,192
එකතුව	**1,066,692,140**	**318,710,460**	**150,157,622**	**116,142,301**	**14,913,311**	**1,666,615,835**
දළ ලාභය/(අලාභය)	155,614,677	(84,852,226)	(27,559,673)	(34,601,664)	2,984,909	11,586,023


මාසික තේ නිෂ්පාදනය

වගුව – 08

Month	කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව (කි.ග්‍රෑ)	දැරංගල තේ කර්මාන්තශාලාව (කි.ග්‍රෑ)	නිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාව (කි.ග්‍රෑ)	මැණික්දිවෙල තේ කර්මාන්තශාලාව (කි.ග්‍රෑ)	එකතුව (කි.ග්‍රෑ)
2024 අප්‍රේල්	81,294	22,950	9,177	8,264	121,685
මැයි	73,560	26,126	17,756	3,095	120,537
ජූනි	69,747	17,603	14,173	15,381	116,904
ජූලි	68,600	10,155	2,134	13,391	94,280
අගෝස්තු	66,541	8,864	301	11,098	86,804
සැප්තැම්බර්	78,940	14,097	-	3,692	96,729
ඔක්තෝබර්	78,386	13,070	3,740	2,984	98,180
නොවැම්බර්	76,309	12,076	7,273	3,049	98,707
දෙසැම්බර්	83,335	17,894	11,719	2,016	114,964
2025 ජනවාරි	81,782	12,235	15,613	4,682	114,312
පෙබරවාරි	59,471	3,861	22,217	8,966	94,515
මාර්තු	93,239	-	24,730	18,137	136,106
එකතුව	**911,204**	**158,931**	**128,833**	**94,755**	**1,293,723**


ප්‍රස්තාරය – 08

කළුබෝවිටියාන කර්මාන්තශාලාව (කි.ග්‍රෑ.)




ප්‍රස්තාරය – 09

දැරංගල කර්මාන්තශාලාව (කි.ග්‍රෑ.)




ප්‍රස්තාරය – 10

නිනිදුම හිල්ස් කර්මාන්තශාලාව (කි.ග්‍රෑ.)



ප්‍රස්තාරය – 11

මැණික්දිවෙල කර්මාන්තශාලාව (කි.ග්‍රෑ.)




වාර්ෂික තේ නිෂ්පාදනය

වගුව – 09

වසර	කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව (කි.ග්‍රෑ.)	දැරංගල තේ කර්මාන්තශාලාව (කි.ග්‍රෑ.)	හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාව (කි.ග්‍රෑ.)	මැණික්දිවෙල තේ කර්මාන්තශාලාව (කි.ග්‍රෑ.)	එකතුව (කි.ග්‍රෑ.)
1994-95	536,780	-	-	-	536,780
1995-96	1,038,739	-	-	-	1,038,739
1996-97	1,082,973	-	-	-	1,082,973
1997-98	1,194,418	-	-	-	1,194,418
1998-99	809,741	-	-	-	809,741
1999-00	884,197	14,584	-	-	898,781
2000-01	914,433	494,894	-	-	1,409,327
2001-02	954,905	536,601	-	-	1,491,506
2002-03	1,039,447	636,762	-	-	1,676,209
2003-04	1,154,969	488,915	-	-	1,643,884
2004-05	1,173,659	361,154	-	-	1,534,813
2005-06	1,161,031	348,651	-	-	1,509,682
2006-07	1,272,903	278,828	-	-	1,551,731
2007-08	1,097,681	320,512	-	-	1,418,193
2008-09	967,631	227,617	-	-	1,195,248
2009-10	950,347	222,824	-	-	1,173,171
2010-11	994,746	269,314	-	-	1,264,060
2011-12	1,170,972	240,901	-	-	1,411,873
2012-13	1,110,907	254,706	168,425	-	1,534,038
2013-14	995,844	281,666	146,031	-	1,423,541
2014-15	943,706	315,854	171,751	-	1,431,311
2015-16	994,541	460,860	219,765	117,017	1,792,183
2016-17	811,708	429,382	253,157	209,464	1,703,711
2017-18	731,750	289,634	242,955	210,107	1,474,446
2018-19	807,843	276,186	174,272	202,120	1,460,421
2019-20	900,125	290,262	138,805	125,078	1,454,270
2020-21	916,577	314,349	320,290	163,508	1,714,724
2021-22	815,525	290,193	209,053	193,272	1,508,043
2022-23	1,004,572	234,603	148,406	161,034	1,548,615
2023-24	858,881	208,325	109,986	124,545	1,301,737
2024-25	911,204	158,931	128,833	94,755	1,293,723
එකතුව	**30,202,755**	**8,246,508**	**2,431,729**	**1,600,900**	**42,481,892**

ප්‍රස්තාරය – 12

සමාගමේ වාර්ෂික නිෂ්පාදනය (කි.ග්‍රෑ.)




මාසික අමු දළු ලබා ගැනීම්

වගුව – 10

මාසය	කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව		දැරංගල තේ කර්මාන්තශාලාව		හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාව		මැණික්දිවෙල තේ කර්මාන්තශාලාව		එකතුව	
	සැපයුම්කරුවන් සංඛ්‍යාව	සපයන ලද දළු ප්‍රමාණය (කි.ග්‍රෑ.)	සැපයුම්කරුවන් සංඛ්‍යාව	සපයන ලද දළු ප්‍රමාණය (කි.ග්‍රෑ.)	සැපයුම්කරුවන් සංඛ්‍යාව	සපයන ලද දළු ප්‍රමාණය (කි.ග්‍රෑ.)	සැපයුම්කරුවන් සංඛ්‍යාව	සපයන ලද දළු ප්‍රමාණය (කි.ග්‍රෑ.)	සැපයුම්කරුවන් සංඛ්‍යාව	සපයන ලද දළු ප්‍රමාණය (කි.ග්‍රෑ.)
අප්‍රේල් 2024	2,380	370,204	563	123,861	87	43,690	86	37,768	3,116	575,523
මැයි	2,373	355,871	554	139,901	86	87,990	88	14,545	3,101	598,307
ජූනි	2,337	330,553	550	92,294	83	68,965	92	73,241	3,062	565,053
ජූලි	2,337	318,576	544	49,964	66	10,390	94	66,371	3,041	445,301
අගෝස්තු	2,302	316,623	543	44,209	59	3,994	88	58,665	2,992	423,491
සැප්තැම්බර්	2,323	373,893	552	69,430	62	5,554	85	17,067	3,022	465,944
ඔක්තෝබර්	2,312	376,457	536	68,398	67	19,150	85	14,043	3,000	478,048
නොවැම්බර්	2,313	362,820	534	62,182	79	34,707	86	14,494	3,012	474,203
දෙසැම්බර්	2,323	397,596	541	94,128	78	57,239	84	9,515	3,026	558,478
ජනවාරි 2025	2,353	388,906	546	63,021	91	77,197	94	22,605	3,084	551,729
පෙබරවාරි	2,338	292,070	531	40,988	126	105,478	88	41,901	3,083	480,437
මාර්තු	2,376	437,739	538	49,252	123	120,100	97	86,964	3,134	694,055
එකතුව		**4,321,308**		**897,628**		**634,454**		**457,179**		**6,310,569**


ප්‍රස්තාරය – 13

කළුබෝවිටියාන කර්මාන්තශාලාව (කි.ග්‍රෑ.)




ප්‍රස්තාරය – 14

දැරංගල කර්මාන්තශාලාව (කි.ග්‍රෑ.)




ප්‍රස්තාරය – 15

හිනිදුම හිල්ස් කර්මාන්තශාලාව (කි.ග්‍රෑ.)



ප්‍රස්තාරය – 16

මැණික්දිවෙල කර්මාන්තශාලාව (කි.ග්‍රෑ.)



වාර්ෂික අමු දළු පරිභෝජනය

වගුව – 11

වසර	Kalubowitiyana Tea Factory (Kg)	Derangala Tea Factory (Kg)	Hiniduma Hills Tea Factory (Kg)	Manikdewela Tea Factory (Kg)
1994/95	2,539,978	-	-	-
1995/96	4,758,850	-	-	-
1996/97	5,011,298	-	-	-
1997/98	5,619,161	-	-	-
1998/99	3,764,498	-	-	-
1999/00	4,092,958	68,377	-	-
2000/01	4,225,019	2,283,999	-	-
2001/02	4,406,549	2,452,187	-	-
2002/03	4,779,581	3,042,878	-	-
2003/04	5,316,428	2,274,012	-	-
2004/05	5,464,753	1,727,312	-	-
2005/06	5,362,732	1,688,298	-	-
2006/07	5,859,734	1,339,562	-	-
2007/08	5,061,084	1,559,138	-	-
2008/09	4,455,756	1,129,629	-	-
2009/10	4,406,749	1,114,004	-	-
2010/11	4,634,137	1,359,341	-	-
2011/12	5,421,437	1,136,937	-	-
2012/13	5,161,301	1,243,421	838,887	-
2013/14	4,638,578	1,386,298	731,251	-
2014/15	4,446,200	1,539,561	834,380	-
2015/16	4,774,872	2,249,785	1,095,511	542,106
2016/17	3,941,813	2,113,499	1,235,080	1,033,573
2017/18	3,499,414	1,474,475	1,224,781	1,097,625
2018/19	3,855,520	1,342,705	875,077	1,023,085
2019/20	4,237,689	1,399,915	683,988	625,482
2020/21	4,375,283	1,517,906	1,577,904	800,398
2021/22	3,864,328	1,415,917	1,065,152	901,435
2022/23	4,738,165	1,140,314	721,877	746,857
2023/24	4,041,473	1,125,828	533,677	631,698
2024/25	4,321,308	897,628	634,454	457,179
එකතුව	**141,076,646**	**40,022,926**	**12,052,019**	**7,859,438**

සංසන්දනාත්මක තොරතුරු - නිෂ්පාදනය

පහතරට සම්ප්‍රදායික නිෂ්පාදනය සහ ජාතික සම්ප්‍රදායික නිෂ්පාදනය සඳහා දායකත්වය

වගුව – 12

මාසය	සී.ටී.සී.		නිෂ්පාදනය කළුබෝවිටියාන* (කි.ග්‍රෑ. '000)	නිෂ්පාදනය වෙත දායකත්වය	
	පහතරට (කි.ග්‍රෑ. '000)	ජාතික (කි.ග්‍රෑ. '000)		පහතරට (%)	ජාතික (%)
අප්‍රේල් 2024	820,984	1,743,178	54,417	6.63	3.12
මැයි	919,364	2,123,853	65,334	7.11	3.08
ජූනි	868,792	2,124,188	80,740	9.29	3.80
ජූලි	872,392	2,016,278	84,664	9.70	4.20
අගෝස්තු	962,089	1,876,654	60,904	6.33	3.25
සැප්තැම්බර්	1,062,931	2,180,508	60,093	5.65	2.76
ඔක්තෝබර්	981,296	2,004,575	86,828	8.85	4.33
නොවැම්බර්	888,828	2,089,276	67,381	7.58	3.23
දෙසැම්බර්	839,906	1,930,307	72,394	8.62	3.75
ජනවාරි 2025	788,032	1,840,878	66,387	8.42	3.61
පෙබරවාරි	589,527	1,411,007	86,375	14.65	6.12
මාර්තු	805,136	2,131,826	76,460	9.50	3.59
එකතුව	**10,399,277**	**23,472,528**	**861,973**	**8.29**	**3.67**

* කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව

පහතරට සම්ප්‍රදායික නිෂ්පාදනය සහ ජාතික සම්ප්‍රදායික නිෂ්පාදනය සඳහා දායකත්වය

වගුව – 13

මාසය	සම්ප්‍රදායික නිෂ්පාදනය			නිෂ්පාදනය		නිෂ්පාදනය වෙත දායකත්වය		
	පහතරට (කි.ග්‍රෑ. '000)	මධ්‍යම (කි.ග්‍රෑ. '000)	ජාතික (කි.ග්‍රෑ. '000)	දෑ.තේ.ක*/ නි.හි.ක** (කි.ග්‍රෑ. '000)	මැ.තේ.ක*** (කි.ග්‍රෑ. '000)	පහතරට (කි.ග්‍රෑ. '000)	මධ්‍යම (කි.ග්‍රෑ. '000)	ජාතික (කි.ග්‍රෑ. '000)
අප්‍රේල් 2024	12,498,798	3,035,857	19,570,285	13,166	10,043	0.17	0.33	0.15
මැයි	13,341,372	3,644,936	22,737,352	18,865	14,551	0.20	0.40	0.18
ජූනි	12,839,891	3,590,612	20,672,039	18,015	16,001	0.22	0.45	0.21
ජූලි	12,409,432	3,262,506	20,638,358	28,680	9,037	0.37	0.28	0.26
අගෝස්තු	12,717,583	3,061,915	19,222,140	16,281	14,477	0.19	0.47	0.19
සැප්තැම්බර්	14,176,579	3,447,713	21,763,044	17,967	11,382	0.18	0.33	0.17
ඔක්තෝබර්	12,451,162	2,899,120	18,965,218	18,395	4,879	0.15	0.17	0.12
නොවැම්බර්	11,988,043	3,470,515	20,009,303	10,720	3,035	0.09	0.09	0.06
දෙසැම්බර්	12,515,827	3,024,267	19,594,317	13,831	2,660	0.16	0.09	0.11
ජනවාරි 2025	12,509,626	2,694,655	19,430,931	15,500	2,228	0.19	0.08	0.13
පෙබරවාරි	8,966,264	1,975,632	14,026,917	16,504	3,182	0.29	0.16	0.2
මාර්තු	13,014,121	4,041,727	22,059,746	8,739	10,998	0.21	0.27	0.17
එකතුව	**149,428,698**	**38,149,455**	**238,689,650**	**196,660**	**102,471**	**0.20**	**0.27**	**0.17**

* දැරංගල තේ කර්මාන්තශාලාව ** හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාව *** මැණික්දිවෙලතේ කර්මාන්තශාලාව

සංසන්දනාත්මක තොරතුරු - නිෂ්පාදනය

පහතරට තේ නිෂ්පාදනය සහ ජාතික තේ නිෂ්පාදනය සඳහා සමාගමේ දායකත්වය

වගුව – 14

මාසය	මුළු නිෂ්පාදනය			සමාගමේ මුළු නිෂ්පාදනය (කි.ග්‍රෑ. '000)	නිෂ්පාදනය සඳහා දායකත්වය		
	පහතරට (කි.ග්‍රෑ. '000)	මධ්‍යම (කි.ග්‍රෑ. '000)	ජාතික (කි.ග්‍රෑ. '000)		පහතරට (කි.ග්‍රෑ. '000)	මධ්‍යම (කි.ග්‍රෑ. '000)	ජාතික (කි.ග්‍රෑ. '000)
අප්‍රේල් 2024	13,320,564	3,555,261	21,464,608	75,166	0.56	0.28	0.35
මැයි	14,261,481	4,405,082	24,549,734	91,739	0.64	0.33	0.37
ජූනි	13,708,937	4,382,934	23,024,387	109,507	0.80	0.37	0.48
ජූලි	13,282,099	4,030,201	22,891,566	129,968	0.98	0.22	0.57
අගෝස්තු	13,679,956	3,778,300	21,281,939	84,673	0.62	0.38	0.40
සැප්තැම්බර්	15,239,934	4,198,777	24,133,248	85,939	0.56	0.27	0.36
ඔක්තෝබර්	13,432,801	3,607,331	21,149,335	105,878	0.79	0.14	0.50
නොවැම්බර්	12,877,572	4,296,832	22,302,195	78,101	0.61	0.07	0.35
දෙසැම්බර්	13,356,145	3,754,552	21,714,932	91,912	0.69	0.07	0.42
ජනවාරි 2025	13,298,112	3,478,404	21,463,016	90,716	0.68	0.06	0.42
පෙබරවාරි	9,556,056	2,595,473	15,596,129	112,367	1.18	0.12	0.72
මාර්තු	13,819,640	4,943,337	24,428,784	103,284	0.75	0.22	0.42
එකතුව	**159,833,297**	**38,149,455**	**262,162,178**	**1,261,720**	**0.79**	**0.27**	**0.48**

විකුණුම් සාමාන්‍යය උන්නතාංශය සමග සැසඳීම


පහතරට උන්නතාංශ සාමාන්‍යය සමග සැසඳීම

වගුව – 15

මාසය	පහතරට සාමාන්‍යය (රු.)	මාසික සාමාන්‍යය					
		කළුබෝවිටියාන කර්මාන්තශාලාව (රු.)	විචලනය	දෑරංගල කර්මාන්තශාලාව (රු.)	විචලනය	හිනිදුම හිල්ස් කර්මාන්තශාලාව (රු.)	විචලනය
අප්‍රේල් 2023	1,299.49	1,359.90	160.31	1,285.30	286.19)	1,312.60	(102.89)
මැයි	1,310.80	1,319.68	(92.06)	1,609.20	437.59)	1,575.37	(253.85)
ජූනි	1,066.85	1,252.22	160.59)	1,205.00	(132.73)	1,262.29	574.26)
ජූලි	1,299.03	1,286.30	172.54)	1,022.01	537.68)	1,289.80	560.97)
අගෝස්තු	1,256.62	1,529.72	358.04	1,623.52	(120.08)	1,601.26	(299.62)
සැප්තැම්බර්	1,289.65	1,528.98	259.78	1,823.39	(288.68)	1,395.02	(567.68)
ඔක්තෝබර්	1,239.29	1,552.60	298.30	1,767.98	436.34)	1,939.33	(209.22)
නොවැම්බර්	1,190.79	1,500.74	309.87	1,508.58	384.15)	1,557.59	(1,196.79)
දෙසැම්බර්	1,258.06	1,523.06	166.36	1,892.79	350.31)	1,889.58	326.82
ජනවාරි 2024	1,296.60	1,520.85	160.25	1,829.44	239.48)	1,562.98	169.98
පෙබරවාරි	1,209.58	1,409.06	189.57	1,238.60	128.90	1,558.69	170.62)
මාර්තු	1,356.32	1,466.93	289.60	1,038.65	(208.29)	1,359.65	(97.89)


ප්‍රස්තාරය – 17

කළුබෝවිටියාන කර්මාන්තශාලාව (රු.)




ප්‍රස්තාරය – 18

දෑරංගල කර්මාන්තශාලාව (රු.)



ප්‍රස්තාරය – 19

හිනිදුම හිල්ස් කර්මාන්තශාලාව (රු.)



විකුණුම් සාමාන්‍යය උන්නතාංශය සමග සැසඳීම


මධ්‍ය වගා උන්නතාංශය සමග සැසඳීම

වගුව – 16

මාසය	පහතරට සාමාන්‍යය (රු.)	මාසික සාමාන්‍යය	
		මැණික්දිවෙල (රු.)	විචල්‍යය
අප්‍රේල් 2024	1,067.92	853.90	(214.02)
මැයි	1,074.79	801.69	(273.10)
ජූනි	1,087.07	1,187.37	100.30
ජූලි	1,070.42	1,102.58	32.16
අගෝස්තු	1,032.38	881.77	(150.61)
සැප්තැම්බර්	1,041.37	849.39	(191.98)
ඔක්තෝබර්	1,017.91	879.59	(138.32)
නොවැම්බර්	990.25	851.55	(138.70)
දෙසැම්බර්	1,037.77	870.72	(167.05)
ජනවාරි 2025	1,038.05	940.93	(97.12)
පෙබරවාරි	1,028.28	1,051.82	23.54
මාර්තු	1,056.30	1,060.82	4.52

ප්‍රස්තාරය – 20

මැණික්දිවෙල කර්මාන්තශාලාව (රු.)



ඉහළම මිල ගණන් 2024-25

වගුව – 17

කර්මාන්තශාලාව	විකුණුම් දිනය	විකුණුම් අංකය	ඉන්වොයිසි අංකය	තැරවිකරු	ශ්‍රේණිය	මිල
මැණික්දිවෙල	26.03.2025	12	230	F&W	op	1340
කළුබෝවිටියාන	24-04-2024	16	688	LCBL	PD	1440
	30-04-2024	17	662	JK	PD	1600
	08-05-2024	18	705	F&W	PD	1600
	15-05-2024	19	24	JK	PD	1650
	15-05-2024	19	06,18	ASIA	PF1	1460
	28-05-2024	21	36	F&W	PF1	1280
	18-06-2024	24	81,93	F&W	PF1	1280
	18-06-2024	24	88	JK	PF1	1280
	25-06-2024	25	112	JK	PD	1220
	02-07-2024	26	113	LCBL	PF1	1300
	09-07-2024	27	147	BARTLEET	PD	1300
	30-07-2024	30	182	F&W	PD	1260
	06-08-2024	31	200	BARTLEET	PD	1320
	13-08-2024	32	216	BARTLEET	PFGS	1160
	27-08-2024	34	241	F&W	PF1	1550
	27-08-2024	34	231	F&W	PD	1400
	03-09-2024	35	250,256	ASIA	PF1	1600
	11-09-2024	36	260,268	LCBL	PF1	1550
	11-09-2024	36	261,269	F&W	PF1	1550
	11-09-2024	36	262,271	ASIA	PF1	1550
	11-09-2024	36	267,272	CTB	PF1	1550
	11-09-2024	36	263	MERCANTILE	PF1	1550
	11-09-2024	36	264,270	JK	PF1	1550
	11-09-2024	36	266	BARTLEET	PF1	1550
	11-09-2024	36	273	JK	PD	1380
	11-09-2024	36	276	BARTLEET	PFGS	1300
	18-09-2024	37	284	ASIA	PF1	1600
	18-09-2024	37	278	MERCANTILE	PF1	1600
	18-09-2024	37	279,285	JK	PF1	1600
	18-09-2024	37	280,283	BARTLEET	PF1	1600
	18-09-2024	37	281,286	CTB	PF1	1600
	18-09-2024	37	282,287	LCBL	PF1	1600
	24-09-2024	38	299	JK	PF1	1650
	24-09-2024	38	293	BARTLEET	PF1	1650
	24-09-2024	38	295	LCBL	PF1	1650
	24-09-2024	38	296	F&W	PF1	1650
	24-09-2024	38	291	BARTLEET	PD	1320
	02-10-2024	39	304	JK	PF1	1600
	02-10-2024	39	305,314	BARTLEET	PF1	1600
	02-10-2024	39	306,315	CTB	PF1	1600
	02-10-2024	39	307,316	LCBL	PF1	1600

ඉහළම මිල ගණන් 2024-25

වගුව – 17

කර්මාන්තශාලාව	විකුණුම් දිනය	විකුණුම් අංකය	ඉන්වොයිසි අංකය	තැරවිකරු	ශ්‍රේණිය	මිල
	02-10-2024	39	309,318	F&W	PF1	1600
	02-10-2024	39	310,311	ASIA	PF1	1600
	02-10-2024	39	308	F&W	PD	1320
	09-10-2024	40	324	ASIA	PF1	1600
	16-10-2024	41	341	JK	PF1	1550
	06-11-2024	44	386	MERCANTILE	PF1	1440
	06-11-2024	44	381,387	CTB	PF1	1440
	06-11-2024	44	388	LCBL	PF1	1440
	06-11-2024	44	384,389	F&W	PF1	1440
	13-11-2024	45	404	JK	PD	1440
	20-11-2024	46	415	CTB	PF1	1420
	20-11-2024	46	412,418	ASIA	PF1	1420
	16-12-2024	50	466,474	CTB	PF1	1460
	16-12-2024	50	467	MERCANTILE	PF1	1460
	16-12-2024	50	468	LCBL	PF1	1460
	16-12-2024	50	471	JK	PD	1440
	23-12-2024	51	494	ASIA	PF1	1380
	23-12-2024	51	483,490	F&W	PF1	1380
	23-12-2024	51	484,491	LCBL	PF1	1380
	23-12-2024	51	485,492	CTB	PF1	1380
	23-12-2024	51	486,495	BARTLEET	PF1	1380
	23-12-2024	51	488,493	JK	PF1	1380
	23-12-2024	51	489	MERCANTILE	PF1	1380
	08-01-2025	1	507	CTB	PF1	1460
	15-01-2025	2	516	ASIA	PF1	1480
	15-01-2025	2	513	BARTLEET	PD	1500
	22-01-2025	3	536	ASIA	PF1	1480
	28-01-2025	4	544	ASIA	PF1	1480
	05-02-2025	5	559,562,565,568	JK	PF1	1440
	05-02-2025	5	563	ASIA	PF1	1440
	05-02-2025	5	572	JK	PD	1380
	11-02-2025	6	579,582,585	ASIA	PF1	1460
	19-02-2025	7	599,605	F&W	PF1	1460
	19-02-2025	7	607	ASIA	PD	1400
	26-02-2025	8	618,621	ASIA	PF1	1480
	26-02-2025	8	616	LCBL	PF1	1480
	05-03-2025	9	632	JK	PF1	1500
	11-03-2025	10	650,640	ASIA	PF1	1500
	19-03-2025	11	666	F&W	PF1	1500
	19-03-2025	11	657	LCBL	PF1	1500
	19-03-2025	11	658,664,661,667	JK	PF1	1500
	19-03-2025	11	659,662,665,668	ASIA	PF1	1500

ආයතනික සමාජ වගකීම් ක්‍රියාකාරකම්

i. කුඩා තේ වතු හිමියන්ගේ රැස්වීම, දෑරංගල

අපේ සාර්ථකත්වයේ හදවත වන අපේ ජනතාවට ගරු කිරීම...

අප කරන සෑම දෙයකම කේන්ද්‍රයේ සිටිනුයේ අපගේ වඩාත්ම වටිනා වත්කම වන අප ජනතාවයි. අපේ ප්‍රගතිය පසුපස ඇති ගාමක බලවේග වන්නේ ඔවුන්ගේ කැපවීම, නොපසුබස්නාබව, සහ දැඩි උද්‍යෝගයයි. අපේ ජනතාව සමෘධිමත් වන විට අපගේ සමස්ත ප්‍රජාව හා සංවිධානය සාර්ථක වන බැවින්, ඔවුන්ගේ යහපැවැත්ම, වර්ධනය හා සවිබල ගැන්වීම අපි දැඩිව කැපවී සිටින්නෙමු.

අප එක්ව වර්ධනය වන්නෙමු, අප එක්ව ජයග්‍රහණය කරන්නෙමු.



ii. වාර්ෂික නවම් මහා පෙරහැර

සංස්කෘතිය හා සමගිය බැඳි පූජනීය දිනයක්...

මනා කැපවීමෙන් කටයුතු කරන කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගමේ කාර්ය මණ්ඩලයට හා ගරු සභාපතිතුමන්ට දෑරංගල සේලගිරි විහාරයේ වාර්ෂික නවම් මහා පෙරහැරට සහභාගිවීමේ ගෞරවනීය අවස්ථාව හිමි විය.

එය අපේ දේශයේ සම්ප්‍රදායේ සංස්කෘතික උරුමය විදහා දක්වන සම්ප්‍රදායික අංගයෙන් විචිත්‍රවත් වූ දිනයක් විය. භක්තියේ ආශිර්වාදය, පූජනීය සජ්ඣායනයේ දෝංකාරය හා සමගියෙන් හා ගෞරවාදරයෙන් එකට බැඳි ප්‍රජාවකගේ සන්තුෂ්ඨීය වාතලයට මුසුව තිබුණි.

මෙම උතුම් සැමරුමට සහභාගිවීමට ලැබීම අප සත්‍යලෙසම කෘතවේදී වන අතර එය අප සිත් සතන් තුළ නිදන් කළ අධ්‍යාත්මික සුපසන්බව සහ සංස්කෘතික අභිමානය අපි ඉදිරියට රැගෙන යන්නෙමු.

මෙම පූජනීය උත්සවයේ ආශිර්වාදය අපේ ඉදිරි ගමන් මග පෙන්වනු ලැබේවා!



iii. කුඩා තේ වතු හිමියන්ගේ රැස්වීම, මැණික්දිවෙල

සවිමත් අනාගතයක් සඳහා සහයෝගිතාව පෝෂණය කරමින්...

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ හා කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ නියෝජිතයන් සමග පිළිමතලාවේ මැණික්දිවෙල තේ කර්මාන්ත ශාලාවෙහි අර්ථාන්විත හා ඵලදායී සාකච්ඡාවක නිරතවීමට ලැබීම පිළිබඳව අප බෙහෙවින් සතුටු වන්නෙමු. සුවිශේෂී වැදගත්කමකින් හෙබි මෙම හමුව කුඩා තේ වතු සමිතිවල නියෝජිතයන්, වැදගත් නිලධාරීන් සහ අවට ප්‍රදේශවල විශේෂිත ප්‍රජා පාර්ශවකරුවන් එකට එක් කළ අවස්ථාවක් විය.

මෙම කතිකාව සහයෝගිතාව ශක්තිමත් කිරීම, පොදු අභියෝග ආමන්ත්‍රණය කිරීම හා තේ කර්මාන්තයේ නියැලෙන සියලු දෙනාගේ යහසාධනය හා තිරසරබව සහතික කිරීම වටා කේන්ද්‍රගත විය.

විවෘත හදවතින් හා අන්‍යෝන්‍ය ගරුත්වයෙන් යුතුව, දෑරංගල හා හිනිදුම තේ කර්මාන්ත ශාලාවල විශ්වාසය හා එකමුතුකම යළි දැල්වූ ආකාරයෙන්ම බොහෝ කලක සිට මැණික්දිවෙල කර්මාන්ත ශාලාව කෙරෙහි අහිමි වූ ජනතා විශ්වසය යළි ස්ථාපිත කළ හැකි බවට අපි විශ්වාස කරන්නෙමු.

ප්‍රජාව, පාරදෘශ්‍යභාවය සහ හවුල් ප්‍රගතිය මත පදනම් වෙමින් නව අභිප්‍රායක් සහිත අපි එක්ව පෙරමුණ කරා ගමන් කරන්නෙමු.

ශක්තියෙන් බැඳී ඉදිරිය කරා



iv. දෑරංගල තේ කර්මාන්ත ශාලාවේ නොමිලයේ වෛද්‍ය කඳවුර

සත්කාරය තුළින් ප්‍රජාවන් සවිබල ගැන්වීම...

'ක්ලීන් ශ්‍රී ලංකා' ව්‍යාපෘතියේ කොටසක් ලෙස අමාත්‍ය ගරු නලින්ද ජයතිස්ස මහතායේ සහ අමාත්‍ය ගරු සමන්ත විද්‍යාරත්න මහතාගේ මගපෙන්වීම හා සහයෝගය යටතේ මහා පරිමාණ වෛද්‍ය කඳවුරක් සෞඛ්‍ය අමාත්‍යාංශයේ කාරුණික අනුග්‍රහයෙන් දෑරංගල තේ කර්මාන්ත ශාලාවේ නොමිලයේ පවත්වන ලදී.

මෙම මහඟු කාර්යය සඳහා වෛද්‍යවරුන් 35 දෙනෙකු පමණ හා සෞඛ්‍යාරක්ෂණ වෘත්තිකයන් 85 දෙනෙකු එක් වූ අතර ඔවුන්ගේ එකමුතුවෙන් වෛද්‍ය අවධානය, උපදේශන සහ සත්කාර පිරිනමමින් අවට ප්‍රජාවන්හි පුද්ගලයන් 1000 කට අධික සංඛ්‍යාවකට සේවා සපයන ලදී.

සෞඛ්‍ය සත්කාරක සේවා සැපයීමට අමතරව, කර්මාන්ත ශාලාව හා ප්‍රජාව අතර බන්ධනය ශක්තිමත් කරමින් හා ජනතාවගේ විශ්වාසය හා හොඳ නිත යළි ස්ථාපිත කිරීමට අත්වැලක් වෙමින් මෙම කාර්යය මෙම කාර්යය බැඳීම් ගොඩ නැගීමට දායක විය.

වඩා සෞඛ්‍ය සම්පන්නව, වඩා ශක්තිමත්ව හ එක අරමුණකින් බැඳී අප එක්ව ඉදිරියට ගමන් කරමු.



සම්මාන හා පිළිගැනුම්

2004

ට්‍රාන්ස් වර්ල්ඩ් ගෝල්ඩ් ස්ටාර් සම්මානය
ආර්ථික අධ්‍යයන ආයතනය

2005

වර්ෂය සඳහා සමස්ත ලංකා ඉහළම විකුණුම් සාමාන්‍යය
ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්

2009

වර්ෂය සඳහා සීටීසී පහතරට කාණ්ඩයේ වැඩිම ඉහළම මිල
ගණන් සංඛ්‍යාව

LCBL ප්‍රගතියේ ඇගයූ පාර්ශවකරු

2011

වර්ෂය සඳහා සමස්ත ලංකා වැඩිම ඉහළම මිල ගණන්
සංඛ්‍යාව ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්

සීටීසී පහතරට කාණ්ඩයේ වර්ෂය සඳහා ඉහළම විකුණුම්
සාමාන්‍යය ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්

වර්ෂය සඳහා කළු තේ කාණ්ඩයේ සමස්ත ලංකා ඉහළම
විකුණුම් සාමාන්‍යය ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්

වර්ෂය සඳහා වැඩිම ඉහළම මිල ගණන් සංඛ්‍යාව (Off Grade)
ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්

වර්ෂය සඳහා වැඩිම ඉහළම මිල ගණන් සංඛ්‍යාව
(PD කාණ්ඩය) ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්

2වන කාර්තුවේ ඉහළම ශුද්ධ විකුණුම් සාමාන්‍යය වූ 434.1
ඒෂියා සියාකා

2012

වර්ෂය සඳහා සමස්ත ලංකා ඉහළම විකුණුම් සාමාන්‍යය
ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්

වර්ෂය සඳහා වැඩිම ඉහළම මිල ගණන් සංඛ්‍යාව
(PD කාණ්ඩය) ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්

2014

සීටීසී පහතරට කාණ්ඩයේ වර්ෂය සඳහා ඉහළම විකුණුම්
සාමාන්‍යය ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්

2015

ඩුබායිහි පැවැති තරඟයේදි වසරේ හොඳම ලංකා වතු තේ
සම්මානලාභී (ශ්‍රේණිය - PF1) ශ්‍රී ලංකා තේ මණ්ඩලය

ඩුබායිහි පැවැති තරඟයේදි වසරේ හොඳම ලංකා වතු තේ
සම්මානලාභී (ශ්‍රේණිය - BP1) ශ්‍රී ලංකා තේ මණ්ඩලය

2017

හොඳම තේ කර්මාන්ත ශාලාව කලාපීය මට්ටම
ශ්‍රී ලංකා තේ මණ්ඩලය

හොඳම තේ කර්මාන්ත ශාලාව කලාපීය මට්ටම ජාතික තේ
සම්මාන උළෙල

චීනයේ පැවැති වසරේ හොඳම ලංකා විශේෂත වතු තේ
තරඟයේ අවසන් වටයට තේරීම - ශ්‍රී ලංකා තේ මණ්ඩලය

2022

වාර්තාගත ඉහළම මිල- ජෝන් කීල්ස්

මූල්‍ය රෙගුලාසිවලට අනුකූලවන සාර්ථක රාජ්‍ය ව්‍යාපාරය
ගැනුම්කරු - යුනිවර්ල්ඩ් ටීස්



2024-25

හොඳම සීටීසී තේ නිෂ්පාදක, සම්මානනීය අනුශූරතාවය

ශ්‍රී ලංකා තේ අපනයනකරුවන්ගේ සංගමය විසින් පිරිනමනු ලබන ගෞරවනීය පිළිගැනීමක් වන 2024 වසරේ හොඳම CTC තේ නිෂ්පාදකයා ලෙස කළුබොවිටියාන තේ කර්මාන්ත ශාලාවට අනුශූරතාවය හිමිවීම ගැන අපි ආඩම්බර වෙමු. මෙම ගෞරවනීය සම්මානය තේ නිෂ්පාදනයේ විශිෂ්ටත්වය සහ නවෝත්පාදනය සඳහා අපගේ නොසැලෙන කැපවීමට සාක්ෂියකි.





ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය සම්මාන උළෙළ 2024

කාර්මික විශිෂ්ටත්වය සඳහා අපගේ නොසැලෙන කැපවීම අගයමින්, කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලාව ජාතික මට්ටමින් නිෂ්පාදන අංශය - අති විශාල කාණ්ඩය යටතේ ගෞරවයට පාත්‍ර වී ඇත. මෙම කීර්තිමත් සම්මානය නවෝත්පාදනය, මෙහෙයුම් විශිෂ්ටත්වය සහ ශ්‍රී ලංකාවේ නිෂ්පාදන ක්ෂේත්‍රයට බලපෑම්කාරී දායකත්වය සඳහා අපගේ අඛණ්ඩ කැපවීම පිළිබිඹු කරයි.



තේ - ජීවන රටාවක් හා ජීවනෝපායක් - කොළඹ ජාත්‍යන්තර තේ සමුළුව 2024

කොළඹ ජාත්‍යන්තර තේ සමුළුවේදී අපගේ වතුයායට 2024 වසරේ ලංකා විශේෂිත වතු තේ සම්මානය හිමි වූ බව නිවේදනය කිරීමට ලැබීම අපට ගෞරවයකි. මෙම කීර්තිමත් පිළිගැනීම, සම්මානලාභී, උසස් තත්ත්වයේ ලංකා තේ නිෂ්පාදනය, ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ පොහොසත් උරුමය සහ විශිෂ්ටත්වය ආරක්ෂා කිරීම සඳහා අපගේ කැපවීම සමරනු ලබයි.



අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

සමාලෝචිත 2025 මාර්තු 31 න් අවසන් වසර සඳහා සමාගමේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමගින් අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ වාර්ෂික වාර්තාව මේ සමග ඉදිරිපත් කරයි.

2025 මාර්තු 31 න් අවසන් වසර සඳහා සමාගමේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ විගණකගේ වාර්තාව විගණන දෙපාර්තමේන්තුව විසින් අවසන් ලෙස සකස් කර නොමැති බැවින් ඒවා මෙහි සපයා නොමැත. 2025 මාර්තු 31 න් අවසන් වසර සඳහා විගණනය කරන ලද මූල්‍ය වාර්තා සහ විගණකගේ වාර්තාව සමාප්ත කිරීමෙන් පසුව, අතිවිශේෂ මහා සභා රැස්වීමක් කැඳවීම මගින් සම්මත කිරීම සඳහා කොටස් හිමියන් අතර සංසරණය කරනු ඇත.

සාරාංශගත කළ මූල්‍ය තත්ත්වය:

සාරාංශගත කළ මූල්‍ය තත්ත්වය පහත දැක්වෙන පරිදි වේ:

වගුව – 18

මාර්තු 31 න් අවසන් වසර සඳහා	2025 රු.	2024 රු.
ආදායම	1,678,201,858.39	1,802,165,017
විකුණුම් පිරිවැය	(1,666,615,835.04)	(1,747,661,088)
දළ ලාභය	**11,586,023.35**	**54,503,929**
වෙනත් මෙහෙයුම් ආදායම	32,619,154.02	49,849,950
මෙහෙයුම් වියදම්වලට පෙර ලාභය	**44,205,177.37**	**104,353,880**
පරිපාලන වියදම්	(76,320,780.30)	(63,425,441)
විකුණුම් සහ බෙදාහැරීම් වියදම්	(795,349.14	(4,031,339)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලාභ	**32,910,952.07**	**36,897,100**
මූල්‍ය ආදායම්	25,740,078.91	32,494,112
මූල්‍ය වියදම්	-	-
ශුද්ධ මූල්‍ය ආදායම	**25,740,078.91**	**32,494,112**
බදුකරණයට පෙර ශුද්ධ ලාභය	**(7,170,873.16)**	**69,391,212**
බදුකරණය	(1,136,447.32)	(13,816,705)
බදුකරණයෙන් පසු ශුද්ධ ලාභය	**(8,307,320.48)**	**55,574,507**
කොටසක් සඳහා ඉපැයුම්	(1.79)	11.98
වෙනත් විස්තීරණ ආදායම් පිළිබඳ ප්‍රකාශනය		
බදුකරණයෙන් පසු ශුද්ධ ලාභය	(8,307,320.48)	55,574,507
දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය	34,977,499.95	34,400,000
විශ්‍රාම ප්‍රතිලාභ මත ආයුගණක ලාභ/(අලාභ)	1,737,304.00	1,427,352
විලම්බිත බදු ලාභ/(අලාභ)	(9,972,058.99)	(10,748,205)
වසර සඳහා මුළු විස්තීරණ ආදායම	**14,960,816,49**	**80,653,654**

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී යොදා ගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු 52 සිට 74 තෙක් දක්වා ඇත. එසේ යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල ප්‍රමාණාත්මක වෙනස්කම් නොමැත.

අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය සහ අනෙකුත් ප්‍රතිලාභ

2025 මාර්තු 31න් අවසන් මූල්‍ය වසර සඳහා අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්හි සඳහන් කොට ඇත.

වත්මන් විගණන කමිටු සාමාජිකයන්

ආර්. ඒ. එස්. කේ. රණසිංහ මයා

ඩී. එම්. එම්. දිසානායක මිය

ඒ. ඒ. විල්සන් මයා

මූල්‍ය වර්ෂය තුළ ඉල්ලා අස්වීම් ලබා දුන් අධ්‍යක්ෂවරු

ඩබ්ලියූ. ඒ. එල්. වික්‍රමආරච්චි මයා
(2025 ජනවාරි 15 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය)

ආර්. එච්. එස්. ටී. සමරතුංග මයා
(2025 ජනවාරි 22 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය)

ආර්. සී. ඩී. ජයවර්ධන මයා
(2025 ජනවාරි 22 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය)

ඩී. එස්. එම්. ජයසේකර මයා
(2025 ජනවාරි 22 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය)

මූල්‍ය වර්ෂය තුල පත් කළ අධ්‍යක්ෂවරුන්

ඩී. එම්. මානෙල් දිසානායක මහතා
(2025 ජනවාරි 15 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී)

කේ. කේ. සුනිල් මල්වත්ත මහතා
(2025 ජනවාරි 22 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී)

එල්. කේ. කොඩිප්පිලි මහතා
(2025 ජනවාරි 22 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී)

ඒ. ඒ. විල්සන් මහතා
(2025 ජනවාරි 22 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී)

වත්මන් අධ්‍යක්ෂවරුන්

එස්. එස්. සමරසිංහ මහතා - සභාපති

ආර්. ඒ. එස්. කේ. රණසිංහ මහතා

ඩී. එම්. එම්. දිසානායක මිය

එල්. කේ. කොඩිප්පිලි මහතා

කේ. කේ. එස්. මල්වත්ත මහතා

ඒ. ඒ. විල්සන් මහතා

පී. ඩී. එස්. ඒ. ගුණසේකර මහතා

ඩබ්ලිව්. ජී. ආර්. ඩී. විමලරත්න මහතා

විගණකවරු

සමාලෝචිත වර්ෂය සඳහා ගිණුම් විගණකාධිපතිවරයා විසින් විගණනය කරන ලද අතර ඔහු නැවත විගණක ලෙස පත්කිරීමට ඉල්ලා ඇත. 2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව ඔවුන් නැවැත පත්කිරීම හා ඔවුන්ගේ පාරිශ්‍රමිකය තීරණය කිරීමට අධ්‍යක්ෂවරුන්ට බලය පවරන යෝජනාවක් එළඹෙන වාර්ෂික මහා සභා රැස්වීමේදී යෝජනා කරනු ඇත.

සමාගම විසින් විගණන ගාස්තු ලෙස රු. 618,000.00 ක් ගෙවන ලදී.

අධ්‍යක්ෂවරුන් දන්නා තරමට ඉහත හෙළිදරව් කර ඇති දෑ හැරණු විට විගණකවරුන්ට සමාගම සමග කිසිදු සබඳතාවක් (විගණකවරයකු ලෙස හැර) නොමැත. විගණකවරුන්ට සමාගම සමග කිසිඳු බැඳියාවක් ද නොමැත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

P. R. SECRETARIAL SERVICES (PRIVATE) LIMITED
(PV 2631)
Company Secretary / Director / Authorised Signatory
Company Secretary Reg. No. SEC/(2)/96-25

අධ්‍යක්ෂ | ලේකම්වරු

2025 නොවැම්බර් 18 වැනි දින කොළඹදීය

විගණන කමිටු වාර්තාව

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් රජයට අයත් ව්‍යාපාර සඳහා වන ආයතනික පාලන මාර්ගෝපදේශ ප්‍රකාරව විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වන අතර මහා භාණ්ඩාගාරයේ නියෝජිතයා විසින් එහි සභාපතිත්වය දරයි.

එම මාර්ගෝපදේශ අනුව, අදාළ සියලු නීති, රෙගුලාසි සහ රජයේ චක්‍රලේඛ සමග අනුකූලතාව අඛණ්ඩව සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම මගින් මූල්‍ය වාර්තාකරණය අදාළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ අනෙකුත් අදාළ නෛතික අවශ්‍යතාවයන් සමග අනුකූල වන බව සහතික කිරීමේදී විගණන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය විය යුතුය. එසේම, අධ්‍යක්ෂ මණ්ඩලයට ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග ගැනීමට හැකිවන පරිදි අභ්‍යන්තර පාලන පද්ධති සහ අභ්‍යන්තර හා බාහිර විගණන වාර්තා සහ කෝප් කමිටුවේ නිර්දේශ සමාලෝචනය කිරීම මගින් අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම ද විගණන කමිටුවේ වගකීම වන්නේය.

කමිටු රැස්වීම්

සමාලෝචිත වර්ෂයේදී සියලු සාමාජිකයන්ගේ සහභාගිත්වයෙන් කමිටුව සිව් වරක් කැඳවනු ලැබූ අතර වත්කම් ආරක්ෂා කිරීම සඳහා පිළිගත හැකි මට්ටමක සහතිකයක් සැපයීමේදී අභ්‍යන්තර පාලන පද්ධතියේ කාර්යක්ෂමතාව ඇගයීම සඳහා පවතින පරිපාටි පරීක්ෂා කර බලන ලදී.

වගුව – 19

කමිටු සාමාජිකයාගේ නම	2024 අප්‍රේල් 9	2024 ජූලි 17	2025 මාර්තු 20
තුෂාර රුද්‍රිගු මයා (2024.11.28 දින සිට බල පැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය)	✓	✓	✗
ඩී. එම්. එම්. දිසානායක මිය	✓	✓	✓
එස්. එම්. ජයසේකර මයා (2025.01 22 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය)	✓	✓	✗
ආර්. ඒ. එස්. කුමාර රණසිංහ මහතා (2025.02.07 දින සිට බලපැවැත්වෙන පරිදි පත්කරන ලදී.)	✗	✗	✓
ලහිරු කුමුදිත කොඩිප්පිලි මයා (2025.02.07 දින සිට බලපැවැත්වෙන පරිදි පත්කරන ලදී.)	✗	✗	✓
කේ. කේ. සුනිල් මල්වත්ත මහතා (2025.02.07 දින සිට බලපැවැත්වෙන පරිදි පත්කරන ලදී.)	✗	✗	✓
ඒ. ඒ. විල්සන් මහතා (2025.02.07 දින සිට බලපැවැත්වෙන පරිදි පත්කරන ලදී.)	✗	✗	✓

ආරාධනයෙන් සහභාගිවීම

සභාපති, කළමනාකරණ අධ්‍යක්ෂ, මූල්‍ය අධ්‍යක්ෂ සහ අභ්‍යන්තර විගණන නිලධාරී ආරාධනයෙන් රැස්වීම්වලට සහභාගි විය. ජාතික විගණන කාර්යාලය නියෝජනය කරමින් සහකාර විගණකාධිපති සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක නිලධාරීවරයා නිරීක්ෂකයන් ලෙස රැස්වීම්වලට සහභාගි විය.

වර්ෂය තුළ කමිටුවේ ක්‍රියාකාරකම්

- සමාගමේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පරීක්ෂා කරන ලදී
- අභ්‍යන්තර විගණන වාර්තා අදාළ පාර්ශවයන්ගේ අනුරූපී ප්‍රතිචාර සමගින් සමාලෝචනය කරන ලදී.
- වර්ෂයට අදාළව ජාතික විගණන කාර්යාලය විසින් මතු කරන ලද විගණන විමසුම් සඳහා ඉදිරිපත් කිරීම පිණිස පිළියෙළ කරන ලද පිළිතුරු සමාලෝචනය කරන ලදි
- විනය ක්‍රියා මාර්ග, කර්මාන්ත ශාලා මෙහෙයුම් සහ තොරතුරු පද්ධතියට අදාළ වාර්තා සමාලෝචනය කර සාකච්ඡා කරන ලදී.
- ව්‍යාපාරික මෙහෙයුම් වැඩි දියුණු කිරීම පිණිස අවශ්‍ය අවධානම් අවම කිරීමේ ක්‍රියා මාර්ග, අවශ්‍ය පාලන අභ්‍යන්තර පාලන අධීක්ෂණ යාන්ත්‍රණ නිර්දේශ කරන ලදී.

කමිටුවේ යොමුකිරීම් අනුදේශ සියලු ප්‍රමාණාත්මක අංශවල විෂයයන් ආවරණය කරන ලද බව විගණන කමිටුව නිගමනය කරයි.



මූල්‍ය වාර්තා

48 ස්වාධීන විගණකගේ වාර්තාව

52 ලාභ/(අලාභ) සහ අනෙකුත් විස්තීරණ ආදායම පිළිබඳ ප්‍රකාශනය

53 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

54 ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය

55 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

56 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

74 පූර්ව වසර දහය තුළ විශේෂ මූල්‍ය සිදුවීම්

විගණකගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. පීඒඑල්/ඩී/කේවීඑෆ්එල්/ 1/2024/2025/07

ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2025 සැප්තැම්බර් 16 දින

සභාපති
සී/ස කළුබෝවිටියාන ටී ෆැක්ටරි ලිමිටඩ්

සී/ස කළුබෝවිටියාන ටී ෆැක්ටරි ලිමිටඩ්හි 2025 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

සී/ස කළුබෝවිටියාන ටී ෆැක්ටරි ලිමිටඩ්හි ("සමාගම") 2025 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2025 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සමාගමේ 2024/2025 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් සමාගමේ 2024/2025 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තිය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්:

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) (ඈ) වගන්තියේ සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඉ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

විගණකගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනුයාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) දෑරංගල තේ කර්මාන්තශාලා භූමියේ තේ පැළ 100,000 ක් පමණ තවාන්කල හැකි තවාන් ඉඩක් පැවතුනත් පැල තවානෙහි 2023 ජූලි මාසයෙන් පසුව තේ පැළ නිෂ්පාදනය කර නොමැති අතර පැළ තවාන සඳහා කර්මාන්තශාලා කළමණාකරනය නිසි අවධානයක් යොමුකර නොමැති බව හා එමඟින් සම්පත් ඌන උපයෝජිතව පවතින බව භෞතික පරීක්ෂාව තුළින් තවදුරටත් නිරීක්ෂණය විය.

(ආ) කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව පිහිටි රු.23,000,000 කට තක්සේරු කර ගිණුම්ගත කර තිබුණු හෙක්ටයාර් 4.075 ක් වූ ඉඩමෙහි හෙක්ටයාර් 0.802 ක 1989 හා 1996 කාලයේ සිට අනවසර පදිංචිකරුවන් 15 දෙනෙකු පදිංචි වී සිටින අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මෙම ගැටලුව නිරවුල් කරගැනීමට සමාගම අපොහොසත්වී තිබුණි.

(ඇ) තේ ශක්ති අරමුදල යටතේ ආරම්භ කරන ලද හිනිදුම හිල්ස් හා මැණික්දිවෙල තේ කර්මාන්තශාලා පිළිවෙලින් 2012 සහ 2015 වර්ෂයන්හිදී කළුබෝවිටියාන ටී ෆැක්ටරි ලිමිටඩ් වෙත මෙහෙයුම් කටයුතු සඳහා පවරා දෙනු ලැබූ අතර සමාගම විසින් තේ ශක්ති අරමුදල වෙත 2015 අප්‍රේල් 09 දින රු. මිලියන 50 ක ණය මුදලක්ද ලබා දී තිබුණි. 2019 මාර්තු 19 දිනැති අංක අමප/19/0743/117/024 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව මෙම මුදල සහ අදාළ පොලිය වෙනුවෙන් හිනිදුම හා මැණික්දිවෙල තේ කර්මාන්තශාලාවල අයිතිය නීත්‍යානුකූලව සමාගම වෙත පවරාගැනීමට අනුමැතිය ලැබී තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එම කර්මාන්තශාලාවන්හි නීත්‍යානුකූල අයිතිය පවරාගෙන නොතිබුණි.

(ඈ) කර්මාන්තශාලා නව තාක්ෂණයට අනුවර්තනය කිරීම සඳහා රජයේ ප්‍රදාන වශයෙන් 2021 සැප්තැම්බර් 15 දින රු.18,204,900 ක් සමාගම වෙත ලබා දී තිබුණි. මේ යටතේ අනුමැතිය හිමිව තිබුණු ප්‍රසම්පාදන කාර්යයන් අතරින් CTC කටර් මුවහත් කිරීම සඳහා පරිගණකගත තාක්ෂණය හඳුන්වාදීම සහ CTC තේ ශ්‍රේණිගත කිරීමේ යන්ත්‍ර 02 ක් මිලදී ගැනීම හා ස්ථාපිත කිරීමේ කටයුතු 2025 මාර්තු 31 වන විටත් ආරම්භ කර නොතිබුණු අතර රු.7,620,900 ක ප්‍රදාන ඉතිරිව පවතින බව නිරීක්ෂණය විය.

(ඉ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත ප්‍රධාන කාර්යාල කාර්ය මණ්ඩලයේ තනතුරු 40 ක් පැවතියද ඉන් තනතුරු 19 ක් සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමතකරන ලද තේ කර්මාන්තශාලා සඳහා කාර්යය මණ්ඩලයේ තනතුරු 82 න් තනතුරු 36 ක් පුරප්පාඩු වී තිබුණු අතර බඳවා ගැනීමට කටයුතු කර හෝ අනුමත සේවක සංඛ්‍යාවට අවශ්‍ය සංශෝධන සිදුකර කර නොතිබුණි.

විගණකගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඊ) දෑරංගල තේ කර්මාන්තශාලාව සමාලෝචිත වර්ෂයේදී රු. 84,852,226 ක අලාභයක් වාර්තා කර ඇති අතර , එය පසුගිය වර්ෂයේදී වාර්තා කරන ලද රු.24,157,686 ක අලාභය සමඟ සැසඳීමේදී සියයට 251 කින් පමණ වැඩි තිබුණි. පසුගිය වර්ෂයට අනුලෝමව, හිනිදුම හිල්ස් සහ මැණික්දිවෙල තේ කර්මාන්තශාලාද පිළිවෙලින් රු.27,559,672 ක සහ රු. 34,601,663 ක අලාභයන් වාර්තාකර තිබුණු බවට නිරීක්ෂණය විය.

(උ) කළුබෝවිටියාන, දෑරංගල, හිනිදුම හිල්ස්, සහ මැණික්දිවෙල තේ කර්මාන්තශාලාවන්හී වාර්ෂික නිමි තේ නිෂ්පාදන ධාරිතාව පිළිවෙලින් කිලෝ ග්‍රෑම් 1,440,000 ක් 576,000 ක් 516,000 ක් සහ 300,000 ක් වුවද සමාලෝචිත වර්ෂයෙහි මෙහි නිමි තේ නිෂ්පාදනය පිළිවෙලින් කිලෝ ග්‍රෑම් 911,204 ක් 158,926 ක් 129,130 ක් හා 94,755 ක් විය. ඒ අනුව කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාවෙහි ධාරිතා ඌන උපයෝජනය සියයට 37 ක්වන අතර දෑරංගල, හිනිදුම සහ මැණික්දිවෙල කර්මාන්තශාලාවන්හී ධාරිතා ඌන උපයෝජනය පිළිවෙලින් සියයට 73 ක් 75 ක් සහ 68 ක් වැනි ඉහළ අගයක් පැවති බව නිරීක්ෂණය විය.

(ඌ) දෑරංගල හා හිනිදුම කර්මාන්තශාලා සඳහා Batch Weighing යන්ත්‍ර 02 ක් රු.4,031,000 ක පිරිවැයක් යටතේ 2023 වර්ෂයේ මිලදී ගෙන ස්ථාපිත කර තිබුණු නමුත් විගණනය විසින් සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී මෙම යන්ත්‍ර මඟින් අපේක්ෂිත වාර්තා ලබාගැනීමේ හැකියාවන් නොමැතිව සහ භාවිතා කිරීමකින් තොරව ඌන උපයෝජිතව පවතින බව නිරීක්ෂණය විය.

(එ) දෑරංගල තේ කර්මාන්තශාලාවට අදාළ නිමි තේ තොග පිළිබඳ විෂමාචාර ක්‍රියාවක් සම්බන්ධයෙන් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ , කළමනාකරු (මූල්‍ය හා අලෙවි) සහ අභ්‍යන්තර විගණනකගේ සේවය මූලික විමර්ෂනයක් පවත්වා 2025 මාර්තු 27 දින තාවකලිකව වැඩ තහනමකට ලක් කර ඇති අතර විගණන වාර්තාවේ දින වන විටත් විධිමත් විනය පරීක්ෂාවන් සිදුකර වාර්තා නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි.

ජී. එච්. ඩී. ධර්මපාල
විගණකාධිපති (වැ.බ)

කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලාව
ලාභ/(අලාභ) හා අනෙකුත් විස්තීරණ ආදායම පිළිබඳ ප්‍රකාශනය

වගුව – 21

මාර්තු 31 න් අවසන් වසර සඳහා	සටහන	2025 (රු.)	2024 (රු.)
ආදායම	03	1,678,201,858.39	1,802,165,017
විකුණුම් පිරිවැය	04	(1,666,615,835.04)	(1,747,661,088)
දළ ලාභය		**11,586,023.35**	**54,503,929**
වෙනත් මෙහෙයුම් ආදායම	05	32,619,154.02	49,849,950
මෙහෙයුම් වියදම්වලට පෙර ලාභය		**44,205,177.37**	**104,353,880**
පරිපාලන වියදම්	06	(76,320,780.30)	(63,425,441)
විකුණුම් සහ බෙදාහැරීම් වියදම්	07	(795,349.14)	(4,031,339)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලාභ		**(32,910,952.07)**	**36,897,100**
මූල්‍ය ආදායම්	08.1	25,740,078.91	32,494,112
මූල්‍ය වියදම්	08.2	-	-
ශුද්ධ මූල්‍ය ආදායම		25,740,078.91	32,494,112
බදුකරණයට පෙර ශුද්ධ ලාභය		**(7,170,873.16)**	**69,391,212**
බදුකරණය	09	(1,136,447.32)	(13,816,705)
බදුකරණයෙන් පසු ශුද්ධ ලාභය		**(8,307,320.48)**	**55,574,507**
කොටසක් සඳහා ඉපැයුම්	10.1	(1.79)	11.98
බදුකරණයෙන් පසු ශුද්ධ ලාභය		(8,307,320.48)	55,574,507
දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය		34,977,499.95	34,400,000
විශ්‍රාම ප්‍රතිලාභ මත ආයුගණක ලාභ/(අලාභ)		(1,737,304.00)	1,427,352
විලම්බිත බදු ලාභ/(අලාභ)		(9,972,058.99)	(10,748,206)
වසර සඳහා මුළු විස්තීරණ ආදායම		**14,960,816.49**	**80,653,654**

පිටු 56 සිට 73 දක්වා වූ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ඒකාබද්ධ කොටසක් වන්නේය.

කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලාව
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

වගුව – 22

මාර්තු 31 න් අවසන් වසර සඳහා	සටහන	2025 (රු.)	2024 (රු.)
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ,පිරියත සහ උපකරණ	11	472,935,124.23	468,143,153
ජීව විද්‍යාත්මක වත්කම්	12	14,680,173.10	11,898,706
මුළු ජංගම නොවන මුළු වත්කම්		**487,615,297.33**	**480,041,858**
ජංගම වත්කම්			
වට්ටෝරු භාණ්ඩ	13	276,693,418.81	252,295,140
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ	14	96,017,546.32	104,382,530
කෙටි කාලීන ආයෝජන	15	346,876,625.42	322,783,887
මුදල් හා මුදලට සමාන දෑ	16	266,805.42	(5,539,276)
මුළු ජංගම වත්කම්		**719,854,395.97**	**673,922,282**
මුළු වත්කම්		**1,207,469,693.30**	**1,153,964,140**
ස්කන්ධ හා බැරකම්			
ස්කන්ධ			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	17	46,375,070.00	46,375,070
ප්‍රදානය - මහා භාණ්ඩාගාරය	18	14,235,750.00	15,558,800
සංචිත	18	850,604,093.13	839,423,507
මුළු ස්කන්ධ		**911,214,913.13**	**901,357,377**
ජංගම නොවන බැරකම්			
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	19	27,064,950.27	26,036,956
විලම්බිත බදු බැරකම	21	99,140,190.14	97,825,883
ජංගම නොවන මුළු බැරකම්		**126,205,140.41**	**123,862,839**
ජංගම බැරකම්			
වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ	20	161,684,529.38	100,551,323
ගෙවිය යුතු ආදායම් බදු	22	8,365,110.38	28,192,600
මුළු ජංගම බැරකම්		**170,049,639.76**	**128,743,923**
මුළු ස්කන්ධ හා බැරකම්		**1,207,469,693.30**	**1,153,964,140**

පිටු 56 සිට 73 දක්වා වූ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ඒකාබද්ධ කොටසක් වන්නේය.

මූල්‍ය ප්‍රකාශන සකස්කර ඇත්තේ 2007 අංක 7 දරන සමාගම් පනතේ අවශ්‍යතා ප්‍රකාරව බව අපි සහතික කරමු.

කළමනාකරණ අධ්‍යක්ෂ

මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කිරීම සහ ඉදිරිපත්කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිවයුතු වේ.
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලදී.

සභාපති

අධ්‍යක්ෂ

2025 අගෝස්තු 26 වැනි දින

කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලාව
ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය

වගුව – 23

මාර්තු 31න් අවසන් වසර සඳහා	ප්‍රකාශිත ප්‍රාග්ධනය (රු.)	මහා භාණ්ඩාගාරය (රු.)	ප්‍රාග්ධන සංචිත (රු.)	රඳවාගත් ලාභය (රු.)	එකතුව (රු.)
2023 මාර්තු 31 දිනට ශේෂය	**46,375,070.00**	**16,881,850.00**	**600,000.00**	**821,103,707.45**	**884,960,627.45**
වසර සඳහා ශුද්ධ ලාභය	-	-	-	55,574,507.21	55,574,507.21
වෙනත් විස්තීරණ ආදායම				25,079,146.40	25,079,146.40
ප්‍රදානය ක්‍රමක්ෂය		(1,323,050.00)			(1,323,050.00)
ගෙවූ ලාභාංශ				(30,000,000.00)	(30,000,000.00)
බීසීසී ලංකා වෙතින් ලියා හරින ලද ලැබිය යුතු පොලිය				(31,574,327.25)	(31,574,327.25)
හඳුනාගනු ලැබූ ලැබිය යුතු කුලී අත්තිකාරම වියදමක් ලෙස				(320,126.50)	(320,126.50)
පෙර වර්ෂ සඳහා හඳුනාගත් ගෙවිය යුතු කුලිය				-1,039,400.00	-1,039,400.00
2024 මාර්තු 31 දිනට ශේෂය	**46,375,070.00**	**15,558,800.00**	**600,000.00**	**838,823,507.31**	**901,357,377.31**
වර්ෂය සඳහා ශුද්ධ ලාභය				(8,307,320.48)	(8,307,320.48)
වෙනත් විස්තීරණ ආදායම				23,268,136.97	23,268,136.97
ප්‍රදානය ක්‍රමක්ෂය		(1,323,050.00)			(1,323,050.00)
2022 ඔක්තෝබර් සිට2024 මාර්තු දක්වා කාල සීමාව වෙනුවෙන් ගෙවිය යුතු ස.ආ.දා.බ.				(1,898,699.53)	(1,898,699.53)
2019-2024 වර්ෂ සඳහා හඳුනා ගැනීමට නියමිත මුල් ග්‍රැචුවේ ඇසුරුම් සැඳීමේ පිරිවැය				(1,514,947.61)	(1,514,947.61)
2019-2024 මූල්‍ය වර්ෂ සඳහා හඳුනාගනු ලැබූ සුබසාධන මොඩියුලයේ ක්ෂය				(366,583.16)	(366,583.16)
2025 මාර්තු 31 දිනට ශේෂය	**46,375,070.00**	**14,235,750.00**	**600,000.00**	**850,004,093.49**	**911,214,913.49**

පිටු 56 සිට 73 දක්වා වූ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ඒකාබද්ධ කොටසක් වන්නේය.

කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලාව

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

වගුව – 24

මාර්තු 31ත් අවසන් වසර සඳහා	සටහන	2025 (රු.)	2024 (රු.)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල්			
බදුකරණයට පෙර ශුද්ධ ලාභය/(අලාභය)		(7,170,873)	69,391,212
ගැලපීම්:			
ලියා හරින ලද ගෙවිය යුතු දෑ		-	-
ක්ෂයවීම		55,458,574	52,419,731
විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය සඳහා ප්‍රතිපාදනය		5,194,089	5,007,227
ලියා හළ බැහැර කිරීම්		264,581	-
පොලී ආදායම		(25,740,079)	(32,494,112)
ජීවවිද්‍යාත්මක වත්කම් ක්ෂයවීම		468,063	213,238
බොල් හා අඩමාන ණය		-	
පොලී වියදම්		-	
ප්‍රදානය ක්‍රමක්ෂය		(1,323,050)	(1,323,050)
පෙර වසරේ ගැලපුම		(1,881,531)	(1,359,527)
කාරක ප්‍රාග්ධන විචලනයට පෙර මෙහෙයුම් ලාභය/(අලාභය)		**25,269,775**	**91,854,720**
භාණ්ඩ ලේඛන (වැඩිවීම) / අඩුවීම		(24,398,279)	77,359,838
බීසීසී ලංකා සමාගමෙන් ලැබිය යුතු දෑ (වැඩිවීම)/ අඩුවීම		-	20,000,000
වෙළඳ සහ අනෙකුත් අයවිය දෑ (වැඩිවීම)/අඩුවීම		(2,309,218)	(23,942,527)
වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු වැඩිවීම/ (අඩුවීම)		61,133,206	(13,898,441)
මෙහෙයුම්වලින්/ (භාවිතා කරනු ලැබූ) උත්පාදිත මුදල්		**59,695,485**	**151,373,590**
ගෙවන ලද පාරිතෝෂික		(5,903,399)	(3,135,759)
ගෙවන ලද බදු		(29,621,689)	(77,600,346)
ගෙවන ලද සමාජ ආරක්ෂණ දායකත්ව බදු		(1,898,700)	
ගෙවන ලද පොලිය		-	
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ ලාභය/ (භාවිතා කළ)		**22,271,697**	**70,637,484**
ආයෝජන ක්‍රියාකාරකම්වලින්/(භාවිතා කළ) මුදල් ප්‍රවාහ			
දේපල, පිරියත හා උපකරණ අත්කර ගැනීම		(22,979,683)	(28,166,158)
නොනිම් ප්‍රාග්ධන වැඩ මත ආයෝජනය		(2,293,363)	(2,717,895)
ජීව විද්‍යාත්මක වත්කම් අත්කර ගැනීම		(3,514,112)	(2,615,536)
ජීව විද්‍යාත්මක වත්කම් බැහැර කිරීම		-	-
ලැබුණු පොලිය		36,414,279	36,338,358
මූල්‍ය වත්කම්වල ශුද්ධ වෙනස්කම්		(24,092,738)	(216,180,784)
ආයෝජන ක්‍රියාකාරකම්වලින්/(භාවිතා කළ) ශුද්ධ මුදල් ප්‍රවාහ		**(16,465,617)**	**(213,342,014)**
මූල්‍යක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල්/ (භාවිතා කළ)			
ණය හා ණය ගැනීම් ආපසු ගෙවීම			
මහා භාණ්ඩාගාරය වෙත ගෙවූ ලාභාංශය		-	(30,000,000)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ /(භාවිතා කළ)		**-**	**(30,000,000)**
මුදල් හා මුදලට සමාන දේවල ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)		5,806,080	(172,704,530)
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදලට සමාන දේ		(5,539,275)	167,165,254
වසර අවසානයේදී මුදල් සහ මුදලට සමාන දේ	16	**266,805**	**(5,539,275)**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් – ගිණුම්කරණ ප්‍රතිපත්ති

2025 මාර්තු 31න් අවසන් වසර සඳහා

01. වාර්තාකරණ අස්තිත්වය

1.1 සංස්ථාමය තොරතුරු

සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ 1992 සැප්තැම්බර් 30 දින සංස්ථාගත කරන ලද සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ 2009 ජූනි 16 වන දින යළි ලියාපදිංචි කරන ලද ඇපයෙන් සීමිත වූ, ශ්‍රී ලංකාව නිත්‍ය වාසස්ථානය වන සමාගමකි.

සමාගමේ ලියාපදිංචි කාර්යාලය අංක 53, රත්නායක මාවත, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයෙහි පිහිටා තිබේ.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම වනුයේ තේ වගාකිරීම සහ නිෂ්පාදනය සහ තේ වගාකරුවන්ගෙන් සහ තමන්ටම අයත් වතුයායයලින් මිලදී ගත් තේ අලෙවි කිරීමයි.

1.3 අධ්‍යක්ෂවරු

2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය මේ සමග ඉදිරිපත් කරයි. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ.

2025 මාර්තු 31 දිනට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වූයේ,

එස්. එස්. සමරසිංහ මයා - (සභාපති)

ආර්. ඒ. එස්. කේ. රණසිංහ මයා

ඩී. එම්. එම්. දිසානායක මිය

එල්. එම්. කොඩිප්පිලි මයා

කේ. කේ. එස්. මල්වත්ත මයා

ඒ. ඒ. විල්සන් මයා

පී. ඩී. එස්. ඒ. ගුණසේකර මයා

ඩබ්. ජී. ආර්. ඩී. විමලරත්න් මයා

1.4 සමාගමේ ලේකම්වරු

පී ආර් සෙක්‍රටේරියල් සර්විසස් (පුද්ගලික) සමාගම
59, ග්‍රෙගරි පාර,
කොළඹ -07.

1.5 ලියාපදිංචි කාර්යාලය

අංක. 53, රත්නායක මාවත,
පැලවත්ත,
බත්තරමුල්ල.

1.6 විගණකවරු

විගණකාධිපති,
ජාතික විගණන කාර්යාලය,
අංක 306/72,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

1.7 මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට බලය පැවරූ දිනය

2025 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගමේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා 2025 අගෝස්තු මස 26 වැනි දින අධ්‍යක්ෂවරුන් විසින් බලය පවරන ලදී.

02. පොදු ප්‍රතිපත්ති

2.1 පිළියෙළ කිරීමේ පදනම

කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගමේ මූල්‍ය ප්‍රකාශන මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, විස්තිරණ ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, සහ ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වලින් සමන්විත වේ. මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් පනවා ඇති ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (LKAS and SLFRS) අනුකූලව පිළියෙළ කර ඇත.

2.2 මැනීමේ පදනම

අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකමට අදාළව යෝග්‍ය හෙළිදරව් කිරීම් සිදුකර ඇති අවස්ථාවන්හි හැර මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇත්තේ ඓතිහාසික පිරිවැය පදනමිනි. වත්කම් සහ බැරකම් ඒවායේ සාපේක්ෂ ද්‍රවශීලතාව නිරූපණය කරන පරිදි ස්වභාවය අනුව කාණ්ඩ ගත කර තිබේ.

මූල්‍ය ප්‍රකාශනයන්හි හඳුනාගෙන ඇති ප්‍රමාණ මත වඩාත්ම සැලකිය යුතු බලපෑමක් ඇතිකරන ගිණුම්කරණ ප්‍රතිපත්ති ආදේශ කිරීමේදී වැදගත් ඇස්තමේන්තු ක්ෂෙත්‍ර, අවිනිශ්චිතතාව සහ තීරණාත්මක තීන්දු පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන්වල ඇතුලත් කර තිබේ.

2.3 බදුකරණය

(අ) ජංගම බදු

මූල්‍ය ප්‍රකාශ වල වාර්තා කර ඇති පරිදි ආදායම් බදු සඳහා ප්‍රතිපාදන පදනම්ව ඇත්තේ ආදායම් සහ වියදම් මූලිකාංග මත වන අතර 2006 අංක 10දරන දේශීය ආදායම් පනතේ සහ එහි තදනන්තර සංශෝධනයන්හි විධිවිධාන ප්‍රකාරව ගණනය කර ඇත.

(ආ) විලම්භිත බදු

බැරකම් ක්‍රමවේදය යොදා ගනිමින් විලම්බිත බදු සපයනු ලැබ ඇත්තේ මූල්‍ය වාර්තාකරණ කාර්යය සහ බදු කාර්යය සඳහා භාවිතා කරනු ලැබූ මුදල් ප්‍රමාණ සඳහා වත්කම් සහ බැරකම්වල ධාරණ අගයන් තාවකාලික වෙනස්කම් සඳහා විධිවිධාන සලස්වමිනි. විලම්බිත බදු මනිනු ලබන්නේ වාර්තාකරණ දිනය වන විට පනවා ඇති නීති මත පදනම්ව, තාවකාලික වෙනස්කම් ප්‍රත්‍යාවර්තනය කළ විට ඒවාට ආදේශ කිරීමට අපේක්ෂා කරනු ලබන බදු අනුපාතයටය.

විලම්භිත බදු වත්කම් පිළිගනු ලබනුයේ එම කාල අන්තරවලට සාපේක්ෂව ප්‍රයෝජනයට ගනු ලැබිය හැකි අනාගත බදු අය කළ හැකි ලාභ පැවතීමේ සම්භාවිතාවක් ඇති ප්‍රමාණයටය. විලම්බිත බදු වත්කම් එක් එක් වාර්තාකරණ දිනයට සමාලෝචනය කරනු ලබන අතර ආශ්‍රිත බදු ප්‍රතිලාභ සාක්ෂාත් කර ගැනීමේ ඉඩක් තවදුරටත් නොමැතිවීමේ ප්‍රමාණයට අඩු කරනු ලැබේ.

2.4 වත්කම් තක්සේරු කිරීම හා ඒවායේ මැනීමේ පදනම

2.4.1 දේපළ, පිරියත හා උපකරණ

දේපළ, පිරියත හා උපකරණ ප්‍රකාශ කරනු ලබන්නේ සමුච්චිත ක්ෂයවීම් සහ වටිනාකමේ කිසියම් හානියක් වේ නම් එය අඩු කර පිරිවැයට හෝ සාධාරණ අගයටය. සිදුවීම් හෝ තත්ත්වයන් වෙනස්වීම් මගින් ධාරණ අගය යළි අයකර ගත නොහැකි බව පෙන්නුම් කරන අවස්ථාවන්හිදී දේපළ, පිරියත හා උපකරණවල ධාරණ අගයේ හානිවීම් සඳහා සමාලෝචනය කරනු ලැබේ. සියලු දේපළ, පිරියත හා උපකරණ අයිතම මුලින්ම වාර්තා කර ඇත්තේ පිරිවැයටය. දේපළ, පිරියත හා උපකරණ තදනන්තරව ප්‍රත්‍යාගණනය කර ඇති විටදී, එබඳු වත්කම්වල සමස්ත කාණ්ඩයම සාධාරණ අගයන්ට ප්‍රත්‍යාගණනය කරනු ලැබේ. මෙම ප්‍රත්‍යාගණනය කිරීම් ප්‍රමාණවත් නිත්‍යතාවකින් සිදු කරනු ලැබේ. වත්කමක් ප්‍රත්‍යාගණනය කළ විට ධාරණ අගයේ කිසියම් වැඩිවීමක්, පෙර විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගෙන ඇති එම වත්කමෙම ප්‍රත්‍යාගණන අඩුවීමක් එය ප්‍රතිවර්තනය කරන්නා වූ අවස්ථාවක හැර එය ප්‍රත්‍යාගණන සංචිතයට සෘජුවම බැර කරනු ලැබේ. එකම වත්කමෙහි පෙර අතිරික්තයක් හිලව් කරන්නා වූ යම් ප්‍රත්‍යාගණන හිඟයක්, ප්‍රත්‍යාගණන සංචිතයේ අතිරික්තයට සෘජුවම හිලව් කරන අතර යම් අතිරික්තයක් වේ නම් එය විදයදමක් ලෙස පිළිගනු ලැබේ

බැහැර කිරීමේදී විකුණනු ලැබූ වත්කමට අදාළ කිසියම් ප්‍රත්‍යාගණන සංචිතයක් වේ නම් එය රඳවාගත් ඉපැයුම්වලට පවරනු ලැබේ. යම් දේපළ, පිරියත හෝ උපකරණ අයිතම ප්‍රතිස්ථාපනය කිරීමේදී හෝ බැහැර කිරීමේදී හෝ ඒවායේ භාවිතය මගින් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන්නේ නම් ඒවා ඉවත් කරනු ලැබූ සේ සැලකේ. එසේ වත්කම් ඉවත් කිරීම හේතුවෙන් ඇතිවන කිසියම් ලාභයක් හෝ පාඩුවක් එලෙස ඉවත් කිරීම සිදු කළ වර්ෂයේ ආදායම් ප්‍රකාශනයට ඇතුළු කරනු ලැබේ.

(අ) ක්ෂයවීම

පිරිවැය මත සරල රේඛීය ක්‍රමය භාවිතා කිරීම මගින් හෝ සින්නක්කර ඉඩම් හැර අනෙකුත් සියලු දේපළ, පිරියත සහ උපකරණ තක්සේරු කිරීම මගින් එම වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය තුළ එම ප්‍රමාණ පොත්වලින් ඉවත් කිරීම පිණිස, ක්ෂයවීම් සඳහා වූ ප්‍රතිපාදන ගණනය කරනු ලබයි. වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය පහත දැක්වෙන පරිදි වේ;

වගුව – 25

වත්කම් කාණ්ඩය	අවුරුදු
ගොඩනැගිලි	20
ජලය හා විදුලිය	20
රථ වාහන	4
පිරියත හා යන්ත්‍රෝපකරණ	8
උපකරණ	8
ලී බඩු හා සවිකුරු	8
පරිසනක උපකරණ	8
මාර්ග	10
වෙනත්	8
ජීව විද්‍යාත්මක වත්කම් (තේ)	30

සින්නක්කර ඉඩම් සඳහා අසීමිත ආයු කාලයක් ඇතැයි සලකන බැවින් ඒවා ක්ෂය කරනු නොලැබ

සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය සහ අවශිෂ්ඨ වටිනාකම සමාලෝචනය කර අවශ්‍ය නම් ගලපනු ලැබේ.

(ආ) ප්‍රතිසංස්කරණ පිරිවැය

මුලින්ම තක්සේරු කළ කාර්යසාධන ප්‍රමිතියෙන් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ ප්‍රකෘතිමත් කිරීම හෝ පවත්වාගෙන යාම පිණිස දේපළ, පිරියත හා උපකරණ අළුත්වැඩියාව හෝ නඩත්තුව සඳහා දැරූ වැය, එලෙස දැරූ විටදී වියදමක් ලෙස පිළිගනු ලැබේ.

2.4.2 ජීව විද්‍යාත්මක වත්කම්

සමාගම ජීව විද්‍යාත්මක වත්කම් හඳුනාගනු ලබන්නේ පිරිවැය පදනමෙනි. සමාගමේ ජීව විද්‍යාත්මත වත්කම් කළුබෝවිටියාන සහ දෑරංගල කර්මාන්ත ශාලාවල ඇති තේ පඳුරුවලින් සමන්විත වේ. සමගම පැල අවරුදු 3 දක්වා නොමේරූ ලෙස ද අවුරුදු 3 ට වඩා වැඩි පඳුරු මේරූ ලෙස ද පිළිගනියි.

2.4.3 මූල්‍ය වත්කම් (ව්‍යුත්පන්න නොවන)

සමාගම මුලින්ම ණය සහ ලැබිය යුතු දෑ සහ තැන්පතු ඒවා උත්පාදනය කරනු ලැබූ දිනයට හඳුනාගනු ලබයි. අනෙකුත් සියලු මූල්‍ය වත්කම් (ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමට නිශ්චය කරනු ලැබූ වත්කම් ඇතුළුව) සාධන පත්‍රයේ ගිවිසුම්කර ප්‍රතිපාදනයන්ට සමාගම පාර්ශවයක් වූ වෙළඳ දිනයට මුලින්ම පිළිගනු ලැබේ.

මුදල් ප්‍රවාහය වෙත වත්කමෙහි ගිවිසුම්කර හිමිකම් අවසන් වන විටදී හෝ මූල්‍ය වත්කමේ හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ පාරිතෝෂ සැලකිය යුතු ලෙස පවරනු ලබන ගනුදෙනුවක මූල්‍ය වත්කම් මත ගිවිසුම්කර මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතින් එය පවරන විටදී සමාගම මූල්‍ය වත්කමක හඳුනාගැනීම ඉවත් කරයි. සමාගම විසින් නිර්මාණය කරනු ලබන හෝ රඳවාගනු ලබන පවරනු ලැබූ මූල්‍ය වත්කම්වල කවර හෝ බැඳීමක් වෙනම වත්කමක් හෝ බැරකමක් ලෙස හඳුනාගනු ලබයි.

මූල්‍ය වත්කම් වර්ගීකරණය කිරීමේ කාර්යය සඳහා, සමාගමේ මූල්‍ය වත්කම් තක්සේරු කිරීම මුල් යෙදුමේ දිනය වන 2020 අප්‍රේල් 01 දිනට සිදුකරනු ලැබ ඇති අතර අනතුරුව 2020 අප්‍රේල් 01 දිනට පෙර හඳුනාගැනීම අත් නොහරිනු ලැබූ මූල්‍ය වත්කම් වෙත අතීතයට බලපාන පරිදි ආදේශ කරනු ලැබේ. ණය සාධනපත්‍ර මත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ තනිකරම සමන්විත වනුයේ මුල් මුදල සහ පොළියෙන් ද යන්න ඇගයීම සිදු කරනු ලැබුයේ වත්කම්වල මුල් පිළිගැනීමේදී පැවැති කරුණු සහ අවස්ථානුගත තත්ත්වයන් මත පදනම්වය. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 9 හි වර්ගීකරණ සහ මැනීමේ අවශ්‍යතා, සමාගමේ ප්‍රතිඵල සහ මූල්‍ය තත්ත්වය මත ප්‍රමාණාත්මක බලපෑමක් සිදු නොකරන අතර එබැවින් සමාගම පෙර කාල සීමාවන් සඳහා සංසන්දනාත්මක තොරතුරු නැවත ප්‍රකාශ කර නොමැත.

සමාගම සතුව පහත දැක්වෙන මූල්‍ය වත්කම් තිබේ (ව්‍යුත්පන්න නොවන):

- ණය හා ලැබිය යුතු දේ
- මුදල් හා මුදලට සමාන දේ

(අ) ණය හා ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ යනු සක්‍රීය වෙළඳපොළක මිල ගණන් ඉදිරිපත් කර නොමැති ස්ථාවර සහ නිශ්චයනීය ගෙවීම් සහිත මූල්‍ය වත්කම් වේ. එබඳු වත්කම් මුලින්ම සාධාරණ අගය සහ සෘජුව ආරෝපණය කළ හැකි කිසියම් ගනුදෙනු පිරිවැයකට පිළිගනු ලැබේ. මූලික පිළිගැනීමට තදනන්තරව, ණය හා ලැබිය යුතු දෑ ගණනය කරනු ලබන්නේ යම් හානිකරණ අලාභ අඩුකොට සඵල පොළි ක්‍රමවේදය භාවිතා කරමින් ක්‍රමක්ෂිත පිරිවැයටය. ණය සහ ලැබිය යුතු දෑ වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෙයින් සමන්විත වේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් – ගිණුම්කරණ ප්‍රතිපත්ති

2025 මාර්තු 31වන් අවසන් වසර සඳහා

(ආ) මුදල් හා මුදල් සමාන දෑ

මුදල් ප්‍රවාහ පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශයන්හි, මුදල් හා මුදලට සමාන දෑ මුදල් ශේෂ හා මාස තුනක් හෝ ඊට අඩු මූලික කල්පිරීමක් සහිත ඒක්ෂණ තැන්පතුවලින් සමන්විත වේ. ඉල්ලුම මත ආපසු ගෙවිය හැකි සහ සමාගමේ මුදල් කළමනාකරණයේ අනුකලන කොටසක් වන්නාවූ බැංකු අයිරා මුදල් හා මුදලට සමාන දේවල සංරචකයක් ලෙස මුදල් ප්‍රවාහයන්හි කාර්යය සඳහා අන්තර්ගත කොට ඇත. මුදල් හා මුදලට සමාන දෑ අතැති මුදල් හා බැංකුවේ තැන්පතුවලින් සමන්විත වේ. වක්‍ර ක්‍රමවේදය භාවිතා කරමින් සකස් කොට ඇති මුදල් ප්‍රවාහයන්හි කාර්යය සඳහා මුදල් හා මුදලට සමාන දෑ සංරචකයක් ලෙස බැංකු අයිරා අන්තර්ගත කොට ඇත.

2.4.4 හානිකරණය

ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයක් දරනු නොලබන මූල්‍ය වත්කමක්, එය හානිවූ බවට වාස්තවික සාක්ෂි තිබේදැයි නිර්ණය කිරීම සඳහා එක් එක් වාර්තාකරණ දිනයට තක්සේරු කරනු ඇත.

වත්කමේ මූලික පිළිගැනීමෙන් පසු අලාභ සිදුවීමක් සිදුව ඇති බවට වාස්තවික සාක්ෂි මගින් පෙන්නුම් කරන්නේ නම් සහ විශ්වාසනීය ලෙස මිණිය හැකි එම වත්කමේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්ට නිශේධනීය බලපෑමක් එම අලාභ සිදුවීම ඇති කළේ නම් මූල්‍ය වත්කමක් හානිවී ඇත.

ලැබිය හැකි දේ සඳහා හානි පිළිබඳ සාක්ෂි සමාගම සාමූහික මට්ටමේදී සලකා බලයි. සමාන අවදානම් ගතිලක්ෂණ සහිත ලැබිය හැකි සියලු දේ එකට කාණ්ඩ කරන අතර සිදුව ඇති එහෙත් මෙතෙක් හඳුනාගෙන නොමැති කිසියම් හානියක් සඳහා සාමූහිකව තක්සේරු කරනු ඇත.

ක්‍රමක්ෂිත පිරිවැයට මනිනු ලබන මූල්‍ය වත්කමකට අදාළ හානි අලාභයක් එහි ධාරණ වටිනාකම හා වත්කමේ මුල් සඵල පොලී අනුපාතයට වට්ටම් කරනු ලැබූ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි වත්මන් වටිනාකම අතර වෙනස ලෙස ගණනය කරනු ලැබේ. අලාභවීම් ලාභ හෝ පාඩුවල පිළිගනු ලබන අතර ලැබීම්වලට සාපේක්ෂව දීමනා ගිණුමක පෙන්නුම් කරනු ලැබේ. හානිවූ වත්කමක් මත පොලිය, වට්ටම අනාගතයට ගැලපීම හරහා අඛණ්ඩව පිළිගනු ලැබේ. පසුව ඇතිවන සිදුවීමක් හානි අලාභ වටිනාකම අඩුකිරීමට හේතුවන්නේ නම්, ලාභ හෝ පාඩු හරහා හානි අලාභයේ අඩුවීම ප්‍රතිවර්තනය කරනු ලැබේ.

2.4.5 වට්ටෝරු භාණ්ඩ

වට්ටෝරු භාණ්ඩ පිරිකසන ලද, පිරිනොසකසනලද අර්ධ පිරිසකසන ලද කෘෂිකාර්මික නිෂ්පාදන සහ අනෙකුත් පාරිභෝජ්‍ය ද්‍රව්‍ය වලින් සමන්විත වේ. පිරිසකසන ලද, පිරිනොසකසනලද සහ අර්ධ පිරිසකසන ලද කෘෂිකාර්මික නිෂ්පාදන මූල්‍ය කාල සීමාව අවසානයේදී පූර්ණව පිරිසකසන ලද කෘෂිකාර්මින නිෂ්පාදන සේ සලකනු ලබන අතර ශුද්ධ උපලබ්ධි කළ හැකි අගයට තක්සේරු කරනු ලැබේ.

අනෙකුත් පාරිභෝජ්‍ය ද්‍රව්‍ය තක්සේරු කර ඇත්තේ වඩා අඩු පිරිවැයට සහ උපලබ්ධි කළ අගයටය. වට්ටෝරු භාණ්ඩ විකිණීමේදී, එම වට්ටෝරු භාණ්ඩවල ධාරණ මුදල අදාළ ආදායම පිළිගනු ලැබූ කාල සීමාවේ වියදමක් ලෙස සමාගම පිළිගනු ලබයි.

2.5 බැරකම් හා ප්‍රතිපාදන

අතීත සිදුවීමකින් මතුවන වත්මන් බැඳීමක් පියවීමේදී ආර්ථික ප්‍රතිලාභ මූර්තිමත් කරමින් සම්පත් ගලායාමක් එහි ප්‍රතිඵලය වේ යැයි අපේක්ෂා කරනු ලබන විටදී මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ බැරකම් පිළිගනු ලැබේ. ණයකරු ඉල්ලා සිටි විටදී හෝ වාර්තාකරණ දිනයේ සිට වසරක් තුළ ගෙවිය යුතු බැඳීම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම බැරකම් ලෙස සලකනු ලැබේ. මූල්‍ය තත්ත්වය දිනයේ සිට එක් වසරකට පසුව ගෙවිය යුතු බැරකම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් සේ සලකනු ලැබේ.

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස නෛතික හෝ සම්මුතික බැඳීමක් සමාගම සතු විටදී සහ එම බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමේ හැකියාවක් ඇති හා ඒ සඳහා විශ්වාසය තැබිය හැකි ඇස්තමේන්තුවක් සෑදිය හැකිවීම අවශ්‍ය කරනු ලබන විටකදී මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ ප්‍රතිපාදනයක් පිළිගනු ලැබේ.

2.5.1 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

(අ) නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම – පාරිතෝෂිකය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 'ආයුගණක තක්සේරුව අනුව විශ්‍රාම ප්‍රතිලාභ' අනුකූලව සේවා නියුක්තියේ පළමු වසරේ සිට විශ්‍රාම ප්‍රතිලාභ වෙනුවෙන් පූර්ණ ප්‍රතිපාදනයක් සලසා ඇත.

විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් නිර්ණය කිරීමේදී භාවිතා කරනු ලබන වැදගත් උපකල්පනයන්ට පහත දෑ ඇතුලත් වේ.

ආබාධිතබව: මර්ත්‍යතා වගුවෙන් 10%

කාර්යමණ්ඩල පිරිවැටුම් අනුපාත : වයස අවුරුදු 54 දක්වා සියලු දෙනාට 13.00% සහ ඉන් අනතුරුව ශූන්‍ය වේ.

සාමාන්‍ය විශ්‍රාම ගැනීමේ වයස: අවුරුදු 60 (නිශ්චිත විශ්‍රාම වයසට වඩා වැඩි සේවකයන් ඔවුන්ගේ ඊළඟ උපන් දිනයට විශ්‍රාම යන්නා සේ උපකල්පනය කරනු ලැබේ.)

වට්ටම් අනුපාතය : වාර්ෂිකව 10.50%

වැටුප් උද්ගමන අනුපාත: මූලික වැටුප: කාර්ය මණ්ඩලය වසරකට 8.50%. දත්තවල නිශ්චිතව දක්වා ඇති මාසයට සෑම වසරකම වැටුප් වර්ධක ලැබීමට නියමිතය.

මූලික වැටුප: දෛනික වැටුප්ලාභී සේවකයන්: වසරකට 8.50%, මීළඟ වැටුප් වර්ධකය සෑම වසරකම අප්‍රේල් මස ලැබීමට නියමිතය.

දීමනා: අදාළ නොවේ.

විශ්‍රාම පාරිතෝෂික සූත්‍රය: කාර්ය මණ්ඩලය: යටත් පිරිසෙයින් 5 වසරක සේවා කාලයක් ඇති අය සඳහා සේවයේ සම්පූර්ණ කළ සෑම වසරක් සඳහාම මාස භාගයක වැටුප

දෛනික වැටුප්ලාභී සේවකයන්: යටත් පිරිසෙයින් 5 වසරක සේවා කාලයක් ඇති අය සඳහා සේවයේ සම්පූර්ණ කළ සෑම වසරක් සඳහාම දින 14ක වැටුප.

(ආ) නිර්වචිත දායකත්ව සැලැස්ම - සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල

අදාල ප්‍රඥප්ති සහ නියමයන් ප්‍රකාරව සේවකයින් සේවක අර්ථසාධක අරමුදල් දායක මුදල් සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලේ දායක මුදල් වලට සුදුසුකම් ලබයි.

2.6 විස්තිරණ ආදායම් ප්‍රකාශනය

2.6.1 ආදායම හඳුනාගැනීම

ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ගලා ඒමට ඉඩ ඇති සහ දරන ලද හෝ දැරීමට නියමිත ආදායම සහ ආශ්‍රිත පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකි ප්‍රමාණයට ආදායම හඳුනාගනු ලැබේ. ලැබුණු ප්‍රතිඵාව හෝ විකුණුම් වට්ටම හෝ විකුණුම් බදු නොමැතිව ලැබිය යුතු දේවල සාධාරණ වටිනාකමට ආදායම ගණනය කරනු ලැබේ.

(අ) භාණ්ඩ විකිණීම

හිමිකාරිත්වය හා සාමාන්‍යයෙන් සබැඳුණු ප්‍රමාණයට අඛණ්ඩ කළමනාකාරිත්ව මැදිහත්වීමක් හෝ විකුණන ලද භාණ්ඩ පිළිබඳ සඵල පාලනයක් සමාගම විසින් රඳවා නොගන්නා විට හා භාණ්ඩවල හිමිකාරිත්වයේ සැලකිය යුතු අවදානම් සහ පරිදාන ගැනුම්කරුට පවරා ඇති විටදී භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම පිළිගනු ලැබේ.

(ආ) ලාභ හා අලාභ

දේපල, පිරියත උපකරණ හා ආයෝජන ඇතුළුව වෙනත් ජංගම නොවන වත්කම් අපහරණය කිරීමේදී පැන නගින ආදායම් ස්වභාවයේ ශුද්ධ ලාභ අලාභ ඒ සඳහා අපරහණය මත ලැබෙන මුදල් වලින්, එවන් වත්කම්හි ධාරණ මුදල හා ආශ්‍රිත විකුණුම් වියදම්වලින් අඩු කිරීමෙන් පසු ආදායම් ප්‍රකාශයේ ගණන් දක්වා ඇත. ප්‍රධාන ආදායම් උත්පාදන ක්‍රියාකාරකම්වලට ආනුෂංගික ක්‍රියාකාරම්වලින් පැන නගින හා ද්‍රව්‍යමය නොවන සමාන ගනුදෙනු කාණ්ඩයකින් පැන නගින ලාභ හා අලාභ ශුද්ධ පදනමකින් එකතු කොට, වාර්තා කොට ඉදිරිපත් කරනු ලැබේ.

සහතික කරන ලද කුලී මුදල්වලින් මතුවන කිසියම් අලාභයක් එම අලාභය සිදුවූ වසරේදීම ගිණුම්වල දක්වනු ලැබේ. හොඳම ඇස්තමේන්තුව අලාභයක් පෙන්නුම් කරන්නේ නම් ප්‍රතිපාදනයක් පිළිගනු ලැබේ.

(ඇ) පොලී ආදායම

සඵල පොලී ක්‍රමවේදය භාවිතා කරමින් උපචිත පදනමකින් පොලී ආදායම පිළිගනු ලැබේ.

(ඈ) වෙනත් ආදායම

සඵල පොලී ක්‍රමවේදය භාවිතා කරමින් අනිකුත් ආදායම් උපචිත පදනමකින් පිළිගනු ලැබේ.

2.6.2 වියදම හඳුනාගැනීම

ආදායම් ප්‍රකාශනයේ වියදම් හඳුනාගනු ලබන්නේ දරන ලද පිරිවැය සහ නිශ්චිත ආදායම් අයිතම වල ඉපැයීම් අතර සෘජු සම්බන්ධය පදනම් කර ගෙනය. එලදායී අන්දමින් ව්‍යාපාරය පවත්වා ගෙන යාමට සහ දේපල, පිරියත හා උපකරණ නඩත්තු කිරීමට දරන ලද සියලු වියදම් විස්තිරණ ආදායම් ප්‍රකාශයට ඇතුළත් කර තිබේ. විස්තිරණ ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා, සමාගමේ කාර්ය සාධනයේ මූලිකාංග සාධාරණව ඉදිරිපත් කරන්නේය යන පදනමින් "වියදමේ ශ්‍රිතය" ක්‍රමවේදය යොදා ගෙන ඇත.

2.7 කොටසක් සඳහා මූලික ඉපැයුම්/ (අලාභය)

තම සාමාන්‍ය කොටස් සඳහා සමාගම කොටසක් සඳහා මූලික ඉපැයුම් / (අලාභ) දත්ත ඉදිරිපත් කරයි. කොටසක් සඳහා දත්ත ගණනය කරනු ලබන්නේ සමාගමේ සාමාන්‍ය කොටස් හිමියන්ට ආරෝපණීය ලාභය හෝ පාඩුව අදාළ කාල සීමාවේ නොපියවූ සාමාන්‍ය කොටස් සංඛ්‍යාවේ භරිත සාමාන්‍යයයෙන් බෙදීම මගිනි.

2.8 සන්සන්දනාත්මක තොරතුරු

ප්‍රවර්තන කාල සීමාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවබෝධය ඉහළ නැංවීම හා අන්තර් කාලසීමා සංසන්දනීයභාවය වැඩි දියුණු කිරීම පිණිස මූල්‍ය ප්‍රකාශනයන්හි වාර්තා කර ඇති සියලු වටිනාකම් සඳහා පෙර කාල සීමාවට අදාළ ප්‍රමාණාත්මක, ආඛ්‍යාන හා විස්තරාත්මක තොරතුරු ඇතුළුව සංසන්දනාත්මක තොරතුරු හෙළිදරව් කරනු ලැබේ. මූල්‍ය ප්‍රකාශනයන්හි අයිතම ඉදිරිපත් කිරීම හෝ වර්ගීකරණය සංශෝධනය කර ඇති විටදී, වඩා හොඳ ඉදිරිපත් කිරීමක් සැපයීම පිණිස ප්‍රවර්තන වසර සමග අනුකූලවීම පිණිස සංසන්දනාත්මක වටිනාකම් ද නැවත වර්ගීකරණය කර ඇත.

2.9 වාර්තාකරණ දිනයට පසුව සිදුවන සිදුවීම්

මූල්‍ය තත්වය පිළිබඳ සියලු ප්‍රමාණාත්මක පශ්චාත් ශේෂ පත්‍ර සිදුවීම් සලකා බලන ලද අතර උචිත අවස්ථාවන්හිදී මූල්‍ය ප්‍රකාශනයන්හි අදාළ සටහන්වල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් සිදු කර ඇත.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2025 මාර්තු 31න් අවසන් වසර සඳහා

3. ආදායම

වගුව – 26

මාර්තු 31න් අවසන් වසර සඳහා	සටහන	2025 (රු.)	2024 (රු.)
ආදායම	27.1		
දළ විකුණුම්		1,650,670,636.40	1,772,002,358
අඩුකළා: තැරැව්කාර ගාස්තු හා විකුණුම් වියදම්		(21,038,471.49)	(23,153,797)
		1,629,632,164.91	**1,748,848,561**
එකතු කළා: දේශීය විකුණුම්		48,569,693.48	53,316,457
එකතුව		**1,678,201,858.39**	**1,802,165,017**

4. විකුණුම් පිරිවැය

වගුව – 27

මාර්තු 31න් අවසන් වසර සඳහා	සටහන	2025 (රු.)	2024 (රු.)
විකුණුම් පිරිවැය	27.2		
අමු දළු මිලයට ගැනුම්		1,313,511,923.13	1,290,637,114
නිෂ්පාදන පිරිවැය		257,695,428.18	283,854,699
නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය		121,587,027.58	119,138,193
නිෂ්පාදන පිරිවැය		**1,692,794,378.89**	**1,693,630,006**
නිමි භාණ්ඩ සංචලන			
වර්ෂය ආරම්භයේදි ශේෂය		198,044,648.02	252,075,730
වර්ෂය අවසානයේදි ශේෂය		(224,223,191.87)	(198,044,648)
විකුණුම් පිරිවැය		**1,666,615,835.04**	**1,747,661,088**

5. වෙනත් ආදායම

වගුව – 28

මාර්තු 31න් අවසන් වසර සඳහා	2025 (රු.)	2024 (රු.)
කසළ තේ විකිණීමේ ආදායම	15,179,294.51	13,744,593
සුබසාධන අලෙවි සැල් ලාභ/අලාභ	6,034,658.26	27,433,545
තේ ක්ෂෙත්‍ර/ තවාන් ලාභ/අලාභ	1,256,634.03	2,263,137
වෙනත් විවිධ ආදායම්	6,229,485.30	5,085,626
ප්‍රදානය ක්‍රමක්ෂය	1,323,050.00	1,323,050
ලියා හරින ලද	2,596,031.76	-
එකතුව	**32,619,154.02**	**49,849,950**

එකතුව රු. 1,846,031.76 ක් වූ අඩමාන ණය සඳහා ප්‍රතිපාදනය ප්‍රත්‍යාවර්තනය කිරීමක් හඳුනාගනු ලැබූ අතර කළින් ගිණුම්ගත කළ බීසීසී ලංකා වෙත ගෙවිය යුත්තකට අදාළ රු. 750,000 ක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ප්‍රතිවර්තනය කරන ලදී.

6. පරිපාලන වියදම්

වගුව – 29

මාර්තු 31න් අවසන් වසර සඳහා	සටහන	2025 (රු.)	2024 (රු.)
කාර්ය මණ්ඩල පිරිවැය	6.1	40,199,814.97	25,428,153
ගමන් වියදම්, යැපීම් දීමනා හා වාහන කුලියට ගැනීම	6.2	5,859,725.47	5,200,006
නඩත්තු වියදම් – වාහන හා උපකරණ	6.3	7,912,921.85	8,375,290
ව්‍යාත්තිය ගාස්තු	6.4	1,236,554.92	2,905,099
රක්ෂණ හා බලපත්‍ර ගාස්තු	6.5	2,982,438.72	2,688,761
මුද්‍රණ, ලිපිද්‍රව්‍ය හා තැපැල් ගාස්තු	6.6	1,429,800.87	2,312,748
අනෙකුත් පරිපාලන වියදම්	6.7	16,699,523.50	16,515,383
එකතුව		**76,320,780.30**	**63,425,441**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2025 මාර්තු 31න් අවසන් වසර සඳහා

6.1 කාර්යමණ්ඩල පිරිවැය

වගුව – 30

මාර්තු 31න් අවසන් වසර සඳහා	2025 (රු.)	2024 (රු.)
කාර්ය මණ්ඩල වැටුප්	12,552,647.43	10,695,494
පාරිතෝෂික	787,813.00	1,015,969
දීමනා	7,961,333.45	6,181,575
අතිකාල හා නිවාඩු දින ගෙවීම්	726,133.48	1,305,851
සේවක අර්ථසාධක අරමුදල් දායක මුදල්	1,889,211.06	2,324,695
සේවක භාරකාර අරමුදල් දායක මුදල්	472,302.79	503,486
ප්‍රසාද දීමනා	606,596.06	1,677,800
අධ්‍යක්ෂ මණ්ඩල ගාස්තු	484,500.00	737,500
කාර්ය මණ්ඩල සුබසාධනය	910,290.20	883,784
කාර්ය මණ්ඩල අනෙකුත් පිරිවැය	13,808,987.50	102,000
එකතුව	**40,199,814.97**	**25,428,153**

6.2 ගමන් වියදම්, යැපීම් දීමනා හා වාහන කුලියට ගැනීම

වගුව – 31

මාර්තු 31න් අවසන් වසර සඳහා	2025 (රු.)	2024 (රු.)
ගමන් වියදම් හා යැපීම් දීමනා	2,169,492.14	1,585,039
කුලියට ගැනීමේ ගාස්තු	3,690,233.33	3,614,967
එකතුව	**5,859,725.47**	**5,200,006**

6.3 කාර්යාල ගොඩනැගිල්ල, උපකරණ හා වාහන නඩත්තුව

වගුව – 32

මාර්තු 31න් අවසන් වසර සඳහා	2025 (රු.)	2024 (රු.)
කාර්යාල ගොඩනැගිල්ල නඩත්තුව	386,545.00	409,481
කාර්යාල උපකරණ නඩත්තුව	1,892,894.63	1,997,939
රථ වාහන නඩත්තු වියදම්	1,613,841.47	2,571,901
වාහන ඉන්ධන වියදම්	4,019,640.75	3,395,969
එකතුව	**7,912,921.85**	**8,375,290**

6.4 වෘත්තීය ගාස්තු

වගුව – 33

මාර්තු 31න් අවසන් වසර සඳහා	2025 (රු.)	2024 (රු.)
විගණන ගාස්තු	618,000.00	700,000
අනෙකුත් වෘත්තීමය දීමනා	432,968.92	1,727,329
ලේකම් සේවා ගාස්තු	185,586.00	477,770
එකතුව	**1,236,554.92**	**2,905,099**

6.5 රක්ෂණ හා බලපත්‍ර ගාස්තු

වගුව – 34

මාර්තු 31න් අවසන් වසර සඳහා	2025 (රු.)	2024 (රු.)
රක්ෂණ හා බලපත්‍ර ගාස්තු	107,646.79	161,907
කාර්යමණ්ඩල රක්ෂණය	2,874,791.93	2,526,854
එකතුව	**2,982,438.72**	**2,688,761**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2025 මාර්තු 31න් අවසන් වසර සඳහා

6.6 මුද්‍රණ, ලිපිද්‍රව්‍ය හා තැපැල් ගාස්තු

වගුව – 35

මාර්තු 31න් අවසන් වසර සඳහා	2025 (රු.)	2024 (රු.)
මුද්‍රණ වියදම්	320,245.66	428,890
මුද්දර ගාස්තු	62,351.55	113,443
ලිපි ද්‍රව්‍ය	1,047,203.66	1,770,415
එකතුව	**1,429,800.87**	**2,312,748**

සේවකයන් තිදෙනෙකුට අදාළව කම්කරු විනිශ්චය සභා නඩුවලදී සමාගමට අවාසිදායක තීන්දු ලැබී තිබේ. 'අනෙකුත් කාර්ය මණ්ඩල පිරිවැය' තුළ ගිණුම්ගත කර ඇති මෙම අවාසිදායක තීන්දුවල මුළු මුදල රු. 13,808,987.50 කි.

6.7 අනෙකුත් පරිපාලන වියදම්

වගුව – 36

මාර්තු 31න් අවසන් වසර සඳහා	2025 (රු.)	2024 (රු.)
නෛතික ගාස්තු	447,000.00	1,148,790
ක්ෂයවීම්	5,326,729.05	4,200,716
දුරකථන	2,112,844.87	1,381,680
පුවත්පත් සහ වාර සඟරා	59,580.00	31,450
කුලිය	2,705,800.00	1,961,500
විදුලිය	1,992,383.26	2,613,521
පුවත්පත් දැන්වීම්	962,767.82	1,211,466
අනෙකුත් උපයෝගිතා සහ සේවා	1,473,958.79	1,857,166
සැපයුම් සහ භාණ්ඩ ඉල්ලීම් -වෙනත්	734,222.33	957,236
කාර්ය මණ්ඩල පුහුණුව	138,470.00	548,942
මුද්දර ගාස්තු	14,350.00	16,150
ක.තො.සේ. ගාස්තු	225,000.00	300,000
බැංකු ගාස්තු	241,836.18	286,767
ලියා හරින ලද (කරුණාකර පාදක සටහන බලන්න)	264,581.20	-
එකතුව	**16,699,523.50**	**16,515,383**

නැවත පැල සිටුවීමේ වැඩසටහනක් හේතුවෙන් මූල්‍ය වර්ෂය තුළදී කළුබෝවිටියාන කර්මාන්ත ශාලාවේ පොත්වලින් අස්කරන ලද තේ පඳුරුවල ලියා හළ අගය රු. 265,581.00 කි. මෙකී වත්කම් ඉවත්කිරීම පිළිබිඹු කරමින් මෙම මුදල වියදමක් ලෙස හඳුනාගෙන ඇත.

7. විකුණුම් හා බෙදාහැරීම් වියදම්

වගුව – 37

මාර්තු 31න් අවසන් වසර සඳහා	2025 (රු.)	2024 (රු.)
වෙළඳ සල්පිල් හා ප්‍රදර්ශන	70,000.00	2,696,480
රැස්වීම් වියදම්	658,057.22	951,519
ලියා පදිංචිකිරීමේ ගාස්තු	36,400.00	58,340
ප්‍රවර්ධන වියදම්	30,891.92	325,000
එකතුව	**795,349.14**	**4,031,339**

8. ශුද්ධ මූල්‍ය ආදායම

8.1 මූල්‍ය ආදායම

වගුව – 38

මාර්තු 31න් අවසන් වසර සඳහා	2025 (රු.)	2024 (රු.)
ස්ථාවර තැන්පතු මත පොලිය	13,771,837.36	21,205,821
භාණ්ඩාගාර බිල්පත් මත පොලිය	20,515.28	28,842
සේවක ණය මත පොලිය	390,075.31	314,194
ඉතුරුම් ගිණුම් පොලිය	11,557,650.96	10,945,256
එකතුව	**25,740,078.91**	**32,494,112**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2025 මාර්තු 31න් අවසන් වසර සඳහා

8.2 මූල්‍ය වියදම්

වගුව – 39

මාර්තු 31න් අවසන් වසර සඳහා	2025 (රු.)	2024 (රු.)
අයිරා පොලිය	-	-
බැංකු ණය පොලිය	-	-
කෙටි කාලීන ණය පොලිය	-	-
එකතුව	**-**	**-**
ශුද්ධ මූල්‍ය ආදායම	**25,740,078.91**	**32,494,112**

9. බදුකරණය

2011 අංක 22 දරන පනතින් සංශෝධනය කළ 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 48(අ) වගන්තිය ප්‍රකාරව. 16 වන වගන්තියේ සඳහන් යම් කෘෂිකර්ම ව්‍යවසායයකින් ලබූ ලාභ සහ ආදායම, පළමු උපලේඛනය අනුව 14%ක සහ 30% ක් අනුප්‍රමාණයට අනුව ආදායම් බද්දට යටත් කළ යුතුය. අනෙකුත් ලාභ සාමාන්‍ය අනුප්‍රමාණයකට අනුව බද්දට යටත් වේ.

9.1 ජංගම බදු වියදම්

වගුව – 40

මාර්තු 31න් අවසන් වසර සඳහා	2025 (රු.)	2024 (රු.)
ප්‍රවර්තන වසර	-	-
පෙර වසරේ ආදායම් බදු ඌන/(අධි) ප්‍රතිපාදන	-	-
	-	**-**

9.2 ගිණුම්කරණ ලාභය සහ ආදායම් බදු අතර සැසඳුම

වගුව – 41

මාර්තු 31න් අවසන් වසර සඳහා	2025 (රු.)	2024 (රු.)
බදුකරණයට පෙර ගිණුම්කරණ ලාභය/(අලාභය)	(7,170,873.16)	69,391,212
අනෙකුත් මූලාශ්‍රයන්ගෙන් ආදායම සහ මුක්ත ආදායම	(59,633,803.35)	(21,234,662)
ඉඩ නොදුන් අයිතම සමාහාරය	63,037,727.42	31,360,059
ව්‍යාපාරයෙන් ගලපන ලද ලාභය/(අලාභය)	**(3,766,949.09)**	**79,516,609**
තක්සේරු කළ හැකි ආයෝජන ආදායම	36,414,278.99	44,098,561
මුළු ව්‍යවස්ථාපිත ආදායම	**32,647,329.90**	**123,615,170**
යෝග්‍යතා ගෙවීම්		
බදු අයකළ හැකි ආදායම	32,647,329.90	123,615,170
බදු අයකළ හැකි ආදායම මත බදු 30%	9,794,198.97	33,319,157
අනුභයනය කරන ලද ලාභාංශ බද්ද	-	-
විලම්භිත බදු වියදම්		
අයකළ/ (ප්‍රත්‍යාවර්තනය) විලම්භිත බදු	**(8,657,751.65)**	**(19,502,452)**
මුළු බදු වියදම්	**1,136,447.32**	**13,816,705**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2025 මාර්තු 31න් අවසන් වසර සඳහා

10. කොටසක් සඳහා ඉපැයුම්/කොටසක් සඳහා ලාභාංශ

10.1 කොටසක් සඳහා ඉපැයුම්

කොටසක් සඳහා මූලික ඉපැයුම්,පහත සඳහන් පරිදි ගණනය කරනු ලැබ ඇති වසර තුළ නිකුත් කරනු ලබන සාමාන්‍ය කොටස්වල භරිත සාමාන්‍යය සංඛ්‍යාවෙන් බෙදනු ලබන සාමාන්‍ය කොටස්කරුවන්ට ආරෝපණීය ලාභය මත පදනම් වේ:

වගුව – 42

මාර්තු 31න් අවසන් වසර සඳහා	2025 (රු.)	2024 (රු.)
වසර සඳහා ශුද්ධ ලාභය	(8,307,320.48)	55,574,507
භරිත කොටස් සාමාන්‍ය සංඛ්‍යාව	4,637,507.00	4,637,507
කොටසක් සඳහා මූලික ඉපැයුම්	(1.79)	11.98

10.2 කොටසක් සඳහා ලාභාංශ

වගුව – 43

මාර්තු 31න් අවසන් වසර සඳහා	2025 (රු.)	2024 (රු.)
වසර සඳහා ලාභාංශ		30,000,000
කොටස් සංඛ්‍යාව	4,637,507.00	4,637,507
කොටසක් සඳහා ලාභාංශය	-	6

11. දේපළ, පිරියත හා උපකරණ

	සිත්නක්කර ඉඩම (රු.)	ගොඩනැගිලි (රු.)	පිරියත හා යන්ත්‍රෝපකරණ (රු.)	කර්මාන්තශාලා උපකරණ (රු.)	
පිරිවැය					
2024 අප්‍රේල් 01 දිනට පිරිවැය	**58,000,000.00**	**270,423,160.00**	**172,791,749.40**	**8,857,113.89**	
එකතු කිරීම්	-	2,213,489.30	1,683,126.88	-	
ප්‍රත්‍යාගණනය මත අතිරික්තය					
බැහැර කිරීම්	-	-	-	-	
පැවරුම	-	-		-	
2025 මාර්තු 31 දිනට පිරිවැය	**58,000,000.00**	**272,636,649.30**	**174,474,876.28**	**8,857,113.89**	
සමුච්චිත ක්ෂය					
2024 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය	**-**	**35,437,228.83**	**42,557,357.94**	**3,718,797.60**	
වත්මන් වසරේ ක්ෂය		18,023,006.46	22,854,728.21	1,865,876.98	
බැහැර කිරීම්	-	-	-	-	
2025 මාර්තු 31 දිනට සමුච්චිත ක්ෂය	-	53,460,235.29	65,412,086.15	5,584,674.59	
2025 මාර්තු 31 දිනට ශුද්ධ පොත් වටිනාකම	**58,000,000.00**	**219,176,414.01**	**109,062,790.13**	**3,272,439.30**	

දේපළ, පිරියත හා උපකරණවල වාහන පංතිය එහි සාධාරණ වටිනාකමට 2025 මාර්තු 31 දින ප්‍රත්‍යාගණනය කරන ලදී.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2025 මාර්තු 31න් අවසන් වසර සඳහා

වගුව – 44

	පරිගණක උපකරණ (රු.)	කාර්යාල උපකරණ (රු.)	ලිඛිඩු හා සවිකුරු (රු.)	මෙවලම් (රු.)	රථ වාහන (රු.)	වෙනත් (රු.)	එකතුව (රු.)
	9,024,867.81	**984,573.12**	**5,503,313.03**	**321,548.49**	**21,770,000.20**	**17,524,423.99**	**565,200,749.94**
	1,520,210.91	109,500.00	723,170.00	-	-	16,730,185.92	22,979,683.01
					34,977,499.95		34,977,499.95
	-	-	-	-	-	-	-
	-	-	-	-	-	-	-
	10,545,078.72	**1,094,073.12**	**6,226,483.03**	**321,548.49**	**56,747,500.15**	**34,254,609.92**	**623,157,932.90**
	2,556,788.11	**403,921.62**	**2,015,166.58**	**154,586.75**	**10,885,000.10**	**4,323,049.86**	**102,051,897.38**
	1,624,831.28	249,598.70	1,158,853.99	78,324.62	5,442,500.05	4,160,853.97	55,458,574.27
	-	-	-		-	-	-
	4,181,619.39	653,520.32	3,174,020.57	232,911.37	16,327,500.15	8,483,903.83	157,510,471.65
	6,363,459.34	**440,552.80**	**3,052,462.46**	**88,637.12**	**40,420,000.00**	**25,770,706.09**	**465,647,461.25**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2025 මාර්තු 31න් අවසන් වසර සඳහා

12. ජීවවිද්‍යාත්මක වත්කම්

වගුව – 45

මාර්තු 31 දිනට	2025 (රු.)	2024 (රු.)
වර්ෂය ආරම්භයේදී (සටහන 12.1)	11,898,705.50	9,496,407
වර්ෂය තුළ එකතු කිරීම්	3,196,614.59	2,615,536
ප්‍රවර්තන වසරේ ක්ෂය	(468,063.24)	(213,238)
වර්ෂය අවසානයේදී	**14,680,173.1**	**11,898,706**

12.1 ජීවවිද්‍යාත්මක වත්කම්

වගුව – 46

	නොමේරූ ඇවිලි	මේරූ ඇවිලි	එකතුව
පිරිවැය			
2024 අප්‍රේල් 01 දිනට පිරිවැය	**6,331,576.69**	**6,397,126.79**	**12,728,703.48**
එකතු කිරීම්	1,265,224.39	7,644,770.29	8,909,994.68
බැහැර කිරීම්	(5,395,882.65)	(317,497.44)	(5,713,380.09)
පැවරුම		-	-
2025 මාර්තු 31 දිනට පිරිවැය	**2,200,918.43**	**13,724,399.64**	**15,925,318.07**
සමුච්චිත ක්ෂය			
2024 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය		**829,997.98**	**829,997.98**
ප්‍රවර්තන වසරේ ක්ෂය		468,063.24	468,063.24
බැහැර කිරීම්	-	-52,916.23	-52,916.23
2025 මාර්තු 31 දිනට සමුච්චිත ක්ෂය	**-**	**1,245,144.98**	**1,245,144.98**
2025 මාර්තු 31 දිනට ශුද්ධ පොත් වටිනාකම	**2,200,918.43**	**12,479,254.66**	**14,680,173.09**

13. තොග භාණ්ඩ

වගුව – 47

මාර්තු 31 දිනට	2025 (රු.)	2024 (රු.)
ආහාර පාන	10,687,095.96	12,031,372
නිමි භාණ්ඩ	224,223,191.85	199,425,360
පාරිභෝජ්‍ය තොග	3,108,334.47	673,532
සාමාන්‍ය සහ වෙනත්	38,674,796.53	40,164,877
එකතුව	**276,693,418.81**	**252,295,140**

14. වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ

වගුව – 48

මාර්තු 31 දිනට	2025 (රු.)	2024 (රු.)
වෙළඳ ණයගැතියෝ	51,766,129.49	44,584,438
කාර්ය මණ්ඩල ණයගැතියෝ	8,885,470.59	10,832,429
තැන්පතු	2,776,500.00	2,726,500
පූර්ව ගෙවීම් හා අනෙකුත් ලැබිය යුතු දෑ	29,200,326.50	46,611,085
චල නොවන ශේෂ	27,258.70	1,474,109
අනෙකුත් හර ශේෂ	3,361,861.04	-
	96,017,546.32	**106,228,562**
අඩුකළා; බොල් ණය සඳහා ප්‍රතිපාදන	-	(1,846,032)
එකතුව	**96,017,546.32**	**104,382,530**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2025 මාර්තු 31න් අවසන් වසර සඳහා

15. කෙටි කාලීන ආයෝජන

වගුව – 49

මාර්තු 31 දිනට	2025 (රු.)	2024 (රු.)
භාණ්ඩාගාර බිල්පත්	269,187.00	269,187
ස්ථාවර තැන්පතු – මහජන බැංකුව	124,360,820.60	124,360,821
ස්ථාවර තැන්පතු (පාරිතෝෂික ආයෝජනය) – මහජන බැංකුව	7,364,122.91	7,364,123
තේ ශක්ති අරමුදල	213,336,812.05	189,664,757
කෙටිකාලීන ආයෝජන –කේවළ ඉතුරුම් ගිණුම	1,545,682.86	1,125,000
එකතුව	**346,876,625.42**	**322,783,887**

16. මුදල් හා මුදල් සමාන දෑ

වගුව – 50

මාර්තු 31 දිනට		2025 (රු.)	2024 (රු.)
මහජන බැංකුව	ගිණුම් අංකය 204100140084911 – මූලස්ථාන	3,431,086.50	32,475
මහජන බැංකුව	ගිණුම් අංකය 060100110000681 – මොරවක	70,000.00	2,200
මහජන බැංකුව	ගිණුම් අංකය 060100100000592 – මොරවක	15,230.00	15,000
ලංකා බැංකුව	ගිණුම් අංකය 0006065711 – නෙළුව	15,591.55	15,592
ලංකා බැංකුව	ගිණුම් අංකය 75958665 – පැලවත්ත	26,000.00	24,000
ලංකා බැංකුව	ගිණුම් අංකය 205604 – තවලම	14,050.00	15,000
මහජන බැංකුව	ගිණුම් අංකය 256100110021039 – පිළිමතලාව	-	-
මහජන බැංකුව	ගිණුම් අංකය 208100100084885 – බත්තරමුල්ල	(3,546,350.51)	(6,900,432)
මාර්ගස්ථ මුදල්		241,197.88	1,256,889
එකතුව		**266,805.42**	**(5,539,276)**

17. ප්‍රකාශිත ප්‍රාග්ධනය

වගුව – 51

මාර්තු 31 දිනට	2025 (රු.)	2024 (රු.)
නිකුත් කරන ලද සහ සම්පූර්ණයෙන් ගෙවන ලද		
සාමාන්‍ය කොටස් 4,637,507	46,375,070.00	46,375,070
එකතුව	**46,375,070.00**	**46,375,070**

18. සංචිත

වගුව – 52

මාර්තු 31 දිනට	2025 (රු.)	2024 (රු.)
ප්‍රදාන – භාණ්ඩාගාර	14,235,750.00	-
ප්‍රාග්ධන සංචිත	600,000.00	600,000
ලාභ හා අලාභ ගිණුම	850,004,093.1	838,823,507
එකතුව	**864,839,843.13**	**839,423,507**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2025 මාර්තු 31න් අවසන් වසර සඳහා

19. විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම

වගුව – 53

මාර්තු 31 දිනට	2025 (රු.)	2024 (රු.)
නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල වත්මන් වටිනාකමේ සංචලන		
වර්ෂය ආරම්භයේදී	26,036,956.17	24,165,506
වත්මන් සේවා පිරිවැය	2,864,065.11	2,084,788
පොලී පිරිවැය	2,330,023.77	4,349,791
ආයුගණක ලාභ/අලාභ	1,737,304.26	(1,427,352)
පෙර වසර ගැලපීම්		
වසර තුළ ගෙවීම් – මුදලින්	(5,903,399.04)	(3,135,759)
ගෙවිය යුතු		
වර්ෂය අවසානයේදී	**27,064,950.27**	**26,036,956**

20. ණය හිමියෝ හා උපචිත ගාස්තු

වගුව – 54

මාර්තු 31 දිනට	2025 (රු.)	2024 (රු.)
තේ දළු සැපයුම්කරුවෝ	68,648,609.04	48,738,298
වෙළඳ ණය හිමියෝ	45,399,576.42	15,495,748
සේවා කොන්ත්‍රාත්කරුවෝ	4,062,657.63	2,721,070
කාර්ය මණ්ඩල ණය හිමියෝ	19,803,268.06	3,572,450
උපචිත වියදම්	22,406,667.46	26,133,377
හිමිකම් නොපෑ ශේෂ	187,556.97	184,290
අනෙකුත් ණය ශේෂ	1,176,193.80	3,706,091
එකතුව	**161,684,529.38**	**100,551,323**

21. විලම්බිත බදු වගකීම්/(වත්කම්)

වගුව – 55

මාර්තු 31 දිනට	2025 (රු.)	2024 (රු.)
වර්ෂය ආරම්භයේදී	97,825,882.81	106,580,129
ආදායම් ප්‍රකාශයට/(ප්‍රකාශයෙන්) පවරන ලද	9,972,058.99	-
ලාභ හා අලාභයට/ලාභ හා අලාභයෙන් පවරන ලද	(8,657,751.65)	(8,754,246)
වර්ෂය අවසානයේදී	**99,140,190.14**	**97,825,883**

22. ගෙවිය යුතු/ලැබිය යුතු ආදායම් බද්ද

වගුව – 56

මාර්තු 31 දිනට	2025 (රු.)	2024 (රු.)
වර්ෂය ආරම්භයේදී ශේෂය	28,192,600.36	74,339,010
වර්ෂය සඳහා ප්‍රතිපාදනය	9,794,198.97	33,319,157
	37,986,799.33	**107,658,167**
පෙර වසර සඳහා ගෙවීම්		(74,327,048)
වර්ෂය සඳහා ගෙවීම්	(27,821,504.00)	(3,273,298)
දළ		
	10,165,295.33	**30,057,821**
බදු ණය		
රඳවාගැනීමේ බද්ද	(1,800,184.71)	(1,865,221)
ශුද්ධ ගෙවිය යුතු/(ලැබිය යුතු)	**8,365,110.38**	**28,192,600**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2025 මාර්තු 31න් අවසන් වසර සඳහා

23. ප්‍රාග්ධන බැඳීම්

ශේෂ පත්‍රයේ දිනයට ප්‍රාග්ධන වියදම් බැඳීම් නොමැත.

24. අනිශ්චිත අවස්ථා

විභාගවෙමින් පවතින නඩු

(i) තමන් සේවයෙන් පහ කිරීම අසාධාරණ බව ප්‍රකාශ කරමින් තමන් නැවැත්ත සේවයේ පිහිටුවන ලෙස අධිකරණයෙන් අයදිමින් ජී. හේමචන්ද්‍ර මහතා විසින් සමාගමට එරෙහිව කොටපොළ කම්කරු විනිශ්චය සභාවේ කම්කරු නඩුවක් (නඩු අංක LT/KP/34/18/07) ගොනු කර ඇත.

(ii) කොටපොළ කම්කරු විනිශ්චය සභාව විසින් ලබා දුන් එච්.සී.එල්.පී. හීන්දෙණිය නඩු අංක LT/KP/34/06/2018 තීන්දුවට එරෙහිව සමාගම මාතර මහාධිකරණයේ අභියාචනා නඩුවක් ගොනු කර ඇත.

(iii) මැණික්දිවෙල තේ කර්මාන්ත ශාලාවේ සිදුකළ ඉදිකිරීම් සඳහා ඉතිරි ගෙවීම නොගෙවීම සම්බන්ධයෙන් එච්.පී.එස්. ජීවක පෙරේරා මහතා සමාගමට එරෙහිව කඩුවෙල දිස්ත්‍රික් අධිකරණයේ නඩුවක් ගොනු කොට ඇත. (නඩු අංකය 5187/M)

(iv) මැණික්දිවෙල තේ කර්මාන්ත ශාලාවේ සිදුකළ ඉදිකිරීම් සඳහා ඉතිරි ගෙවීම නොගෙවීම සම්බන්ධයෙන් ටැමරින්ඩ් ට්‍රී පුද්ගලික සමාගම අප සමාගමට එරෙහිව කඩුවෙල දිස්ත්‍රික් අධිකරණයේ නඩුවක් ගොනු කොට ඇත. (නඩු අංකය 5187/M)

(v) තමන් සේවයෙන් පහකිරීම අසාධාරණ බව අධිකරණය හමුවේ ප්‍රකාශ කරමින් ටී.ඩබ්ලියු. එම්.එස්. බණ්ඩාර මහතා සමාගමට එරෙහිව බොරැල්ල කම්කරු විනිශ්චය සභාවේ කම්කරු නඩුවක් (නඩු අංක: 02/1205/2023) ගොනු කර ඇත. මෙහිදී සමාගමට අවාසිදායක තීන්දුවක් ලැබී ඇත. මෙම තීන්දුවට එරෙහිව අභියාචනා කිරීමට සමාගම අදහස් කරයි.

(vi) තමන් සේවයෙන් පහකිරීම අසාධාරණ බව අධිකරණය හමුවේ ප්‍රකාශ කරමින් බී.ජී. නිශාන්ත මහතා (හිනිදුම හිල්ස් තේ කර්මාන්ත ශාලාව) සමාගමට එරෙහිව ගාල්ල කම්කරු විනිශ්චය සභාවේ කම්කරු නඩුවක් ගොනු කර ඇත. (නඩු අංකය: LT/01/64/2022).

(vii) තමන් සේවයෙන් පහකිරීම අසාධාරණ බව අධිකරණය හමුවේ ප්‍රකාශ කරමින් ඩබ්ලියු. ගාමිණී මහත්මිය (හිනිදුම හිල්ස් තේ කර්මාන්ත ශාලාව) සමාගමට එරෙහිව ගාල්ල කම්කරු විනිශ්චය සභාවේ කම්කරු නඩුවක් ගොනු කර ඇත. (නඩු අංකය: LT/06/03/2023) ගොනු කර ඇත.

(viii) තමන් සේවයෙන් පහකිරීම අසාධාරණ බව අධිකරණය හමුවේ ප්‍රකාශ කරමින් කරවිටගේ විශාද් කුමාර මහත්මිය (දෑරංගල තේ කර්මාන්ත ශාලා සමාගම) සමාගමට එරෙහිව කොටපොළ කම්කරු විනිශ්චය සභාවේ කම්කරු නඩුවක් ගොනු කර ඇත. (නඩු අංකය: LT/KP/34/05/2022).

25. වාර්තාකරණ දිනයෙන් පසු සිදුවීම්

රු. මිලියන 12.2 ක ගෙවීමක් කිරීමට නියම කරමින් 2025 අප්‍රේල් 3 වැනි දින කම්කරු විනිශ්චය සභාවෙන් අවාසිදායක තීන්දුවක් ලැබුණි.

ප්‍රවර්තන ව්‍යාපාරය

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති/ලංකා ගිණුම්කරණ ප්‍රමිති වෙත මාරුවීම පැහැදිළි කිරීම

26. සම්බන්ධිත පාර්ශව අනාවරණ

සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී ආශ්‍රිත සමාගම් සමග ගනුදෙනු සිදුකරනු ලැබුයේ 'අතේ දුරින්' පදනමිනි.

26.1 ප්‍රධාන කළමනාකරණ පිරිස් (KMP) සමග ගනුදෙනු

ප්‍රධාන කළමනාකරණ පිරිස් යනු සමාගමේ ක්‍රියාකාරකම් ඍජුව හෝ වක්‍රාකාරයෙන් සැලසුම් කිරීම, මඟ පෙන්වීම සහ පාලනය සඳහා බලතල සහ වගකීම් සහිත පුද්ගලයන් වේ.

ප්‍රධාන කළමනාකරණ පිරිස් වාර්තාකරණ අස්තිත්වයේ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් සමන්විත වේ.

26.1.1. ප්‍රධාන කළමනාකරණ පිරිස් වල වන්දි ගෙවීම් ගිණුම් සටහන් 6 එහි අනාවරණය කර ඇත.

26.1.2. වර්ෂය තුළදී ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා ණය දී නොමැත.

26.1.3. සමීප පවුල් සාමාජිකයන් ඇතුළු ප්‍රධාන කළමනාකරණ කොටස්වල කොටස් දැරීම

කිසිවක් නොමැත

26.1.4. අනෙකුත් සමාගම්වල අධ්‍යක්ෂවරුන් වන සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ නම්:

කිසිවෙකු නොමැත

26.2 සමීප පවුල් සාමාජිකයන් සමග ගනුදෙනු

සමීප පවුල් සාමාජිකයන් යනු සමාගම සමග සිදු කරන සිය ගනුදෙනුවලදී බලපෑම් කරනු ඇතැයි අපේක්ෂා කරන හෝ ලක්විය හැකි අයවළුන් වේ.

වර්ෂය තුළදී සමීප පවුල් සාමාජිකයන් සමග කිසිදු ගනුදෙනුවක් සිදු කර නොමැත.

26.3 පරිපාලිත සමාගම්, ආශ්‍රිත සමාගම් සහ හවුල් ව්‍යාපාර සමග ගනුදෙනු

කිසිවක් නොමැත

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2025 මාර්තු 31න් අවසන් වසර සඳහා

27. කර්මාන්ත ශාලා ඛණ්ඩ

27.1 විකුණුම්

වගුව – 57

මාර්තු 31 දිනට	කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව (රු.)	දැරංගල තේ කර්මාන්තශාලාව (රු.)	හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාව (රු.)	මැණික්දිවෙල තේ කර්මාන්තශාලාව (රු.)	අලෙවි මධ්‍යස්ථානය (රු.)	එකතුව (රු.)
දළ විකුණුම්	1,212,061,970.00	232,593,636.40	124,233,100.00	81,781,930.00		1,650,670,636.40
අඩුකළා: තැරැව්කාර ගාස්තු සහ විකුණුම් වියදම්	(12,745,517.34)	(5,114,073.15)	(1,761,473.58)	(1,417,407.42)	-	(21,038,471.49)
	1,199,316,452.66	**227,479,563.25**	**122,471,626.42**	**80,364,522.58**	**-**	**1,629,632,164.91**
එකතු කළා/අඩුකළා – අන්තර් කර්මාන්තශාලා ගනුදෙනු						-
එකතු කළා - දේශීය විකුණුම්	22,990,365.00	6,378,670.88	126,323.00	1,176,114.74	17,898,219.86	48,569,693.48
එකතුව	**1,222,306,817.66**	**233,858,234.13**	**122,597,949.42**	**81,540,637.32**	**17,898,219.86**	**1,678,201,858.39**

27.2 විකුණුම් පිරිවැය

වගුව – 58

මාර්තු 31 දිනට	කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව (රු.)	දැරංගල තේ කර්මාන්තශාලාව (රු.)	හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාව (රු.)	මැණික්දිවෙල තේ කර්මාන්තශාලාව (රු.)	අලෙවි මධ්‍යස්ථානය (රු.)	එකතුව (රු.)
මිලදීගත් දළු	928,127,253.34	177,310,443.28	127,700,859.62	80,373,366.89		1,313,511,923.13
නිෂ්පාදනය කිරීමේ පිරිවැය						
නිෂ්පාදන පිරිවැය	137,891,988.68	42,800,919.06	39,589,910.58	25,955,419.51	11,457,190.35	257,695,428.18
පොදු ගාස්තු	53,906,060.59	29,491,195.33	20,346,147.55	14,437,563.36	3,406,060.75	121,587,027.58
	1,119,925,302.61	**249,602,557.67**	**187,636,917.75**	**120,766,349.76**	**14,863,251.10**	**1,692,794,378.89**
එකතු කළා: ආරම්භක තොග	81,191,587.95	70,408,656.36	23,086,556.02	21,794,359.51	1,563,488.18	198,044,648.02
අඩු කළා: අවසන් තොග	(134,424,750.32)	(1,300,753.69)	(60,565,851.56)	(26,418,408.28)	(1,513,428.02)	(224,223,191.87)
එකතුව	**1,066,692,140.24**	**318,710,460.34**	**150,157,622.21**	**116,142,300.99**	**14,913,311.26**	**1,666,615,835.04**
ලාභය/(අලාභය	155,614,677.42	(84,852,226.21)	(27,559,672.79)	(34,601,663.67)	2,984,908.60	11,586,023.35

මූල්‍ය ප්‍රකාශන සඳහා විස්තරාත්මක උපලේඛන

2025 මාර්තු 31 දිනට

1. වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ

1.1 වෙළඳ ණයගැතියෝ

වගුව – 59

මාර්තු 31 දිනට	2025 (රු.)	2024 (රු.)
මිලදී ගත් දළු සැපයුම්කරුවන්ගේ ණය	584,486.98	1,158,856
මිලදී ගත් දළු ප්‍රවාහන ණය	151,424.25	456,539
පොහොර ණයගැතියෝ	6,847,478.06	50,875
වෙළඳ ණයගැතියෝ	44,182,740.20	42,918,168
උප එකතුව	**51,766,129.49**	**44,584,438**

1.2 කාර්යමණ්ඩල ණයගැතියෝ

වගුව – 60

මාර්තු 31 දිනට	2025 (රු.)	2024 (රු.)
චෙක්රෝල් ණය	21,435.22	3,189
ආපදා ණය	8,460,814.67	10,568,071
උත්සව අත්තිකාරම්	153,000.00	7,000
කාර්යමණ්ඩල ණයගැතියෝ	250,220.70	251,769
ලැබිය යුතු උපයනවිට ගෙවීම් බදු	-	2,400
උප එකතුව	**8,885,470.59**	**10,832,429**

1.3 තැන්පතු

වගුව – 61

මාර්තු 31 දිනට	2025 (රු.)	2024 (රු.)
ලැබිය යුතු තැන්පතු	2,776,500.00	2,726,500
උප එකතුව	**2,776,500.00**	**2,726,500**

1.4 පූර්ව ගෙවීම් හා අනෙකුත් ලැබිය යුතු දෑ

වගුව – 62

මාර්තු 31 දිනට	2025 (රු.)	2024 (රු.)
ලැබිය යුතු ගිණුම්	-	22,488,718
ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළිය	2,701,001.20	13,375,203
ලැබිය යුතු දේශීය විකුණුම්	2,348.00	45,561
තේ පැකට් නිෂ්පාදනය	94,823.85	-
තේ අලෙවි මධ්‍යස්ථානය	4,645.00	208,073
අනෙකුත් අත්තිකාරම්	338,600.00	-
පූර්ව ගෙවීම්	1,751,460.71	5,938,490
මුද්දර	3,860.50	4,746
විවිධ ණයගැතියෝ	22,541,195.64	3,889,961
ඉඩම් ප්‍රතිසංස්කරන කොමිෂන් සභාව	-	3,659,250
කසළ තේ සැපයුම්කරුවෝ	1,762,391.60	660,334
උප එකතුව	**29,200,326.50**	**46,611,085**

1.5 චල නොවන ශේෂ

වගුව – 63

මාර්තු 31 දිනට	2025 (රු.)	2024 (රු.)
ටී. ජී. හේමචන්ද්‍ර	27,258.70	27,259
සීඅයිසී පොහොර	-	1,446,850
උප එකතුව	**27,258.70**	**1,474,109**

මූල්‍ය ප්‍රකාශන සඳහා විස්තරාත්මක උපලේඛන

2025 මාර්තු 31 දිනට

1.6 අනෙකුත් හර ශේෂ

වගුව – 64

මාර්තු 31 දිනට	2025 (රු.)	2024 (රු.)
වැට් පාලනය	3,229,572.39	-
ඉඩම් ප්‍රතිසංස්කරන කොමිෂන් සභාව	131,157.30	
ඉදිරියට ගෙනා කාසි	1,131.35	
උප එකතුව	**3,361,861.04**	**-**
මුළු එකතුව	**96,017,546.32**	**106,228,562**
බොල් හා අඩමාන ණය සඳහා ප්‍රතිපාදනය	-	(1,846,032)
ශුද්ධ එකතුව	**96,017,546.32**	**104,382,530**

2. ණය හිමියෝ සහ උපචිත ගාස්තු

2.1 මිලදී ගත් දළු ණය හිමියෝ

වගුව – 65

මාර්තු 31 දිනට	2025 (රු.)	2024 (රු.)
මිලදී ගත් දළු සැපයුම්කරුවෝ	68,648,609.04	48,738,298
උප එකතුව	**68,648,609.04**	**48,738,298**

2.2 වෙළඳ ණය හිමියෝ

වගුව – 66

මාර්තු 31 දිනට	2025 (රු.)	2024 (රු.)
බැංකු ණය	1,401,410.00	1,000
හේලික්ස් ඉංජිනියරින්	40,871.68	40,872
ජයසිංහ සහ සමාගම	125,000.00	(34,000)
දළු මළු ඇතුරුම් කොන්ත්‍රාත්කරුවෝ	-	86,346
බීසීසී ලංකා වෙත ගෙවිය යුතු කුලිය	-	750,000
නොගෙවූ මිලදී ගත් දළු සැපයුම්කරුවෝ	-	56,353
ගෙවිය යුතු රඳවාගැනීම්	70,000.04	70,000
විවිධ ණය හිමියෝ	2,167,304.91	1,540,538
අනෙකුත් සැපයුම්කරුවෝ	40,228,809.69	12,145,864
වෙළඳ ණය හිමියෝ	1,366,180.10	838,776
උප එකතුව	**45,399,576.42**	**15,495,748**

2.3 සේවා කොන්ත්‍රාත්කාර ගෙවීම්

වගුව – 67

මාර්තු 31 දිනට	2025 (රු.)	2024 (රු.)
අමු දළු ප්‍රවාහනය	4,062,657.63	2,721,070
උප එකතුව	**4,062,657.63**	**2,721,070**

2.4 කාර්යමණ්ඩල ණය හිමියෝ

වගුව – 68

මාර්තු 31 දිනට	2025 (රු.)	2024 (රු.)
චෙක් රෝල්/අනියම් වැඩ	4,076,003.94	2,059,180
නිවාඩු දින චේතන	694,900.12	-
ගෙවිය යුතු වැටුප්	1,487,324.16	776,680
කාර්ය මණ්ඩල අනිකාල දීමනා/ගමන් වියදම්	1,154,973.17	736,590
ගෙවිය යුතු වෙනත් කාර්යමණ්ඩල පිරිවැය	12,221,400.00	-
දිරිගැන්වීමේ ප්‍රසාද දීමනා	168,666.67	-
උප එකතුව	**19,803,268.06**	**3,572,450**

මූල්‍ය ප්‍රකාශන සඳහා විස්තරාත්මක උපලේඛන

2025 මාර්තු 31 දිනට

2.5 උපචිත වියදම්

වගුව – 69

මාර්තු 31 දිනට	2025 (රු.)	2024 (රු.)
ගෙවිය යුතු විගණන ගාස්තු	1,854,000.00	1,400,000
මිලදි ගත් දළු සැපයුම්කරුවන්ගේ ගෙවිය යුතු තැන්පතු	3,841,028.52	3,399,136
සමස්ත ලංකා චතු සේවක සංගමය (ACEW)	500.00	600
ලංකා චතු කාර්ය මණ්ඩල සංගමය (CESU)	25,406.00	20,906
සමුපකාර සමිතිය යටිනුවර	84,099.53	84,100
ගෙවිය යුතු තැන්පතු	241,650.00	373,650
සේවක අර්ථසාධක අරමුදල	3,019,741.39	2,664,215
සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල	540,306.43	403,794
ලංකා වැවිලිකරුවන්ගේ අර්ථසාධක සමිතිය	42,207.89	30,072
නිවාඩු දින සඳහා ගෙවීම්	-	583,492
රක්ෂණ ගාස්තු	75,995.66	51,027
ලාෆ් පෙට්රෝලියම්	19,651.46	76,230
අනෙකුත් උපචිත වියදම්	7,629,509.36	8,501,561
උපයනවිට ගෙවීම් බදු අධිභාරය	59,344.00	59,344
ආපසු එවනලද චෙක්පත්	3,396,063.46	3,282,498
ගෙවිය යුතු මුද්දර ගාස්තු	98,177.74	48,383
රන්මීර් හෝල්ඩිං	61,566.39	61,566
තේ ශක්ති අරමුදල	-	2,200
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව	-	3,659,250
යටිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	960,000.00	960,000
ගෙවිය යුතු උපයනවිට ගෙවීම් බද්ද	62,143.63	79,132
ගෙවිය යුතු රඳවාගැනීමේ බදු	30,000.00	35,400
සුභසාධක සංගමය	49,776.00	43,500
රන්දළු සුබසාධක සංගමය	293,900.00	297,920
කර්මාන්ත ශාලා සුබසාධක සංගමය	21,600.00	15,400
උප එකතුව	**22,406,667.46**	**26,133,377**

2.6 අනෙකුත් ණය

වගුව – 70

මාර්තු 31 දිනට	2025 (රු.)	2024 (රු.)
ඉතිරි වූ කාසි	-	(1,179)
දිරි ගැන්වීමේ ප්‍රසාද දීමනා	-	923,000
ගෙවිය යුතු පාරිතෝෂික	1,176,193.80	1,224,903
වැටි පාලනය	-	1,559,367
උප එකතුව	**1,176,193.80**	**3,706,091**

2.7 නිමිකම් නොපැ ගේෂ

වගුව – 71

මාර්තු 31 දිනට	2025 (රු.)	2024 (රු.)
චෙක්රෝල් චේතන	148,555.06	125,557
වැටුප් හා චේතන	12,041.60	19,732
කාර්ය මණ්ඩල වැටුප්	-	12,042
ප්‍රසාද දීමනා	26,960.31	26,960
උප එකතුව	**187,556.97**	**184,290**
මුළු එකතුව	**161,684,529.38**	**100,551,323**

පෙර වසර දහය සඳහා විශේෂ මූල්‍ය සිදුවීම්

	2024-25	2023-24	2022-23	2021-22	
ශුද්ධ විකුණුම්	1,678,201,858.39	1,802,165,017.30	2,635,413,672.26	1,041,133,241.45	
විකුණුම් පිරිවැය	(1,666,615,835.04)	(1,747,661,088.10)	(2,285,165,803.52)	(1,026,129,751.47)	
දළ ලාභය	**11,586,023.35**	**54,503,929.20**	**350,247,868.74**	**15,003,489.98**	
වෙනත් ආදායම්	32,619,154.02	49,849,950.33	60,406,357.00	20,003,552.09	
මෙහෙයුම් වියදම්වලට පෙර ලාභය	**44,205,177.37**	**104,353,879.53**	**410,654,225.74**	**35,007,042.07**	
පරිපාලන වියදම්	(76,320,780.30)				
විකුණුම් හා බෙදාහැරීම් සහ අනෙකුත් වියදම්	(795,349.14)	(67,456,779)	(73,607,143)	(37,159,299)	
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලාභය	**(32,910,952.07)**	**36,897,100**	**337,047,083**	**(2,152,257)**	
ශුද්ධ මූල්‍ය ආදායම	25,740,078.91	32,494,112	9,940,431	(612,515)	
බදුකරණයට පෙර ශුද්ධ ලාභය	**(7,170,873.16)**	**69,391,212**	**346,987,514**	**(2,764,772)**	
ආදායම් බද්ද	(1,136,447.32)	(13,816,705)	(126,186,738)	(4,533,980)	
බදුකරණයෙන් පසු ශුද්ධ ලාභය	**(8,307,320.48)**	**55,574,507**	**220,800,776**	**(7,298,752)**	

වගුව – 72

2020-21	2019-20	2018-19	2017-18	2016-17	2015-16
1,175,716,247.36	937,789,275.06	971,792,179.69	1,004,319,623.10	935,591,884.34	775,730,199.81
(1,158,860,303.57)	(845,680,912.52)	(985,257,848.93)	(983,007,160.69)	(881,617,227.76)	(767,358,579.26)
16,855,943.79	**92,108,362.54**	**(13,465,669.24)**	**21,312,462.41**	**53,974,656.58**	**8,371,620.55**
26,749,129.73	21,925,980.98	24,262,802.24	26,091,300.53	19,676,356.10	43,465,176.11
43,605,073.52	**114,034,343.52**	**10,797,133.00**	**47,403,762.94**	**73,651,012.68**	**51,836,796.66**
(44,560,549)	(51,113,072)	(45,165,514)	(41,116,894)	(33,262,579)	(31,413,580)
(955,476)	**62,921,272**	**(34,368,381)**	**6,286,868**	**40,388,433**	**20,423,217**
(14,189,484)	(19,653,695)	(18,579,650)	(13,219,530)	(9,164,034)	(8,428,981)
(15,144,959)	**43,267,577**	**(52,948,031)**	**(6,932,661)**	**31,224,400**	**11,994,236**
1,001,557	(5,535,371)	4,167,928	(654,698)	(1,723,391)	(2,178,708)
(14,143,403)	**37,732,205**	**(48,780,102)**	**(7,587,359)**	**29,501,009**	**9,815,528**

සටහන්

ආයතනික තොරතුරු

සමාගමේ නම

කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලාව

සමාගමේ ලියාපදිංචි අංකය

PB 1020

කාර්යාලය අළුතින් පිහිටි ස්ථානය

අංක 53, රත්නායක පාර, පැලවත්ත

නීති සමාගම

1992 සැප්තැම්බර් 30 වැනි දින ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරන ලද ඇපයෙන් සීමිත පොදු සමාගමකි.

දුරකථන අංක

0112786734 / 0112786469 / 0112786713

ෆැක්ස් අංකය

0114645279

විද්‍යුත් තැපෑල

Office.gen@kalubowitiyanatea.lk

විගණකවරු

ජාතික විගණන කාර්යාලය
අංක 306/72
පොල්දූව පාර
බත්තරමුල්ල.

ලේකම්වරු

ආර්එන්එච් හෝල්ඩිංග්ස් (පුද්) සමාගම
ආර්එන්එච් හවුස්, අංක 622 B, කෝට්ටේ පාර, කෝට්ටේ

බැංකුකරුවෝ

මහජන බැංකුව

අධ්‍යක්ෂ මණ්ඩලය

ෂමින්ද සමරසිංහ මයා – සභාපති

ආර්. ඒ. එස්. කේ. රණසිංහ මයා

ඩී. එම්. එම්. දිසානායක මිය

ඒ. ඒ. විල්සන් මයා

කේ. කේ. එස්. මල්වත්ත මයා

එල්. එස්. කොඩිප්පිලි මයා

කළමනාකාරිත්වය

ටී. ඒ. ඩී. ජේ. සී. තිලකරත්න මයා – මෙහෙයුම් ප්‍රධානී

කළමනාකරු – කළුබෝවිටියාන සීටීසී තේ කර්මාන්ත ශාලාව

පී. දෙහිවලගේ – මූල්‍ය කළමනාකරු (වැඩ බලන)

ගනිඳු පලිහේන – සහකාර කළමනාකරු, පරිපාලන

සෙව්වන්දි වලාකුළුගේ මිය – සහකාර කළමනාකරු අලෙවි

කර්මාන්ත ශාලා

කළුබෝවිටියාන සීටීසී කර්මාන්ත ශාලාව

අබේවිල, කළුබෝවිටියාන
දුරකථන/ෆැක්ස් : 0913783020/0414935308
විද්‍යුත් තැපෑල : Ktf.gen@kalubowitiyanatea.lk

හිනිදුම හිල්ස් තේ කර්මාන්ත ශාලාව

ජැස්මින් වැලි හංදිය, තවලම
දුරකථන/ෆැක්ස් : 041-7201222
විද්‍යුත් තැපෑල : Htf.gen@kalubowitiyanatea.lk

දෑරංගල තේ කර්මාන්ත ශාලාව

කිරිවැල්කැලේ, පිටබැද්දර
දුරකථන/ෆැක්ස් : 0414935309
විද්‍යුත් තැපෑල : Dtf.gen@kalubowitiyanatea.lk

මැණික්දිවෙල තේ කර්මාන්ත ශාලාව

තිස්මඩ පාර, මැණික්දිවෙල
දුරකථන/ෆැක්ස් : 081-2069620/21
විද්‍යුත් තැපෑල : Mtf.gen@kalubowitiyanatea.lk

කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලාව

අංක 53, රත්නායක පාර, පැලවත්ත, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
දුරකථන අංකය : +94 11 278 6734/6469/6713
විද්‍යුත් තැපෑල: office.gen@kalubowitiyanatea.lk